නමුත් මේ අවස්ථාවේදී මම කියන්නට ඕනෑ, වවුනියාව, ත්‍රිකුණාමලය වැනි ප්‍රදේශවල ඒ අයගේ ජන්ම භූමිය යයි කියන්නට ඒ අයට කිසිම අයිතියක් නැති බව. ඇත්තවශයෙන්ම වවුනියා ප්‍රදේශයත් සිංහල ජනතාව වෙසෙන උප දිසාපති කොට්ඨාශයක් වශයෙන් තිබෙනවා. ත්‍රිකුණාමල ප්‍රදේශය, ගෝමරන්කඩවල ප්‍රදේශය, කින්යා ප්‍රදේශය සිංහල උප දිසාපති කොට්ඨාශ වශයෙන් තිබෙනවා. නමුත් ඒ පළාත්වල සිටින ජනතාව ආරක්ෂා කිරීමට රජයෙන් සාර්ථක වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කෙරුණේ නැහැ, කියන එක අපිට කණගාටුවෙන් මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්නට සිද්ධ වී තිබෙනවා. සිංහලයන් සිය ගණනින් මැරුම් කද්දී තවත් දහස් ගණනින් සිංහලයන්ට තම ගම් බිම් අත්හැර යාමටත් සිද්ධ වී තිබෙනවා. මේ අපරාධය නතර කිරීමට කටයුතු යොදන ලෙස කොයි තරම් කීවත් රජය ඒ සඳහා ගෙන ගිය වැඩ පිළිවෙළේ කිසිම සාර්ථකත්වයක් ඇති වුණේ නැහැ කියන එක මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්නට සිද්ධ වෙනවා.

16 වනදා ගරු ජනාධිපතිතුමා හමුවී එතුමාට මේ තත්ත්වය ගැන — විශේෂයෙන් වවුනියා ප්‍රදේශයේත් ත්‍රිකුණාමල ප්‍රදේශයේත් යම් යම් ගම් ප්‍රදේශ ගැන — විස්තර වශයෙන් කරුණු කියා පෑමට මට අවස්ථාව ලැබුණා. නමුත් ඒ කාලය තුළදී ඒ ප්‍රදේශවල සිටින ජනතාවට කිසිම ආරක්ෂාවක් කිසිම සහනයක් ලැබුණේ නැහැ කියන එක මම කණගාටුවෙන් කියන්නට ඕනෑ. වවුනියා ප්‍රදේශයේ පාවක්කුලම, උලුක්කුලම, මාමඩුව, කච්චකොඩිය ආදී ගම් පළාත්වල සිංහලයන්ට තම ගම් බිම් අත්හැරලා ඒ ප්‍රදේශවලින් පිටමං වෙලා සිටීමට සිද්ධ වී තිබෙනවා. සමහරෙක් අනාථ කඳවුරුවල, සමහරෙක් තම තමන්ගේ නෑදයින් සොයා ගෙන ගොස් ඒ ගම්වල නැවතී සිටිනවා. අනාථ කඳවුරුවල සිටින අයට සහනාධාර දෙන බව ඇමතිතුමා කිව්වා. නමුත් තම තමන්ගේ ඥාතීන් සොයා ගෙන ගොස් පැලපදියම් වී සිටින අයට එවැනි සහනාධාර ලබා නොදෙන්නේ මන්දැයි කියන ප්‍රශ්නය මේ අවස්ථාවේදී මතු කරන්නට සිදු වෙනවා. ඒ වගේම වව්නියාව මායිමේ, මැදවච්චිය කොට්ඨාශයට අයත් තම්මැන්නාඇලවක, තම්මැන්නාකුලම, යකාවැව, පෙරියකුලම, වැලිඔය කියන ගම් ප්‍රදේශවලින් මහජනතාව පන්නා දැමීම නිසා දැන් ඔවුන්ට අනාථ කඳවුරුවලට වී සිටින්නට සිදු වී තිබෙන බව මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්නට සිදු වෙනවා. රජය මේ කාරණා දැනගෙන ඇති. ඇත්තවශයෙන්ම මා දන්නා තරමින් අනුරාධපුර දිස්ත්‍රික්කයෙන්ම පවුල් 547ක් පමණ පුද්ගලයින් 2,555ක් පමණ අද අනාථ කඳවුරුවල සිටිනවා. තිරප්පනේ පවුල් 167යි, පුද්ගලයින් 560යි. කහටගස්දිගිලිය පවුල් 60යි පුද්ගලයන් 310යි. හොරොව්පොතාන පවුල් 64යි, පුද්ගලයන් 275යි. තලාව පවුල් 2යි, පුද්ගලයන් 9 යි. කැකිරාව පවුල් 8යි, පුද්ගලයින් 37යි. නොච්චියාගම පවුල් 15යි, පුද්ගලයන් 59යි. අනුරාධපුර රත්නමාලී අනාථ කඳවුර පුද්ගලයින් 240යි. ඔන්න ඔය ආදී වශයෙන් විශාල පිරිසක් අනාථ කඳවුරුවලට ගොස් තමන්ගේ රටේම අනාථයන් බවට පත්ව සිටින බව මම ප්‍රකාශ කරනවා. ඒ වගේම ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ කඳවුරු 40ක 28,000ක් පමණ පිරිසක් අද අනාථ වී සිටිනවා. මඩකලපුවේ 5,000ක් පමණ පිරිසක් ඉන්නවා. වව්නියාවේ 28,000ක් පමණ පිරිසක් ඉන්නවා. වව්නියාවේ විහාරස්ථානයක පුද්ගලයන් 1,180ක් ඉන්නවා. මන්නාරමේ ඉන්න පිරිස 300යි. යාපනයේ 400යි. ඔය විධියට බලන විට අඩු වශයෙන් ලක්ෂයක් පමණ පිරිසක් අද අනාථ වී සිටිනවා යයි කියන්නට සිදු වී තිබෙනවා. ගරුකථානායකතුමනි, මෙන්න මේ අය ගැන රජය මොන පියවරවල් ගන්නවාද කියා ප්‍රකාශ කරන්නය කියලා අපි ඉල්ලා සිටිනවා.

සාමකාමීව සාකච්ඡා කිරීමට එකඟ වී එක් පක්ෂයක් පමණක්, ඒ කියන්නේ, රජය පමණක් ඒ සාමකාමී කොන්දේසි අනුගමනය කරද්දී අනිත් පක්ෂය ඒ ගැන කිසිම සැලකිල්ලක් නැතිව මේ සා විශාල ජනතාවකට හිරිහැර පමුණුවන්නට ඉදිරිපත් වී තිබෙනවා. එන්න ඒ නිසා මේ අනාථ වී සිටින අය ගැන විශේෂ සැලකිල්ලක් දක්වන්න ඕනෑය කියන කාරණය මා මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා.

මා කණගාටු වෙනවා, මෙය සඳහන් කරන්නට. අපේ ක්‍රීඩා ඇමතිතුමා මේ මාසයේ අන්තිමට අනුරාධපුරයේ ක්‍රීඩා උත්සවයක් පවත්වන්නට බලාපොරොත්තු වෙනවා. ක්‍රීඩා කරනවාට වඩා අද මේ අනාථ වී සිටින ජනතාව ගැන පැහැදිලි පියවරක් ගැනීම ඉතාම අවශ්‍ය බව මේ අවස්ථාවේදී රජයට මතක් කරන්න කැමතියි. ක්‍රීඩා ගැන සිත් යොමු කළ යුතු කාලයක් නොවෙයි, මේ. ඇත්තවශයෙන්ම කියනවා නම් අද අනාථ වී සිටින විශාල පිරිස අනාථ කඳවුරුවලටත් තම තමන්ගේ ඥාතීන් ළඟටත් එකතු වී සිටිනවා. විශේෂයෙන්ම වව්නියාව දිස්ත්‍රික්කයටත් මැදවච්චිය දිස්ත්‍රික්කයටත් යාබදව තිබෙන ගම්වල අය තම තමන්ගේ ඥාතීන් ළඟට එකතු වෙලයි, අද සිටින්නෙ. ඒ නිසා ක්‍රීඩා උත්සව වගේ දේවල් අත්හැර දමා මේ පිරිස් ගැන කල්පනා කළ යුතුයි. "රෝමය ගිනි ගනිද්දී නීරෝ වීණා වාදනය කළා" වගේ වැඩ කරන්නේ නැතිව මේ ප්‍රශ්නය ගැන ඉතාමත් ඕනෑකමින් සලකා බලා කටයුතු කරන හැටියට මා ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වව්නියා හා අනුරාධපුර දිස්ත්‍රික්ක අතර මුරපොළවල් කීපයක් දමා තිබෙනවා. මම මේ ගැන ගරු ජනාධිපතිතුමාටත් කියා සිටියා. අපට සෑහීමට පත්විය හැකි ස්ථානවල නොවෙයි ඒ මුරපොළවල් පිහිටුවා තිබෙන්නෙ. ඇත්තවශයෙන්ම කියනවා නම් මා යෝජනා කළ අන්දමට පාවක්කුලම, මාන්කුලම් හන්දිය, ඒ කියන්නෙ වව්නියාවෙන් එහා යාපනය පාරේ තිබෙන මාන්කුලම නොවෙයි, මන්නාරම පැත්තට තිබෙන මාන්කුලම හන්දිය, උලුක්කුලම ඇල්. බී. කොලනිය, මාමඩුව-කච්චිකොඩිය යන හතර පොලටවත් හොඳ හමුදා බල ඇණියක් දැමීමට හැකියාවක් තිබුණා නම් ඒ ප්‍රදේශවලින් උතුරු මධ්‍යම පළාතට ඇති වන ත්‍රස්තවාදි හිරිහැරවලින් ඒ ජනතාවට ආරක්ෂාවක් සපයා ගන්නට හැකියාවක් තිබුණා. ඇත්ත වශයෙන්ම කියනොත් එද මා මතක් කළා වාගේ ඒ ආරක්ෂාව එකී ස්ථානවල සපයා තිබුණා නම් මැදවච්චියට පමණක් නොව අනුරාධපුරයට එල්ල වුණු ප්‍රහාරයත් වළක්වා ගන්නට හැකියාවක් තිබුණු බව මට නිර්භයව කියන්නට පුළුවනි.

රජය අද ත්‍රස්තවාදය නිසා විශාල මුදලක් වැය කරන බව කියනවා. අයවැයෙන් සියයට 15 ක් මුදල් වශයෙන් මේ ත්‍රස්තවාදී කටයුතු මර්දනය කිරීම සඳහා වැය කිරීමට සිදු වී තිබෙනවා යයි මුදල් ඇමතිතුමා කියා තිබෙනවා. ඇත්ත වශයෙන් ම දිනකට එක් කෝටි හැට ලක්ෂයක් පමණ වැය වන බව රජය කියනවා. මෙසා විශාල මුදලක් වැය කරද්දී හදිසි නීතිය හා වෙනත් නීතිත් තිබුණත් තවමත් මේ තත්ත්වය මර්දනය කරගන්නට රජය අපොහොසත් වී තිබෙන බව අද අපට කියන්නට සිදු වී තිබෙනවා.

ඒවාගේම අද මේ සම්බන්ධයෙන් ගෙන යන වැඩ පිළිවෙළ ගැන රජය නොයෙක් දේ කියනවා. ජාතික ආරක්ෂක ඇමතිතුමා එංගලන්තයේදී කියා තිබෙනවා, රජයට විරුද්ධ පක්ෂයේ සහාය ඕනෑ ය කියා. ඒ එක්කම අගමැතිතුමා කියනවා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අය ද්‍රෝහියෝය කියා. ඔන්න ඔය විධියේ කතා දෙකක් අතරෙයි ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් සහාය ලබා ගන්නට බලාපොරොත්තු වන්නේ. අපේ කොට්ඨාශවල සිටින තරුණයින් රැකියාවල් ඉල්ලුවාම ඒ අයගේ නම් කපා දමනවා. රජය ඔය විධියේ අසාධාරණ වැඩ පිළිවෙළවල් ගෙන යන අතර " අපට සහයෝගය දෙන්න " යයි ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් ඉල්ලා සිටිනවා. ඔන්න ඔය විධියේ කරුණු ගැන කල්පනා කර බලන්න.

අපි කවුරුත් එකතු වී මේ ජාතික ප්‍රශ්නය විසඳීම ඉතාම අවශ්‍යයි. අපි නැහැයි කියන්නේ නැහැ. අපි ඒකට විරුද්ධ නැහැ. තිම්පු කතාවලට විරුද්ධ වුණේ නැහැ. ඇත්ත වශයෙන් ම අපි කියා පෑවේ ඒවා එහේ කරගෙන යද්දීම මෙහේ කෙරීගෙන යන බලපෑම් නතර කිරීමට කටයුතු කිරීම ඉතාම අවශ්‍යයි කියායි. ඔන්න ඔය විධියට බැලුවාම මේ කරුණු ගැන රජය ඉතාම ඕනෑකමින් කතා කිරීම ඉතාම අවශ්‍ය බව අපි කියනවා.

පසුගිය දිනක පක්ෂ භේදයෙන් තොරව " ජාතික පෙරමුණක් " කියා එකක් හැදුවාම රජය කලබල වී එද තුන්මුල්ලේ පැවැත්වූ සත්‍යග්‍රහ කටයුත්තට බාධා කිරීමට ගෙනා පොලිස් හමුදාව දෙස බලන විට ඇත්ත වශයෙන් ම එයින් අඩක් අනුරාධපුරයට පාවිච්චි කළා නම් අනුරාධපුරයේ ඇති වුණු බෙදවාචකය කවරදාකවත් ඇති නොවන බව අපට පැහැදිලිව කියන්න පුළුවනි.

ඔන්න ඔය විධියේ තත්ත්වයක් යටතේයි අද රජය මේ රටේ හදිසි නීතිය දීර්ඝ කිරීමට බලාපොරොත්තු වන්නේ. ඒ නිසා මේ සම්බන්ධයෙන් පැහැදිලි ප්‍රකාශනයක් අපට අවශ්‍යයි. තමුන්නාන්සේලා මේ රට බේරා ගන්න මොන විධියේ තත්ත්වයකින් ක්‍රියා කරනවාද ? ත්‍රස්තවාදී ක්‍රියා මැඩ පැවැත්වීමට මොන විධියේ වැඩ පිළිවෙළක් තමුන්නාන්සේලා යොදාගෙන යනවාද ? දැන් තිම්පු සාකච්ඡා බිඳ වැටී තිබෙන නිසා ඒ සාකච්ඡාවෙන් පසු මොන විධියේ තත්ත්වයක් තමුන්නාන්සේලා ගෙන යෑමට කටයුතු කරනවාද කියන එකයි අපට අද අහන්න සිදු වී තිබෙන ප්‍රශ්නය.

ඒ සමගම, අද හදිසි නීතිය පාවිච්චි කර බැංකු සේවක පිරිසගෙන් කීප දෙනකුගේ වැඩ තහනම් කර, දෙන්නෙක් හිරභාරයටත් ගෙන තැවන වරක් ඒ අය නිදහස් කළාය කියා අපට දැනගන්නට ලැබී තිබෙනවා. මිනීමරන ත්‍රස්තවාදීන් සමග තිම්පුවේදී එක මේසයකට වාඩි වී සාකච්ඡා කරන්න රජයට හැකියාවක් තිබෙනවා නම් බැංකු සේවකයන්ගේ සාධාරණ ප්‍රශ්න ගැන සාකච්ඡා කරන්න රජය මැලි වන්නේ ඇයි කියන එකයි අද අපට අහන්න සිදු වී තිබෙන්නේ.

**එන්. ඩෙන්සිල් ප්‍රනාන්දු මහතා ( කර්මාන්ත හා විද්‍යා කටයුතු ඇමතිතුමා)**
**(திரு. என். டென்சில் பெர்ணண்டோ — கைத்தொழில், விஞ்ஞான அலுவல்கள் அமைச்சர்)**
(Mr. N. Denzil Fernando – Minister of Industries & Scientific Affairs)

තමුන්නාන්සේලා මොනවාද, කළේ ?

**මෛත්‍රීපාල සේනානායක මහතා**
**(திரு. மைத்திரிபால சேனநாயக்க)**
(Mr. Maithripala Senanayeke)

අපේ කාලයේ තිබුණු තත්ත්වයේ හැටියටු අපි කටයුතු කළා.

**එන්. ඩෙන්සිල් ප්‍රනාන්දු මහතා**
**(திரு. என். டென்சில் பெர்ணண்டோ)**
(Mr. N. Denzil Fernando)

ඒක තමයි කියන්නේ, තමුන්නාන්සේලා බඩේ බිජු තියාගෙන කථා කරනවා කියා. ඒකයි, වැරැද්ද.

**මෛත්‍රීපාල සේනානායක මහතා**
**(திரு. மைத்திரிபால சேனநாயக்க)**
(Mr. Maithripala Senanayeke)

තමුන්නාන්සේලාට සම්පූර්ණ බලතල තිබෙනවා. අපි දැන් ආර්ථික වශයෙන් දියුණු වෙලා, දේශපාලන වශයෙන් දියුණු වෙලා කියා තමුන්නාන්සේලා කොයි තරම් පුරසාරම් දෙඩුවත් සුළු ප්‍රශ්නයක්වත් විසඳා ගන්න තමුන්නාන්සේලාට ශක්තියක් නැහැ.

**එන්. ඩෙන්සිල් ප්‍රනාන්දු මහතා**
**(திரு. என். டென்சில் பெர்ணண்டோ)**
(Mr. N. Denzil Fernando)

කිසි දේකට භය වෙන්න එපා. සෑම ප්‍රශ්නයක්ම විසඳනවා. අපි ඉන්නේ ඒකටයි.

**මෛත්‍රීපාල සේනානායක මහතා**
**(திரு. மைத்திரிபால சேனநாயக்க)**
(Mr. Maithripala Senanayeke)

නිය පොත්තෙන් කඩන්න පුළුවන් තත්ත්වයක් තිබුණේ. නමුත් මේ රජය නියම විධියට කටයුතු නොකිරීම තුළින්, තිබුණු ඒ ප්‍රශ්නය දැන් පොරොවෙන් කපන්නවත් බැරි තත්ත්වයට පත් කර තිබෙනවා. මේ රටේ සෑම ප්‍රශ්නයක් ගැනම මේ රජය කටයුතු කර තිබෙන්නේ ඒ විධියටයි.

ඒ නිසා අර බැංකු සේවකයන් සාකච්ඡාවකට කැඳවා ඔවුන්ගේ සාධාරණ ඉල්ලීම් තිබෙනවා නම් ඒවා ඉෂ්ට කිරීම සඳහා කටයුතු කරන හැටියට මම ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්න ඒ විධියට උග්‍ර වන්න ඉඩ හැර තිබෙද්දී තමයි, හදිසි නීතිය තවත් මසකින් දීර්ඝ කිරීම සඳහා මේ පාර්ලිමේන්තුවට ඇවිත් අපෙන් අවසර ඉල්ලන්නේ. අද ප්‍රවෘත්ති පත්‍රවල පළ වන දේවල් මොනවාද කියා කරුණාකර බලන්න. " ත්‍රස්තවාදීන් බෝම්බ පුපුරුවා තම්මැන්නාකුලමේ සිංහල පවුල් පලවා හරී. " ඔන්න, මගේ කොට්ඨාශයේ අයට වන දේවල්. තමුන්නාන්සේලාට මේ රටේ පාලනය ගෙන යන්න බැරි තත්ත්වයක් නේද, අද තිබෙන්නේ. මෙන්න " දවස" පත්‍රයේ තිබෙන දෙයක්. " බෝම්බ පුපුරුවා සිංහලයන් එළවති. " මොකක්ද, ඒ ගැන තමුන්නාන්සේලාට කියන්න තිබෙන්නේ ? තිකම් කෑ ගහන්න නම් අලුත් කර්මාන්ත ඇමතිතුමා බොහොම දක්ෂයි. නමුත් කෑ ගැහුවාට වැඩක් වෙලා තිබෙනවාද ? මෙන්න බලන්න, " දිවයින " පත්‍රයේ තිබෙන ප්‍රවෘත්තියක්. " අනාථ පවුල් සිය ගණනක් කෑම නැතිව අසරණ වෙලා. " ඔන්න ඕවායි, තමුන්නාන්සේලාගේ දස්කම්. තව තැනක මෙහෙම සඳහන් වී තිබෙනවා. " ත්‍රස්තවාදීන්ට බියේ ලොරියකින් පලා යමින් සිටි ධීවරයන් 40ක් පැහැරගෙන යති. " ඒ අය කොහේද කියාවත් තවම හොයා ගන්න බැහැ. ඒ අයව බේරා ගැනීම සඳහා කර්මාන්ත හා විද්‍යා කටයුතු ඇමතිතුමාට බැරිද, තමන්ගේ සහෝදර ඇමතිතුමාට උදවු කරන්න ?

**එන්. ඩෙන්සිල් ප්‍රනාන්දු මහතා**
**(திரு. என். டென்சில் பெர்ணண்டோ)**
(Mr. N. Denzil Fernando)

ඒ පැහැර ගනු ලැබූ හුඟ දෙනෙක් මගේ කොට්ඨාශයේ අය තමයි. ඒක මම දන්නවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**මෛත්‍රීපාල සේනානායක මහතා**
**(திரு. மைத்திரிபால சேனநாயக்க)**
(Mr. Maithripala Senanayeke)

අද මේ රටේ තිබෙන්නේ ඒ විධියේ තත්ත්වයක් නම් ඒ සම්බන්ධයෙන් රජය ගෙන තිබෙන්නේ මොන විධියේ ක්‍රියා මාර්ගයක්දැයි අහන්න අපට සිද්ධ වෙනවා. හදිසි නීතිය ක්‍රියාත්මකව තිබෙද්දීත් අද රටේ තිබෙන්නේ ඒ විධියේ තත්ත්වයක් නම් ඒ තත්ත්වය, ඒ වැඩ පිළිවෙළවල් තව දුරටත් කරගෙන යෑමට ඉඩ ප්‍රස්තාව සලසා දීමට නොවෙයිද, හදිසි නීතිය තවත් මසකින් දීර්ඝ කිරීම සඳහා අවසර ඉල්ලන්නේ කියා අහන්න අපට සිද්ධ වෙනවා. ඒ නිසා මේ වැඩ පිළිවෙළට අපේ විරුද්ධත්වය ප්‍රකාශ කරන අතර, මේ යෝජනාවට සහාය දෙන්න බැරි බව ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා.

පූ. භා. 10.14

**පර්සි සමරවීර මහතා (නියෝජ්‍ය ස්වදේශ කටයුතු ඇමතිතුමා)**
**(திரு. பேர்சி சமரவீர — உள்நாட்டலுவல்கள் பிரதி அமைச்சர்)**
**(Mr. Percy Samaraweera–Deputy Minister of Home Affairs)**

ගරු කථානායකතුමනි, අද 27 වැනි වතාවට හදිසි නීතිය දීර්ඝ කිරීමේ විවාදයේදී මැදවච්චියේ ගරු මන්ත්‍රීතුමා (මෛත්‍රීපාල සේනානායක මහතා) කථා කළාට පස්සේ කථා කරන්න මට අවකාශය ලැබීම ගැන මම සන්තෝෂ වෙනවා. මම කලින් කථා කරන්න සිටි දේ පොඩ්ඩකට පසෙකට තබා, මැදවච්චියේ ගරු මන්ත්‍රීතුමා කළ යම් - යම් ප්‍රකාශයන් සම්බන්ධයෙන් වචන ස්වල්පයක් කථා කිරීමට බලාපොරොත්තු වෙනවා.

මැදවච්චියේ ගරු මන්ත්‍රීතුමාය කියන්නේ කාලයක් උතුරු මැද පළාතේ හුඟ දෙනෙක් වීරයෙක් හැටියට සැලකූ කෙනකුටයි. එතුමා අදත් මැදවච්චියේ ගරු මන්ත්‍රීතුමා වශයෙනුයි, මේ ගරු සභාවේ ඉන්නේ. නමුත් දැන් පොඩ්ඩකට කලින් එතුමා පිටු පෙරළ - පෙරළා බොහොම මිලේච්ඡ විධියට කීවා, "ත්‍රස්තවාදීන් මගේ ආසනයේ සිංහලයන් එළවා දමනවා" කියා. වවුනියා දිස්ත්‍රික්කයට ආසන්නවම තිබෙන එතුමාගේ ආසනයේ ත්‍රස්තවාදීන් මෙතෙක් ඒ තරම් දේවල් කර තිබෙද්දීත් වගකිව යුතු මන්ත්‍රීවරයෙක් හැටියට සිංහලයන් ආරක්ෂා කර ගැනීම සඳහා එතුමා කර තිබෙන්නේ මොනවාදැයි මම අහන්න කැමැතියි.

**මෛත්‍රීපාල සේනානායක මහතා**
**(திரு. மைத்திரிபால சேனநாயக்க)**
(Mr. Maithripala Senanayeke)

මේ ගරු සභාවට ඇවිත් මා කරුණු ඉදිරිපත් කරන්නේ සිංහලයන් ආරක්ෂා කර ගන්න තමයි.

**පර්සි සමරවීර මහතා**
**(திரு. பேர்சி சமரவீர)**
**(Mr. Percy Samaraweera)**

එතුමා මේ ගරු සභාවට ඇවිත් අහනවා, "රජය මොකක්ද, කරන්න බලාපොරොත්තු වන්නේ ?" කියා. රජය කරන්න බලාපොරොත්තු වන දේවල්, කොතෙකුත් ඇති. නමුත් තමාගේ මැදවච්චිය ඡන්ද කොට්ඨාශයේ සිංහලයන්ට ත්‍රස්තවාදීන් පහර දෙන විට ඒ සිංහලයන් ආරක්ෂා කරන ගැනීම සඳහා යම් ක්‍රියා මාර්ගයක් ගන්න ඒ කොට්ඨාශයේ මන්ත්‍රීතුමාට බැරි නම් මට හිතෙනවා, මැදවච්චියේ මන්ත්‍රීවරයා හැටියට කටයුතු කරන්න එතුමාට සුදුසුකමක් නැහැ කියා මම ඒක අවධාරණයෙන්ම මතක් කරන්න ඕනෑ. සෑම අවස්ථාවකම තමුන්නාන්සේලාගේ හිතේ තිබෙන්නේ "මේ රජය කරන දේ වැරදියි, මේ තත්ත්වයට මුහුණදෙන්න රජය ශක්තිමත් නැහැ" කියන එකයි. ඒක මුදුන්පත් කරගෙන කථා කිරීම පමණයි තමුන්නාන්සේලා කරන්නෙ.

අපේ ආසනවල, ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ ආසනවල අපි ග්‍රාමාරක්ෂක හමුදා හද තිබෙනවා. අපි පුහුණුවක් දෙනවා ඒ අයට. ඇයි, තමුන්නාන්සේලාට බැරි ඒක කරන්න ? තමුන්නාන්සේ නම් බොහොම කිට්ටුවෙන් ලක්වෙලා ඉන්නෙ ඔය උවදුරට. තමුන්නාන්සේ වගබලාගන්න ඕනෑ තමුන්නාන්සේගේ ආසනයේ ඉන්න මිනිස්සු බේරාගන්න. ඒක නොකර මෙතැනට ඇවිල්ලා අද කියනවා, "අපි ජාතික පෙරමුණක් හැදුවාම ආණ්ඩුව අපේ රැස්වීම වෙලාවෙ මෙහෙම කළාය" කියා. තමුන්නාන්සේ මොහොතකටවත් හිතනවාද ජාතික පෙරමුණක් හදගෙන තුන්මුල්ල හන්දියට ඇවිත් පන්සිල් සමාදන්වෙලා ත්‍රස්තවාදයට මුහුණදෙන්නට පුළුවන්ය කියා ? තමුන්නාන්සේලාගේ හිත් අභ්‍යන්තරයේ තිබෙන්නෙ ඒක නොවෙයි. ගරු කථානායකතුමනි, මේ අය බොහෝවිට මහන්සි වුණා උතුරේ සිද්ධීන් වනවිට රටේ අනික් පළාත්වලත් මේ කොලොප්පම ඇති කර යම්කිසි භයානක තත්ත්වයකට මේ රට පත් කරන්නට. [බාධා කිරීමක්] ඇයි එහෙම නම් තමුන්නාන්සේලා යන්නෙ නැත්තෙ උතුරු මැද පළාතට හෝ එතැනින් එහාට ඔය ජාතික පෙරමුණේ කට්ටියත් අරන්, ඕක බේරුමක් කරන්න ? එහෙම නොකර මොකද තුන්මුල්ලෙ හන්දියට ඇවිල්ලා වාඩිවෙන්නෙ ? එතැන ඉඳලද ඒක කරන්න පුළුවන් ?

**මෛත්‍රීපාල සේනානායක මහතා**
**(திரு. மைத்திரிபால சேனநாயக்க)**
(Mr. Maithripala Senanayeke)

අපි හැමතැනම යනවා.

**පර්සි සමරවීර මහතා**
**(திரு. பேர்சி சமரவீர)**
**(Mr. Percy Samaraweera)**

ගරු කථානායකතුමනි, මම අද මෙතැනට පැමිණුනේ ඔය විදියේ ප්‍රශ්නවලට උත්තර දීමට පමණක් මගේ කතාව සීමා කරන්න නොවෙයි. මම අද සූදානම්ව සිටිනවා අද මේ රටේ මේතරම් භයානක තත්ත්වයක් ඇතිවෙන්න පදනම්වූ කරුණු රාශියක් මේ ගරු සභාවට ඉදිරිපත් කරන්න.

මැදවච්චියේ ගරු මන්ත්‍රීතුමා (මෛත්‍රීපාල සේනානායක මහතා) ප්‍රශ්න කළා මේ විදියට කටයුතු කරන විට, විරුද්ධ පක්ෂය රජයට සහයෝගය දෙන්නේ කොහොමද කියා. නමුත් අපි කල්පනා කර බැලුවොත්, අද තිබෙන මේ තත්ත්වය ඇතිවෙන්න විටින්විට මේ රටේ ඇතිවූ සිද්ධීන් ගැන, මම හිතන්නෙ අවසානයේදී අපි දෙගොල්ලටම කල්පනා කරන්නට පුළුවන් අපි අද එක පෙරමුණක් ගතයුතුය කියන එක ගැන. තමුන්නාන්සේලාගේ දැනගැනීම පිණිස මම ඒ කරුණු මතක් කරන්නම්. මේ අවුරුද්ද වන විට අවුරුදු 30 ක් ගතවී තිබෙනවා මේ භයානක තත්ත්වයට මුහුණපාන්නට සිදුවීමේ කටයුතු යාපනේ හා නැගෙනහිර පළාත්වල ආරම්භවෙලා. අවුරුදු 30 ක් කියා කියන්නෙ, මීට අවුරුදු 29කට පෙර ඇතිවූ තත්ත්වය. එනම් 1956 දී ඇතිවූ තත්ත්වය. තමුන්නාන්සේලාට මතක ඇති.

ගරු කථානායකතුමනි, 1956 දී පිහිටුවන ලද මහජන එක්සත් පෙරමුණු ආණ්ඩුව බලයට පත්වෙන්නට පෙර දුන් ප්‍රතිඥාව තමුන්නාන්සේට මතක ඇති. මෙතැන සිටින විරුද්ධ පක්ෂයේ මේ මන්ත්‍රීවරුන් තුන්දෙනාම මම හිතන්නෙ ඒ රජයේ සාමාජිකත්වය දැරුවා. එද ඒ ප්‍රතිඥාව—පැය විසිහතරකින් සිංහල භාෂාව මේ රටේ රාජ්‍ය භාෂාව කරනවා කියන ප්‍රතිඥාව—උඩයි ඒ උදවිය බලයට පත්වුණේ. නමුත් මම මතක් කරන්නට ඕනෑ ගරු කථානායකතුමනි, ඊට පෙර සිංහල භාෂාව මේ රටේ රාජ්‍ය භාෂාව විය යුතුයි කියන යෝජනාව ගෙන ආ තවත් පුද්ගලයෙක් මේ රටේ සිටින බව. ඒ ගෙන ආ යෝජනාවත්, 1956 දී ගෙන ආ යෝජනාවත් අතර තිබෙන වෙනස මම තමුන්නාන්සේලාට මතක් කරනවා.

1944 මැයි මාසයේ 24 වැනිද එද කැලණියේ මන්ත්‍රීතුමා, මේ රටේ වර්තමාන ජනාධිපතිතුමා, රාජ්‍ය මන්ත්‍රණ සභාවේදී යෝජනාවක් ගෙනාවා සිංහල භාෂාව රජයේ භාෂාව විය යුතුයි කියා. ඒ යෝජනාවෙ සඳහන් වෙන්නෙ මෙහෙමයි : හොඳට මතක තියාගන්නට ඕනෑ මේ වචන :

*Mr. Jayewardene :* Sir, the motion standing in my name reads as follows :

"That with the object of making Sinhalese the official language of Ceylon within a reasonable number of years this Council is of opinion–"

ඒ වචන කිහිපයෙන් "within a reasonable number of years" කියන වචන කිහිපයෙන් අපට පැහැදිලිව පෙනෙනවා වර්තමාන ජනාධිපතිතුමා පළමුවැනි වතාවට රාජ්‍ය මන්ත්‍රණ සභාවේදී ගෙන ආ ඒ යෝජනාවෙන් අදහස් කළ දෙය. ඉන් අනතුරුව 1956 දී බලයට පත්වූ මහජන එක්සත් පෙරමුණේ ආණ්ඩුව—

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
(Mr. Lakshman Jayakody)

He wants to make a charge about language but I want to remind him that there was the Indian-Pakistani Act which deprived certain Members of Parliament of

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

their place in this House in 1949. Then three was the Sixth Amendment which deprived another section of Members of their place in this House. Therefore, let it not be said that it is only language. No, there was a certain amount of gradual–

**පර්සි සමරවීර මහතා**
**(திரு. பேஸி சமரவீர)**
(Mr. Percy Samaraweera)

What has the Indian-Pakistani Act got to do with the Sinhala only Bill ?

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
(Mr. Lakshman Jayakody)

–steps taken to deprive certain Members elected to this House–

**පර්සි සමරවීර මහතා**
**(திரு. பேஸி சமரவீர)**
(Mr. Percy Samaraweera)

What are you talking ?

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
(Mr. Lakshman Jayakody)

I want to remind him of that also. They are two very clear instances.

**පර්සි සමරවීර මහතා**
**(திரு. பேஸி சமரவீர)**
(Mr. Percy Samaraweera)

ගරු කථානායකතුමනි, ඉන්දියන්-පකිස්ථාන් ඇක්ට් කියා වෙනම එකක් තිබුනා. ඒක මේ සිංහල පනතට සම්බන්ධ නැහැ.

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
(Mr. Lakshman Jayakody)

What about the CWC. It is with you today.

**පර්සි සමරවීර මහතා**
**(திரு. பேஸி சமரவீர)**
(Mr. Percy Samaraweera)

I will talk of the CWC also. You wait.

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
(Mr. Lakshman Jayakody)

Please.

**පර්සි සමරවීර මහතා**
**(திரு. பேஸி சமரவீர)**
(Mr. Percy Samaraweera)

ගරු කථානායකතුමනි, 1956 දී මෙන්න මේ විදියටයි ඒ පැය 24න් සිංහල පනත සකස් වුණේ.

"Provided that where the Minister considers it impracticable to commence the use of only the Sinhala language for any official purpose immediately on the coming into force of this Act,"

"immediately" කියා තිබෙනවා. ඒ කියන්නේ එහි සඳහන් විධියට පැය 24 ක් ඇතුලත සිංහල භාෂාව මේ රටේ රජයේ භාෂාව වුණා. සිංහලයෙක් හැටියට මම එයට විරුද්ධ නැහැ. කිසිම සිංහල මනුෂ්‍යයෙක් විරුද්ධ වෙන්නේ නැහැ. නමුත් එහෙම නම් මේ රටේ ඉන්න අනික් සුළු ජාතීන්ගේ භාෂාවකට වෙන්නේ මොකක්ද කියන එක ගැන එද ඒ පනත පාර්ලිමේන්තුවේදී සම්මත කරනවිට තමුන්නාන්සේලා කල්පනා කළේ නැහැ. වැදගත් පුද්ගලයන් දෙදෙනෙකුගේ වැදගත් පුතුන් දෙදෙනෙක් අද මේ ගරු සභාවේ ඉන්නවා. නුවරඑළිය–මස්කෙළිය දෙවන ගරු මන්ත්‍රීතුමාත් (අනුර බණ්ඩාරනායක මහතා) මහරගම ගරු මන්ත්‍රීතුමාත් (දිනේෂ් ගුණවර්ධන මහතා) ඒ දෙදෙනායි. ඒ දෙපොළ සාමාජිකත්වය දැරූ ආණ්ඩුවකින් තමයි ඒක සම්මත වුණේ. ඒ දෙපොළ ඇතුළු තමුන්නාන්සේලා සියලු දෙනාම එද දැරූ ආකල්පයමද අදත් දරන්නේ කියන ප්‍රශ්නය මම අහනවා.

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
(Mr. Lakshman Jayakody)

You went to jail, must be for the same reason!

**පර්සි සමරවීර මහතා**
**(திரு. பேஸி சமரவீர)**
(Mr. Percy Samaraweera)

Yes.

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
(Mr. Lakshman Jayakody)

Why are you–

**පර්සි සමරවීර මහතා**
**(திரு. பேஸி சமரவீர)**
(Mr. Percy Samaraweera)

ඒක තමයි මම කිව්වෙ. මේ රටේ රජයේ භාෂාව සිංහල වෙනවාට කිසිම සිංහලයෙක් අකැමැති නැහැ. නමුත් අපේ චෝදනාව එය නොවෙයි. ඒක පැය 24 න් සිංහල කරලා මේ රටේ සුළු ජාතීන්ගේ හිත්වල යම්කිසි තුවාලයක් ඇති කළා. කවදාවත් සනීප කරන්නට බැරි තුවාලයක් ඇති කළා (බාධා කිරීමක්) ඒක නැහැයි කියන්නට බැහැ, තමුන්නාන්සේලාට. ඉන් අනතුරුව මේ උදවිය මොකක්ද අනික් පැත්තෙන් කළේ ? මේ විධියට කටයුතු කරලා ගරු එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක අගමැතිතුමා යාපනයට ගිය අවස්ථාවකදී යම් උත්සවයකදී දෙමළ 'ශ්‍රී' අකුර ගැසූ කාර් එකකට එතුමාව දමල තල්ලු කරලා ඇරියායින් පසුව මොකද කළේ ? ඊට පස්සේ " The reasonable use of Tamil" කියා පනතක් ගෙනාවා. " The reasonable use of Tamil" කියා පනතක් පාර්ලිමේන්තුවට ගෙනැවිත් එය සම්මත කළා. එය සම්මත කරගෙන ඒ කාලයේ ඒ විධියට කටයුතු කරගෙන ගියා. මම මේ පෙන්වන්නට හැදුවේ එක අදහසක් ගැන මේ රටේ පහළ වුණු නායකයන් දෙදෙනෙකු අතර පරතරය කොපමණද කියන එකයි.

එපමණක් නොවෙයි ගරු කථානායකතුමනි. මම තවත් කාරණයක් මතක් කරන්නට ඕනෑ. විරුද්ධ පාර්ශවයේ, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ, මන්ත්‍රීවරුන් එද එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක අගමැතිතුමා දැරූ ආකල්ප අදත් දරනවාද කියන එක මම ඇහුවේ ඒ නිසයි. තමුන්නාන්සේලා අපට ඒකට පැහැදිලි උත්තරයක් දෙන්න ඕනෑ.

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
(Mr. Lakshman Jayakody)

ජනාධිපතිතුමා එද මහනුවරට පයින්ම යන්න ගියේ ඒ පනතට සහයෝගය දෙන්නද ? එහෙම නැත්නම් ඒකට විරුද්ධවද ?

**පර්සි සමරවීර මහතා**
**(திரு. பேஸி சமரவீர)**
(Mr. Percy Samaraweera)

ගරු කථානායකතුමනි, ජනාධිපතිතුමා එද මහනුවරට පයින් යන්න ගිය ඒ ඓතිහාසික පෙරහැරට සහභාගි වූ මන්ත්‍රීවරුන් දෙදෙනෙක් අද මේ ගරු සභාවේ සිටිනවා. ඒ ගරු රාජ්‍ය ඇමතිතුමාත් මමත්. ඒ ගැන දැන ගන්නට ඕනෑ නම් මම කියන්නම්.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**මෛත්‍රීපාල සේනානායක මහතා •**
**(திரு. மைத்திரிபால சேனநாயக்க)**
(Mr. Maithripala Senanayeke)

ඒ ගැන අහන්න ගම්පහ ගරු මන්ත්‍රීතුමාගෙන්.

**පර්සි සමරවීර මහතා**
**(திரு. பேஸி சமரவீர)**
(Mr. Percy Samaraweera)

ඒ ගැන මම කියන්නම්. මෙන්න මේ බණ්ඩාරනායක – චෙල්වනායගම් ගිවිසුමට විරුද්ධවයි එද ඒ පෙරහැරේ අපි පයින් ගියේ. ඔව් ! මම කියන්නම්. ඒ බණ්ඩාරනායක – චෙල්වනායගම් ගිවිසුම මා ළඟ තිබෙනවා. එද බණ්ඩාරනායක අගමැතිතුමා දුරු ආකල්ප අදත් තමුන්නාන්සේලා දරනවාද කියන එක කරුණාකර දන් කියන්න.

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
(Mr. Lakshman Jayakody)

You are giving Provincial Councils at Thimpu.

**හරින්ද්‍ර කොරයා මහතා**
**(திரு. ஹரிந்திர கொறயா)**
(Mr. Harindra Corea)

Regional Councils are worse. You want the North and the East linked.

**පර්සි සමරවීර මහතා**
**(திரு. பேஸி சமரவீர)**
(Mr. Percy Samaraweera)

ගරු කථානායකතුමනි, එද බණ්ඩාරනායක-චෙල්වනායගම් ගිවිසුම ඒ විධියට ඇති කර ගත්තා. ඇයි ? සිංහල භාෂාව ඒ විධියට රජයේ භාෂාව වුණායින් පස්සේ මේ රටේ ද්‍රවිඩ උදවිය මේ රටේ ඇති කළ ආන්දෝලනය නිසා, කලබලකාරී තත්ත්වය නිසා ෆෙඩරල් පක්ෂයේ නායක චෙල්වනායගම් මහතාත් සමග සාකච්ඡා කර ගිවිසුමක් අත්සන් කරන්නට දිවංගත අගමැති බණ්ඩාරනායක මහතාට සිදු වුණා.

ඒ ගිවිසුම මා ළඟ තිබෙනවා. අද තමුන්නාන්සේලා කියනවා, තිම්පු සාකච්ඡාවෙන් ජේ. ආර්. ජයවර්ධන අපේ ගරු ජනාධිපතිතුමා මේ රට පාවා දෙන්න යනවාය කියා. [බාධා කිරීමක්] තමුන්නාන්සේලා රැස්වීම්වලදී කියන්නේ ඒකයි. [බාධා කිරීමක්].

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
(Mr. Lakshman Jayakody)

Let us know the proposals, Sir.

**පර්සි සමරවීර මහතා**
**(திரு. பேஸி சமரவீர)**
(Mr. Percy Samaraweera)

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සංවිධායක අත්තනගල්ල ගරු මන්ත්‍රීතුමාගෙන් (ලක්ෂ්මන් ජයකොඩි මහතා) මා අහනවා, දැනට මාස තුනකට ඉස්සෙල්ලා තමුන්නාන්සේලාගේ නායිකාව කිව්වේ නැද්ද, ඉන්දියාවට, ඉන්දියාවේ රජයට, රජීව් ගන්ධි අගමැතිතුමාට පමණයි මෙයට සහනයක් ලබා දෙන්න පුළුවන් ය කියා ? එහෙම කිව්වේ නැද්ද ?

**එම්. හලීම් ඉෂාක් මහතා**
**(ஜனாப் எம். ஹலீம் இஸாக்)**
(Mr. M. Haleem Ishak)

"පමණයි" කියා කිව්වේ නැහැ.

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
(Mr. Lakshman Jayakody)

එයාට පුළුවන්ය කියා කිව්වා. "පමණයි" කියන වචනය පාවිච්චි කළේ නැහැ.

**පර්සි සමරවීර මහතා**
**(திரு. பேஸி சமரவீர)**
(Mr. Percy Samaraweera)

එහෙම නම් තමුන්නාසේලා ඇයි දන් කියන්නේ, "ඇයි තිම්පු සාකච්ඡා පවත්වන්නේ ; ඇයි ත්‍රස්තවාදීන් සමග ඉන්දියාවේ සාකච්ඡා කරන්නේ, ඕවා නවත්වලා මෙය විසඳන්න " කියලා.

**එම්. හලීම් ඉෂාක් මහතා**
**(ஜனாப் எம். ஹலீம் இஸாக்)**
(Mr. M. Haleem Ishak)

කව්ද එහෙම කීවේ ? නම් කරන්න.

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
(Mr. Lakshman Jayakody)

තමුන්නාන්සේට වලිගෙ පෑගිලා. තවත් මේක අවුල් කරන්න යනවා.

**පර්සි සමරවීර මහතා**
**(திரு. பேஸி சமரவீர)**
(Mr. Percy Samaraweera)

තමුන්නාන්සේලාට හිතුනු හිතුනු විධියට, තමුන්නතන්සේලාට ඕනෑ ඕනෑ විධියට මෙය සකස් කර ගන්න පුළුවන්. ගරු කථානායකතුමනි, බණ්ඩාරනායක-චෙල්වනායගම් ගිවිසුමේ මේ විධියට තිබෙනවා :

"After discussions it was agreed that recognition of Tamil as the language of a national minority of Ceylon, and that the four points mentioned by the Prime Minister should include provision that, without infringing on the position of the Official Langaguge Act, the language of administration in the Northern and Eastern Provinces should be Tamil and that any necessary provision be made for the non-Tamil speaking minorities in the Northern and Eastern Provinces."

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
(Mr. Lakshman Jayakody)

"Minority national language", not national language. You gave national langauge. We proposed minority national language Read that again.

**පර්සි සමරවීර මහතා**
**(திரு. பேஸி சமரவீர)**
(Mr. Percy Samaraweera)

Yes, minority national language.

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
(Mr. Lakshman Jayakody)

That is right. What have you put into the Constitution ? You have put in national language.

**පර්සි සමරවීර මහතා**
**(திரு. பேஸி சமரவீர)**
(Mr. Percy Samaraweera)

"Administration of the Northern and Eastern Provinces should be in the so-called national minority language." We did not say that. We said, at a certain stage every public servant must be competent enough to work in the national language, Sinhala. That is what we said.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

We also said that.

එම්. හලීම් ඉෂාක් මහතා
(ஜனாப் எம். ஹலீம் இஸாக்)
(Mr. M. Haleem Ishak)

We implemented it.

පර්සි සමරවීර මහතා
(திரு. பேஸி சமரவீர)
(Mr. Percy Samaraweera)

You implemented it ? If you want I will tell that it was the D. S. Senanayake government that implemented the reasonable use of Tamil in 1965-70.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

The Reasonable Use Of Tamil Bill came in 1958. The late Mr. D. S. Senanayake was dead in 1951.

පර්සි සමරවීර මහතා
(திரு. பேஸி சமரவீர)
(Mr. Percy Samaraweera)

You remember dates. But I will tell you that it was the late Mr. Dudley Senanayake Government of 1965-70 that implemented the Reasonable Use Of Tamil Bill. Are you challening that ? I will prove it to you.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

They got the late Mr. Tiruchelvam to do it. People went against that. Mr. Tiruchelvam did it all right.

පර්සි සමරවීර මහතා
(திரு. பேஸி சமரவீர)
(Mr. Percy Samaraweera)

I will tell you some more. Your leader proposed Regional Councils. Is that wrong ? I will read out to you the regulations under the Bandaranaike–Chelvanayakam Pact.

ගරු කථානායකතුමනි, බණ්ඩාරනායක-චෙල්වනායගම් ගිවිසුම යටතේ තමයි රට සභා ක්‍රමයක් මේ රටේ ඇති කරන්න ඕනෑය කියා පනතක් සම්මත කරන්න සූදානම් වුණේ. අන්න එයට විරුද්ධව තමයි අපි නුවරට පයින් යන්න ගමන් ආරම්භ කළේ. එහෙම කළේ යම්කිසි ජන මතයක් මේ රටේ ඇති කරන්න. ඇයි, බණ්ඩාරනායක අගමැතිතුමාගේ රට සභා පනතින් අනිවාර්යයෙන්ම මේ රට දෙකඩ වෙනවා. ඒ පනත මා ළඟ තිබෙනවා. ඒ අත්සන් කළ පනත මම කියවන්නම්. එහි මේ විධියට තිබෙනවා :

"Regional Councils – (*C*) Provision is to be made in the Bill to enable two or more regions to amalgamate even beyond provincial limits ;". . .

කොහොමද වැඩේ ? අදත් තමුන්නාන්සෙලා කියන්නේ ඒකද ?

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

With the permission of this House.

පර්සි සමරවීර මහතා
(திரு. பேஸி சமரவீர)
(Mr. Percy Samaraweera)

What do you mean by "permission of the House" ? Tell me, what is the policy of the SLFP on this now ?

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

It was about 25 years ago.

පර්සි සමරවීර මහතා
(திரு. பேஸி சமரவீர)
(Mr. Percy Samaraweera)

Yes, it is old.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

At that time it was quite different from what it is now. It is very clearly stated there that it is with the permission of the House. Every Regulation has to go through with the permission of the House ; not only here, at that time through the Senate also. There were two Houses at that time.

පර්සි සමරවීර මහතා
(திரு. பேஸி சமரவீர)
(Mr. Percy Samaraweera)

Nobody says, no.

ඒක නොවෙයි මා අහන්නේ. මා අහන්නේ එදා බණ්ඩාරනායක-චෙල්වනායගම් ගිවිසුමේ අත්සන් කරන ලද රට සභා ක්‍රමය, ඒ ආකල්පය, ඒ පිළිවෙළ පිළිබඳ මතය අද තමුන්නාන්සේලාත් දරනවාද කියන එකයි. ඒකයි මම අහන්නේ.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

Today it is quite different.

පර්සි සමරවීර මහතා
(திரு. பேஸி சமரவீர)
(Mr. Percy Samaraweera)

නැද්ද ? නැහැ !

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

Today the situation is quite different. You have got Mr. Thondaman on to your side.

පර්සි සමරවීර මහතා
(திரு. பேஸி சமரவீர)
(Mr. Percy Samaraweera)

"Provision is to be made in the Bill to enable two or more regions to amalgamate even beyond provincial limits ; and for one region to divide itself subject to ratification by Parliament. Further provision is to be made in the Bill for two or more regions to collaborate for specific purpose of common interest."

අදත් අපි ඒකට සම්පූර්ණයෙන්ම විරුද්ධයි. එදා පයින් ගියෙත් ඒකටයි.



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
(Mr. Lakshman Jayakody)

You come to Parliament and vote against that.

**පර්සි සමරවීර මහතා**
**(திரு. பேர்சி சமரவீர)**
(Mr. Percy Samaraweera)

What ?

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
(Mr. Lakshman Jayakody)

You come to Parliament and vote against that.

**පර්සි සමරවීර මහතා**
**(திரு. பேர்சி சமரவீர)**
(Mr. Percy Samaraweera)

Vote against what ?

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
(Mr. Lakshman Jayakody)

You get ratification of Parliament.

**පර්සි සමරවීර මහතා**
**(திரு. பேர்சி சமரவீர)**
(Mr. Percy Samaraweera)

අපේ ගරු ජනාධිපතිතුමා තිම්පු සාකච්ඡාවට යන්නට ඉස්සර, එයට සහභාගි වන නියෝජිත පිරිසට ප්‍රකාශ කළ කාරණා කීපයක් මම මතක් කර දෙන්නම්.

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
(Mr. Lakshman Jayakody)

අන්න ඒක කියන්න.

**පර්සි සමරවීර මහතා**
**(திரு. பேர்சி சமரவீர)**
(Mr. Percy Samaraweera)

කියා තිබුණේ මොනවාද ? මේ රටේ ජාතික කොඩිය හැටියට සිංහ කොඩිය පිළිගන්න ඕනෑ. මේ රටේ ජාතික ගීය පිළිගන්න ඕනෑ. හමුද පාලනය, ගොවි ජනපද පිහිටුවීම ආදී දේවල් සියල්ලක්ම මධ්‍යම ආණ්ඩුව යටතට පවරන්න ඕනෑ.

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
(Mr. Lakshman Jayakody)

ගොවි ජනපද ?

**පර්සි සමරවීර මහතා**
**(திரு. பேர்சி சமரவீர)**
(Mr. Percy Samaraweera)

ඔව්. තමුන්නාන්සේලාගේ පතන කොහොමද ? ගොවි ජනපද සම්බන්ධයෙන් කියා ඇති දේවල් අහගන්න.

–Colonization Schemes–

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
(Mr. Lakshman Jayakody)

What about Annexure 'C'?

**පර්සි සමරවීර මහතා**
**(திரு. பேர்சி சமரவீர)**
(Mr. Percy Samaraweera)

මේ "බණ්ඩාරනායක-චෙල්වනායගම් ගිවිසුම" ගැනයි මම කියන්නේ.

Your colonization schemes that were proposed and made law in this Parliament.

"It was agreed that in the matter of colonization schemes the powers of the Regional Councils shall include the power to select allottees to whom lands within their area of authority shall be alienated and also power to select personnel to be employed for work on such schemes. The position regarding the area at present administered by the Gal Oya Board in this matter requires consideration."

අන්න බලන්න. එතකොට තමුන්නාන්සේලා එද පිළිගෙන තිබෙනවා, බණ්ඩාරනායක-චෙල්වනායගම් ගිවිසුමෙන් තමුන්නාන්සේගේ ආසනයෙන් එහා ඇති ඉඩම්වල සම්පූර්ණ අයිතිය, සම්පූර්ණ වගකීම ඒ රට සභාවලට පවරන්නට.

**මෛත්‍රීපාල සේනානායක මහතා**
**(திரு. மைத்திரிபால சேனநாயக்க)**
(Mr. Maithripala Senanayeke)

ඒක යෝජනාවක් පමණක් නේද ? ස්ථිර කළේ නැහැ නේ !

**පර්සි සමරවීර මහතා**
**(திரு. பேர்சி சமரவீர)**
(Mr. Percy Samaraweera)

නැති වුණේ අපි නිසයි.

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
(Mr. Lakshman Jayakody)

What about Dudley Senanayake-Chelvanayagam Pact ?

**පර්සි සමරවීර මහතා**
**(திரு. பேர்சி சமரவீர)**
(Mr. Percy Samaraweera)

මම ඒකත් කියන්නම්.

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
(Mr. Lakshman Jayakody)

ඒකෙ අන්තිම කොටස – 4 වැනි ඡේදය – කියවන්න.

**පර්සි සමරවීර මහතා**
**(திரு. பேர்சி சமரவீர)**
(Mr. Percy Samaraweera)

ගරු කථානායකතුමනි, 1965-70 ආණ්ඩු කාලයේදී තමුන්නාන්සේ මේ රටේ සෞඛ්‍ය ඇමතිතුමා වශයෙන් කටයුතු කළා.

**කථානායකතුමා**
**(சபாநாயகர் அவர்கள்)**
(Mr. Speaker)

Order, please ! The hon. Member had been alloted 15 minutes. You have taken nearly 20 minutes. How long more will you speak ?

**පර්සි සමරවීර මහතා**
**(திரு. பேர்சி சமரவீர)**
(Mr. Percy Samaraweera)

Another ten minutes.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**කථානායකතුමා**
**(சபாநாயகர் அவர்கள்)**
(Mr. Speaker)

Then the whole thing goes out of gear. Here the time has been divided between the Opposition and the Government. I will give you five minutes more.

**පර්සි සමරවීර මහතා**
**(திரு. பேஸி சமரவீர)**
(Mr. Percy Samaraweera)

ගරු කථානායකතුමනි, අපේ අත්තනගල්ලේ මන්ත්‍රීතුමා අහනවා, ඒක ක්‍රියාත්මක කරන්නට ඉඩ දුන්නේ නැත්තේ මන්ද කියා. ඒකද අහැව්වේ ? 1965 - 70 කාලයේදී ජාතික ආණ්ඩුවක්ය කියන ආණ්ඩුවක් පිහිටුවා ගත්තා. අපේ මේ කථානායකතුමා එද සොබ්‍ය ඇමතිතුමා වශයෙන් පත් වී සිටියා. එවකට සිටි ගරු ඩඩ්ලි සේනානායක අගමැතිතුමා යම් යම් සංශෝධන ඇතුලත් කර රට සහා පනත ඉදිරිපත් කළා. මට මතකයි, එවකට දඹදෙනියේ ගරු මන්ත්‍රීවරයා වශයෙන් සිටි ආර්. ජී. සේනානායක මැතිතුමා, එම පනතට සංශෝධනයක් ගෙන ආ බව. එම සංශෝධනය පිළිබඳව යෝජනාව ස්ථිර කලේ මමයි. එද ඒක ස්ථිර කරන්නට මෙම පාර්ලිමේන්තුවේ වෙනත් කවුරුවත්වත් සිටියේ නැහැ. වාසනාවකට වාගේ ඒ සංශෝධනය ඉදිරිපත් කිරීම නිසා, එම පනත ඉල්ලා අස්කර ගන්නට සිදු වුණා. ඒ අනුව අපි රට සහා පනත ක්‍රියාත්මක කලේ නැහැ. ගරු කථානායකතුමනි, මම කියන්නට උත්සාහ කලේ විටින් විට ඇති වුණු මේ වාගේ යම් යම් දේවල් නිසා බරපතල තත්ත්වයක් අද මේ රටේ උද්ගත වී ඇති බවයි. ටිකක් කල්පනා කර බලන්න.

ගරු කථානායකතුමනි, සිරිමා බණ්ඩාරනායක මැතිණියගේ රජයෙන්, මට මතක හැටියට 1970 - 77 දක්වා පාලන කාලය තුලදී, විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා ලකුණු ප්‍රමිතිකරණයක් ඇති කලා. අද තත්ත්වයේ හැටියට අපේ ප්‍රදේශයේ ළමයකුට ලකුණු 187 ක් අරගෙන විශ්වවිද්‍යාලයකට ඇතුළු වෙන්නට පුළුවන් නම්, වැලිමඩ මන්ත්‍රීවරයා හැටියට මම සන්තෝෂ වෙනවා. නමුත් මම අහන්නේ ඒ ප්‍රමිති ක්‍රමය නිසා කොළඹ, මහනුවර, ගාල්ල ආදී ප්‍රදේශවල සිංහල ළමයින්ට කොහරම් අසාධාරණයක් සිදු වී තිබෙනවාද කියන එකයි.

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
(Mr. Lakshman Jayakody)

ඒක තමයි මැතිව් කියන්නෙත්.

**පර්සි සමරවීර මහතා**
**(திரு. பேஸி சமரவீர)**
(Mr. Percy Samaraweera)

මැතිව් කියන දේ නොවෙයි මම කියන්නේ. මම කියන දෙයයි, මම කියන්නේ. අද කොළඹ ප්‍රදේශයේ ළමයෙකුට විශ්වවිද්‍යාලයට යන්නට ලකුණු 235 ක් ලබාගන්න ඕනෑ.

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
(Mr. Lakshman Jayakody)

ඒක තමයි නීවිල් ප්‍රනාන්දු කිව්වෙත්.

**පර්සි සමරවීර මහතා**
**(திரு. பேஸி சமரவீர)**
(Mr. Percy Samaraweera)

234 ක් ගන්නත් ඒ ළමයාට විශ්වවිද්‍යාලයට යන්නට බැහැ. නමුත් මේ රටේ වෙන පළාතකින් ලකුණු 187 ක් ගත් විට විශ්වවිද්‍යාලට යන්නට පුළුවන්. සාධාරණය ඒකද කියා මම අහනවා. ඒ අයට තිබුණේ ඒක කරන්නට නොවෙයි. ඒ අයට කරන්නට තිබුණේ අපේ ප්‍රදේශ වැනි දුෂ්කර පළාත්වල තිබෙන පාසල් ටික දියුණු කර විද්‍යාගාර හා ගුරුවරුන් සපයා ඒ ප්‍රදේශවල ළමයිනුත් යම් තත්ත්වයකට ගෙනැවිත් ප්‍රමිති ක්‍රමයක් නැතිව විශ්වවිද්‍යාලවලට ළමයින් බඳවා ගැනීමයි. ඒ අය කල්පනා කලේ ඒ අන්දමට ප්‍රමිති කිරීමෙන් ගහන්නේ යාපනයේ ද්‍රවිඩ ළමයින්ට පමණක්ය කියලයි. නමුත් දැන් බලන විට කොළඹ, මහනුවර වැනි ප්‍රදේශවල සිංහල ළමයින්ටත් සැහෙන්න වැදිලා තිබෙනවා. ඒ අය කළ ඔන්න එය වගේ වැඩ නිසයි, අද අපට මේ තත්ත්වයට මුහුණ දෙන්නට සිදු වී තිබෙන්නේ.

ඒ කාලයේ මහ ලොකුවට කෑගැසුවා සිරිමා බණ්ඩාරනායක මහත්මිය ශාස්ත්‍රී මහතාත් සමඟ ගිවිසුමක් ඇති කර ඉන්දියානු ප්‍රශ්නය විසඳුවාය කියා. ඒ ගිවිසුමේ තිබෙන්නේ තුන් ලක්ෂයක් මේ රටේ පුරවැසිකම ලබන විට 5, 25, 000 ක් ඉන්දියාවට යවනවාය කියලයි.

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
(Mr. Lakshman Jayakody)

600,000 – that is correct.

**පර්සි සමරවීර මහතා**
**(திரு. பேஸி சமரவீர)**
(Mr. Percy Samaraweera)

5, 25, 000 යි. මේ ගිවිසුම අනුව තවත් 1, 50, 000 ක් ඉතිරි වෙනවා.

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
(Mr. Lakshman Jayakody)

That we also divided.

**පර්සි සමරවීර මහතා**
**(திரு. பேஸி சமரவீர)**
(Mr. Percy Samaraweera)

"ඩිවයිඩඩ් " තමයි. [බාධා කිරීමක්]

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
(Mr. Lakshman Jayakody)

දෙවැනි සාකච්ඡාවේදි ඒකත් අහෝසි කළා.

**පර්සි සමරවීර මහතා**
**(திரு. பேஸி சமரவீர)**
(Mr. Percy Samaraweera)

මේ ගිවිසුම අත්සන් කළ දවසේ සිට අවුරුදු 15 ක් ගත වන තුරු එද ගිවිසුම අත්සන් කළ දවසේ පටන් ඉපදෙන ළමයින් මේ රටේ ජීවත් වෙනවාය කියන එක එද තමුන්නාන්සේලා කල්පනා කලේ නැහැ නේද ? එද එය කල්පනා කලේ නැහැ.

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
(Mr. Lakshman Jayakody)

ඇයි නැත්තේ ? කල්පනා කළා.

Natural increase to be expatriated.

**පර්සි සමරවීර මහතා**
**(திரு. பேஸி சமரவீர)**
(Mr. Percy Samaraweera)

ජාතික ප්‍රශ්නවලදී ගත් මෙත්න මේ විධියේ වැඩ පිළිවෙළවල් හා තීරණ නිසා අද මේ ප්‍රශ්නය උත්සන්න වී තිබෙනවා. මම මේ කියන්නේ තමුන්නාන්සේලාට අගෞරවයක් කරන්න නොවෙයි. එමෙන්ම ශ්‍රී ලංකා නිදහස් පක්ෂය හෝ වෙනත් පක්ෂයක් අපකීර්තියට පත් කරන්න කතා කරනවාත් නොවෙයි. නමුත් මේ සිද්ධීන් නිසා අපේ මේ ආණ්ඩුව හය වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පාර්ලිමේන්තුවට ගෙනාවා. ඒ අනුව මේ රට දෙකඩ කරන්නට සූදානම් නැත කියා තමුන්නාන්සේ ඉදිරිපිට දිවුරන්නේ නැත්නම් එවැනි කිසි කෙනෙකුට මේ ගරු සභාවේ වාඩි වෙන්න බැහැ. මේ රටේ යම් කොටසකට එයත් අහිතකර වෙන්නට පුළුවන්. මම මතක් කරන්නට හැදුවේ එය නොවෙයි. අපි මොන විධියේ දේශපාලන මතිමතාන්තර දැරුවත් අද පැනනැගී තිබෙන තත්ත්වය අනුව අපි එකාමෙන් මේ රටේ නැගී සිටියේ නැත්නම් සිංහල ජාතිය විනාශයි කියා කල්පනා කරන්නට පුළුවන්.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[පර්සි සමරවීර මහතා]

බොහොම භයානක ප්‍රවෘත්තියක් අද " දවස " පත්‍රයේ තිබුණා. " යුද වැදී අයිතිය දිනා ගන්නවාලු " යන සිරස් තලය යටතේ පළවී ඇති එම ප්‍රවෘත්තියේ මෙන්න මෙහෙම සඳහන් වෙනවා :

" ද්‍රවිඩ මුන්නේත්‍රම් කසාගම් පක්ෂයේ (අපි දෙමළ) නායක එම්. කරුණානිධි මහතා ඊයේ ප්‍රකාශ කර සිටියේ ද්‍රවිඩ ප්‍රශ්නය විසඳීමට ඇති එකම විසඳුම ශ්‍රී ලංකාව දෙකඩ කිරීම බවයි.

ද්‍රවිඩ ත්‍රස්තවාදීන් සන්නද්ධ එකම අරගලයක් සඳහා සූදානම් වන බව නවදුරටත් ඔහු ප්‍රකාශ කළේය. "

බාලසිංහම් කියන ත්‍රස්තවාදී කණ්ඩායමකට සම්බන්ධ කෙනෙක් තමයි, මෙය පටන්ගෙන තිබෙන්නේ. ඊට පසුව කරුණානිධි කියන පුද්ගලයාත් මෙය කියා තිබෙනවා. ඉන්දිය පත්‍රයක තිබුණා යයි අද " දවස " පත්‍රයේ පළවී තිබෙන මේ ප්‍රවෘත්තිය සත්‍යයක් නම් අද මේ රටේ තිබෙන තත්ත්වය කොයිතරම් භයානකද කියා මම අහනවා. කවුද කරුණානිධි, මෙවැනි ප්‍රකාශයක් කරන්නට ?

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
(Mr. Lakshman Jayakody)

තොන්ඩමන්ගේ බෑනා.

**පර්සි සමරවීර මහතා**
**(திரு. பேஸி சமரவீர)**
(Mr. Percy Samaraweera)

මම දන්නේ නැහැ නැදැකම්. කවුරු හෝ වේවා කරුණානිධි කියන පුද්ගලයාට මේ ප්‍රකාශය කරන්නට කිසිම අයිතියක් නැහැ. ඒ නිසා මෙවැනි අයගේ මෙවැනි ප්‍රකාශවලින් අපව මුදවා ගන්නට අගමැති රජිව් ගාන්ධි මැතිතුමාට ශක්තියත් ධෛර්යයත් ලැබේවා කියා අපි ප්‍රාර්ථනා කරමු. මම රජයෙන් ඉල්ලීමක් කරනවා මේ විධියේ ප්‍රකාශ ලෝක සමුළුවකට ගෙන ගොස් අපේ ආරක්ෂාව පතන්නය කියා. ඒ තරම් භයානක තත්ත්වයකයි අද අපි ජීවත් වෙන්නෙ. ඒ නිසා මගේ කථාව අවසන් කරන්න කලින් විරුද්ධ පාර්ශ්වයෙන් කරන එකම ඉල්ලීම නම්—

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
(Mr. Lakshman Jayakody)

ලෝක සමුළුවකට ?

**පර්සි සමරවීර මහතා**
**(திரு. பேஸி சமரவீர)**
(Mr. Percy Samaraweera)

මම ඉල්ලීමක් කරනවා තමුන්නාන්සේලාගෙන්—

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
(Mr. Lakshman Jayakody)

You want this to e taken up in an international forum. Oh ! my Goodness.

**පර්සි සමරවීර මහතා**
**(திரு. பேஸி சமரவீர)**
(Mr. Percy Samaraweera)

You can take it to any forum.

තමුන්නාන්සේලා අපි මෙපමණ කල් දේශපාලන වශයෙන් හැප්පෙමින් කටයුතු කළා. මේ 27 වෙනි වතාවටයි හදිසි නීතිය දීර්ඝ කරන්නය කියා පාර්ලිමේන්තුවට යෝජනාව ඉදිරිපත් කර තිබෙන්නෙ. කොයි තරම් ජරමර තිබුණත් ඒ හදිසි නීතිය දීර්ඝ කිරීමේ යෝජනාවට තමුන්නාන්සේලා එක වතාවක්වත් ඡන්දය දුන්නෙ නැහැ. ඒ තමුන්නාන්සේලා හිතන විධියයි. ඒක වැරදියි. තමුන්නාන්සේලාගේ අපේ දූ දරු පරම්පරාව මේ රටේ ජීවත් කරන්න නම් අපි එකමුතුව මේ සටන කරන්න ඕනැ. ඒක තරයේම හිතට ගන්නොත් හොඳයි. තමුන්නාන්සේලා එක පැත්තක - තුන්මුල්ල හන්දියෙන්, අපි තවත් පැත්තක තව තැනකත් මේ සටන කරන්න ගියොත් අපට කවදාවත් මේ සටන ජය ගන්න බැහැ. ඒ නිසා මේ රටේ ගරුතර මහා සංඝ රත්නයත්, පූජකවරුන්, වැඩිහිටි සියලු දෙනාමත් ප්‍රාර්ථනා කරන විධියට අනාගතයේ යම් දවසක මේ සටන කරන්න සිද්ධ වෙනවාද එසේ නම් අපි එක්කහු වී ඒ සටන කරමුය කියන ඉල්ලීම කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහෝම ස්තුතියි.

**එස්. ඩී. බණ්ඩාරනායක මහතා (ගම්පහ)**
**(திரு. எஸ். டி. பண்டாரநாயக்க — கம்பஹ)**
(Mr. S. D. Bandaranayake–Gampaha)

Mr. Speaker, Sir, I wish to make a few submissions on this Emergency Debate. As a result of the party political system being thrust on us by the British Empire in 1948 and the divisions that have developed in our country as a result of this system we are unable to bring about national unity to solve the Tamil problem.

In fact, the people of this country expected the Sri Lanka Freedom Party to operate as a link between the United National Party and the Tamil militants fighting for their rights, but unfortunately party politics and power politics is the chief obstacle to such a course of action.

Sir, Hon. R. Premadasa, Prime Minister, as reported in the 'Divaina', on 19th December 1983 has stated as follows : "My sincere opinion is that this party system is no longer needed. After throwing away this party system we should all unite to develop the country. This is a matter that should be discussed by the general public. My opinion is that the present system of administration is now outdated. A new system of administration suited to the present day needs of the country should be organized. People speak about corruption and waste in the country. The cause for this corruption is the party system. There are instances where justice cannot be done due to this party system. It is natural for political leaders to come forward to safeguard culprits who are loyal to the party when they are caught doing corrupt practices. Here we find corruption taking place automatically. To eradicate this there should be a system of administration outside party politics". This is an English Translation of what was stated by the Hon. Prime Minister. This was the warning expressed by the late Prime Minister S. W. R. D. Bandaranaike too as far back as July 7th, 1932 in the submissions he made in the State Council on constitutional reforms at that time.

In this respect I call upon all Hon'ble Members of this House to follow this call of the Hon. Prime Minister, and go amongst the masses and discuss this question with the masses. This is the one and only method of finding a solution to the national problem of the Tamil people as well as all our economic problems that we are faced with after 450 years of foreign rule.

If the party system of politics of the Westminster form did not exist in 1956 the bus companies would not have been nationalised in that form. Instead 51% of the shares would have been taken over by the state with 49% of the shares in the hands of the companies, with two members on the Board of Management from the companies on the board of five, as I had suggested at that time.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

In fact, all corporations functioning today are on the verge of closing down would have been established as joint ventures on this formula.

Today all political parties have to come to a coalition front on a minimum based programme. The leadership of such a front has to be collective according to seniority, with those over 75 years of age being appointed as advisers in the politibureau of the front. Elections to this assembly can continue where the united front nominates candidates for elections to seats on requests made by the people, and candidates to seats could be elected on the programme of development submitted by each candidate.

What happened in 1956 was that the party in power was only interested in taking revenge from the opposition party, as we are continuing to do today ; and that is why I called the system and the Parliament a '*Hora Guhawa*' thrust on Sri Lanka by the British Empire, in the 1956 era.

It is in utter desperation that the Tamil youths since 1956 have had to resort to terrorism to fight for their human rights in Sri Lanka.

The four cardinal principles laid down by them in the talks in Thimpu are rights that any citizen of any country is entitled to. These four cardinal principles have to be the basis of any agreement that we the Sinhala people have with the Tamils, the Muslims, the Burghers and the Malays, the minorities in or country who have made this Island their home.

**කථානායකතුමා**
**(சபாநாயகர் அவர்கள்)**
(Mr. Speaker)

Order, please ! Mr. Deputy Speaker will now take the Chair.

*අනතුරුව කථානායකතුමා මූලාසනයෙන් ඉවත්වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [නෝමන් වෛද්‍යරත්න මහතා] මූලාසනාරූඪ විය.*

*அதன் பிறகு, சபாநாயகர் அவர்கள் அக்கிராசனத்திலிருந்து நீங்கவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [திரு. நோமன் வைத்யரத்ன] தலைமை வகித்தார்கள்.*

*Whereupon* MR. SPEAKER *left the Chair, and* MR. DEPUTY SPEAKER [MR. NORMAN WAIDYARATNA] *took the Chair.*

**එස්. ඩී. බණ්ඩාරනායක මහතා**
**(திரு. எஸ். டி. பண்டாரநாயக்க)**
(Mr. S. D. Bandaranayake)

Mr. Deputy Speaker, it is not only the Sinhala people who are entitled to these four cardinal principles. Once we decide to accept these four cardinal principles the imbalance in employment business, etcetera, which 74.6 per cent the Sinhala people, have come to after 450 years of foreign rule and 37 years of the Westminster System has to be rectified.

If the Ruhunu, Pihiti, Maya boundaries of Sri Lanka, changed during the time of foreign rule to meet their own ends, have to be altered, certainly do so, but these four cardinal principles have to be granted and be made the basis of agreement on final unitary system of a sovereign and independent Sri Lanka. It is not by acceding to these four cardical principles that separatism is brought about but by denying these fundamental rights of the Tamil minority.

It is just impossible for an autonomous state or states to operate in the Northern and Eastern Provinces under the present Westminster constitution. That is the reason why the entirety of the Constitution has to be changed, without bringing about peacemeal amendments at various times.

The people of Sri Lanka should have trust and complete confidence in Prime Minister Rajiv Gandhi and the Government of India in this hour of need.

Therefore I call upon all media today, the press, the radio, television, excetera to carry this message to the masses of this country before it is too late. We have to unite to destroy this system before the system destroys all of us and our nation.

Sir, I now wish to submit to this House and through this House to the people the obstacles that the 45 per cent of the people in the opposition parties are faced with as a result of this Westminster System. I shall now read out a letter submitted by Navasigahawatte Somaratana Thera, the Viharadhipathi of Sri Bodhi Vihara of 254/4, Bollatha, Ganemulla dated 19.03.85.

"Hon. Mr. E. L. B. Hurulle,
Minister for Cultural Affairs,
Cultural Affairs Ministry,
Bauddhaloka Mawatha,
Colombo 7.

Hon. Minister,

*Request for Financial Assistance*

This Vihara exists in an environment where there are sixty per cent Catholics. Although there are a few Buddhists, they are very poor. Both Buddhists and Catholics without any religious descrimination, fully support the development of this temple. Although this temple was started recently, the residents of the areas will vouch for the services being rendered by this temple.

I live in a small room adjoining the Dharma Salawa. It is not a suitable place to be occupied by a bikkhu. Also it is necesary for a wall to be constructed round the bodhiya. I shall appreciate very much if you will draw your atention to this matter and grant financial assistance to the vihara.

Sgd/Navasigahawatte Somaratana,
Viharadhipathi."

This is an English translation of the letter.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එස්. ඩී. බණ්ඩාරනායක මහතා]

Then there is a letter by Mr. Donald Dissanayake, Chairman, Regional Council, and Chief Organizer, Government Party, Gampaha Electorate.

"The Rev. Viharadhipathi, 10.05.1985
Sri Bodhi Vihara,
Bollatha,
Ganemulla.

Rev. Priest,

*Assitance for the Vihara*

The Hon. Minister for Cultural Affairs has inquired from me about your letter on the above subject dated 19.03.1985, sent through the Member of Parliament for Gampaha.

As the Member of Parliament has launched a campaign to discredit the government, I as a party representative of the government do not accept what you have done.

Therefore, I kindly inform you to consult me when requesting such assistance on ocassions like this. Thank you.

Sgd/ J. M. Donald Dissanayake.
Chairman, Regional Council &
Chief organiser, Government Party,
Gampaha."

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

This happens to me every day in Attanagalla, Sir,

එස්. ඩී. බණ්ඩාරනායක මහතා
(திரு. எஸ். டி. பண்டாரநாயக்க)
(Mr. S. D. Bandaranayake)

The Chief Viharadhipathi now writes to His Excellency :

"His Excellency the President,
Presidential Office,
Colombo.

Sri Bodhi Viharaya,
Bollatha,
Ganemulla.
24.05.1985.

Your Excellency,

The Sri Bodhi Viharaya, situated at Bollatha, Ganemulla in the Gampaha Electorate, in an environment consisting of sixty per cent Catholics and forty percent Buddhists was started in humble manner with the co-operation of all these devotees. By now this temple has gained a considerabel development based on the eonomic level of the residents of the area.

Therefore, on 19.03.1985 I submited a letter to the hon. Minister for cultural Affairs requsting financial assistance. I also sent a copy of this letter to the Hon. Member of Parliament for the area. The copy with the MP's recommedation has been sent to the Hon. Minister.

What happened subsequently has become a problem to me. On 10.05.1985, I received a letter from the Chief Organizer of the United National Party, Gampaha, Mr. Donald Dessanayake. I have attached a copy of his letter herto.

When going through the letter, the inference I could draw was that the government party representative, Mr. Donald Dissanayake, does not accept the assistance of the MP of the area for a religious activity of this nature. Also it is stated in that letter that the MP is carrying on a campaign to discredit the government. what I can say about this is that I do not know about the political activities of the MP and I have never met or seen him.

Your Excellecny, according to Mr. Donald Dissanayake, I have come to the conclusion that involvement in politics is necessary to obtain assistance for a vihara. Also I feel that, according to his letter, failure to consult him as the government party representative about assistance for religious activites of this nature, results in outright concellation of same, which I presume is a subtle threat.

Do not the Buddhists suspect government policy on Buddhism, according to Mr. Donald Dissanayake's irresponsible statements about religious activities as Chief Organizer of the United national Party, Gampaha ? Is not this an attempt to discredit and assess lightly the immense work done for the development of Buddhism under your Excellency's leadership, such projects like the Cultural Triangle ?

Your Excellency, I do not wish to see a division among the devotees by dragging them in politics, who so far have supported this vihara. therefore I kindly request you to grant suitable assistance through suitable channels for the development of this temple.

Sgd/ Navasighawatte Somaratana,
Viharadhipathi,
Sri Bodhi Vihara,
Bollatha,
Ganemulla."

Sir, the Hon. Prime Minister is due to open the 1,000 houses under the Sudu Bodhi Village Housing Project at Baduwathugoda on 27.8.1985. The committee for the opening ceremony held its meeting with the participation of the following on 5.8.1985 in the AGA's Office in Gampaha : (1) Mr. G. D. T. Jayawardhana, Assistant Government Agent, Gampaha. (2) Mr. U. Weerakkody, District Manager, Housing Development, Authority, Gampaha. (3) Mr. H. A. Ariyadasa, Assistant Commissioner of Local Government, Gampaha. (4) Mr. P. Udugampola, Senior Superintendent of Police, Gampaha. (5) Mr. Siriwardhana, Highways Engineer, Gampaha. (6) Mr. Sarath Marasinghe, Chairman, Gramodaya Mandala, Baduwathugoda. (7) Mr. N. P. Jayasoma, retired Principal of Aluthgamgoda. (8) Mr. Donald Dissanayake, Chief Organizer, UNP, Gampaha.

The Hon. District Minister, who was busy otherwise, turned up later.

At the above meeting, Mr. Donald Dissanayake made the following statement. He said that if his name is not inscribed in the commemorative plaque of the housing project it would be removed that same night. That same night ! I requested the Superintendent of Police, Gampaha, to take note of this statement then and there.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

He is an anti-national.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

එස්. ඩී. බණ්ඩාරනායක මහතා
(திரு. எஸ். டி. பண்டாரநாயக்க)
(Mr. S. D. Bandaranayake)

He also said that since the Hon. Prime Minister was from the UNP and he was due to attend the opening ceremony and the Member for Gampaha was from the Opposition, the latter's assistance for the opening ceremony was not necessary. Mr. Donald Dissanayake also said that the ceremony must be held according to his wishes.

On this occasion my secretary, Mr. Francis Kuruwita, stated that the Government expects to work with the co-operation of the Opposition parties and on occasions like this we are prepared to extend our support and it is prudent that Mr. Dissanayake should think more intelligently. Then Mr. Donald Dissanayake told Mr. Kuruwita to shut his mouth; else he would crush Mr. Kuruwita's ear.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

My God ! He is a thug.

එස්. ඩී. බණ්ඩාරනායක මහතා
(திரு. எஸ். டி. பண்டாரநாயக்க)
(Mr. S. D. Bandaranayake)

It is clear that under these circumstances a question mark hangs over–

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(Mr. Deputy Speaker)

Order, please !

එස්. ඩී. බණ්ඩාරනායක මහතා
(திரு. எஸ். டி. பண்டாரநாயக்க)
(Mr. S. D. Bandaranayake)

I am finishing now, Sir.

It is clear that under these circumstances a question mark hangs over the solution of a burning national problem of our country which has surfaced after a period of 450 years, when thugs are appointed to represent a political party based on party politics. I wish to submit on this occasion that due to the actions of such cowards and thugs public servants of the Gampaha area are obstructed in the performance of their duties. I wish to submit several such instances.

මෙරිල් කාරියවසම් මහතා (අගලවත්ත)
(திரு. மெரில் காரியவசம் — அகலவத்த)
(Mr. Merril Kariyawasam–Agalawatta)

I do not think it is fair for Members to criticize persons who cannot defend themselves in this House. I think the hon. Member for Gampaha will realise it. He is criticising a gentleman who is not here and cannot defend himself. This is completely outside the scope of the discussion. We are talking about the Emergency, and he is talking about the difficulties he has.

එස්. ඩී. බණ්ඩාරනායක මහතා
(திரு. எஸ். டி. பண்டாரநாயக்க)
(Mr. S. D. Bandaranayake)

During the election of the Gampaha Gramodaya Mandala President in 1984, the then Assistant Government Agent, Gampaha, Mr. Lakshman Attanayake, had to seek police protection from the threats of gangs of thugs.

Also, on the occasion of the official visit to the Gampaha Electorate of Mr. Ranjan Wijeratne, Chairman, Agricultural Development Authority, when he visited Aluthgama-Bogamuwa, in the presence of the people and myself Mr. Donald Dissanayake said that Mr. Samarasinghe, the Irrigation Engineer, should be beaten up with a *"pol pittha"* and chased away.

When public servants are harassed by him under cover of political power, on such occasions I have to protect them, as he has become a headache to them. I consider that it is my duty to disclose such undisciplined and irresponsible behaviour of Mr. Donald Dissanayake in the interest of the people of Gampaha.

As a result of those incidents I have now decided not to attend a single meeting where Mr. Donald Dissanayake is present unless the District Minister or a Minister or a Deputy Minister of the Government is present at the meeting.

එම්. වින්සන්ට් පෙරේරා මහතා
(திரு. எம். வின்சன்ற் பெரேரா)
(Mr. M. Vincent Perera)

I rise to a point of Order, Sir. I would like to know whether the hon. Member is discussing the Emergency or –

එස්. ඩී. බණ්ඩාරනායක මහතා
(திரு. எஸ். டி. பண்டாரநாயக்க)
(Mr. S. D. Bandaranayake)

Yes, Sir. These are all related to the Emergency.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(Mr. Deputy Speaker)

Order, please ! That is not very relevant. I think in any event you should stop now.

එස්. ඩී. බණ්ඩාරනායක මහතා
(திரு. எஸ். டி. பண்டாரநாயக்க)
(Mr. S. D. Bandaranayake)

I am finishing now, Sir.

In conclusion let me state that I shall continue –

මෙරිල් කාරියවසම් මහතා
(திரு. மெரில் காரியவசம்)
(Mr. Merril Kariyawasam)

I think the hon. Minister is ridiculing this House, Sir.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**නියෝජ්‍ය කථානායකතුමා**
**(பிரதிச் சபாநாயகர் அவர்கள்)**
(Mr. Deputy Speaker)

Let him wind up.

**එස්. ඩී. බණ්ඩාරනායක මහතා**
**(திரு. எஸ். டி. பண்டாரநாயக்க)**
(Mr. S. D. Bandaranayake)

In conclusion, let me categorically state that I shall continue to give my support to His Excellency the President and this Government unconditionally to solve these grave problems faced by the people of this country.

Thank you.

පු. භා. 11

**මෙරිල් කාරියවසම් මහතා (අගලවත්ත)**
**(திரு. மெரில் காரியவசம் — அகலவத்த)**
(Mr. Merril Kariyawasam–Agalawatta)

කථානායකතුමනි, හදිසි නීතිය දීර්ඝ කිරීමේ යෝජනාව විවාදයට භාජන කරන මේ අවස්ථාවේදී පසුගිය කාලයේ වෙච්ච සිද්ධීන් ගැන මෙම ගරු සභාවේ කථා කරන්න අවස්ථාව ලබා දීම ගැන පළමුකොටම ස්තුතිවන්ත වෙනවා. තිම්පු සාකච්ඡා පැවැත්වෙන කාලය තුළ සටන් නැවැත්වීමේ සම්මුතියක් තිබියදී ඒ කාලය තුළ කරන ලද මිනී මැරුම්, බැංකු හොරකම් සහ වෙනත් නොයෙක් බිහිසුණු ක්‍රියා අපි තරයේම හෙළා දකිනවා. ඒ වාගේම එසේ සාකච්ඡා මාර්ගයෙන් යමක් ඉටු කරන්න වෑයම් කරන අවස්ථාවකදී පවා ඊට බාධා කරන අන්දමේ බිහිසුණු අපරාධ කිරීම ඇත්ත වශයෙන්ම මම හිතන්නේ ශීලාචාර මනුෂ්‍ය වර්ගයා පිළිගන්නේ නැති බවයි. ශීලාචාර මිනිසුන් කවුරුත් එවැනි දේවල් හෙළා දකිනවා ඇති. ඒ වාගේම මේ බිහිසුණු ක්‍රියාවලදී ජාතිය වෙනුවෙන් ඒවාට මුහුණ දුන් ත්‍රිවිධ හමුද හා පොලිස් හමුද භටයන්ටත් මේ අවස්ථාවේදී අපේ උපහාරය පුද කරනවා.

ඒ අතරතුරේදී නියෝජ්‍ය කථානායකතුමනි, රටේ පවතින ඒ තත්ත්වය ප්‍රයෝජනයට අරගෙන දේශපාලන වාසි තකා ක්‍රියා කරන්න උත්සාහ කරන පිරිස අන්න ඒ වාගේම අපි අනික් අතින් හෙළා දකිනවා. විශේෂයෙන්ම ශ්‍රී ලංකා නිදහස් පක්ෂය පසුගිය කාලයේ සිට ගෙනයන දේශද්‍රෝහී—

**රිචඩ් පතිරණ මහතා (අක්මීමන)**
**(திரு. றிச்சட் பத்திரன — அக்மீமன)**
(Mr. Richard Pathirana–Akmeemana)

සෝමපාල මැරුවේ කවුද ?

**මෙරිල් කාරියවසම් මහතා**
**(திரு. மெரில் காரியவசம்)**
(Mr. Merril Kariyawasam)

— දේශද්‍රෝහී ව්‍යාපාරය අපි තරයේ හෙළා දකිනවා. විශේෂයෙන්ම ජාතික සමගියක් අපට අවශ්‍ය වී තිබෙන මේ අවස්ථාවේදී ඒ ජාතික සමගිය ගොඩ නගන්න නොදී යම් කෙනෙක් කටයුතු කරනවා නම් එය ජාතියට විරුද්ධව කරන ද්‍රෝහිකමක්. මම විශේෂයෙන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නායකත්වයට මේ අවස්ථාවේදී කියනවා, තමන්ගේ අවස්ථාවදී ආශාවන් ජාතිය වෙනුවෙන් මේ අවස්ථාවේදී මර්දනය කරගන්නය කියා. යම් කිසි ජාතියකට විරුද්ධව සටනක් තිබෙනවා නම් ඒ සටන දිනන්න පුළුවන් වන්නේ ඊට අවශ්‍ය සමගියක් ඒ ජාතිය තුළ තිබෙනවා නම් පමණයි. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නායකත්වය නිසා ඒ සිංහල ජනතාව අතර තිබිය යුතු ඒ සමගිය සහ එකමුතුකම අද නැති වී තිබෙනවා. එද සර්ව පාක්ෂික සමුළුව අවස්ථාවේදී සිංහල ජාතිය වශයෙන් අපට නැඟී ඉන්නට පුළුවන් වුණා නම්, අපේ ශක්තිය පෙන්වන්න පුළුවන් වුණා නම්, ඒ විරුද්ධවාදීන්ව, ඒ ත්‍රස්තවාදීන්ව මර්දනය කරන්නට අපට ඉඩ තිබුණා.

මුස්ලිම් ජාතිය, වෙනත් ජාතීන් මෙවැනි සටනකදී රජයට, තමන්ගේ මුළු ජාතියේම සහයෝගය දෙන අවස්ථාවකදී වැඩි පිරිස වන මේ රටේ පමණක් ජීවත්වන පිරිස වන, සිංහල ජාතියට මේ සටනේදී එක්සත් වන්නට ඉඩ නොදීම මහා අපරාධයක්. අන්න ඒ බව කවද හරි ඉතිහාස පොත්වල ලියැවෙයි. මේ රටේ ජනතාව හිතන්නේ තමුන්නාන්සේලා හිතන විධියට නොවෙයි. තමුන්නාන්සේලා හිතනවා ඇති "දැන් රජය අපකීර්තියට පත් වෙලා, දැන් ඡන්දයක් තිබ්බොත් අපට දිනන්න පුළුවන්" කියා. අන්න ඒ මතය තුළිනුයි තමුන්නාන්සේලා වැඩ කරන්නේ. අවාසනාවකට වගේ තමුන්නාන්සේලා ඇහුම්කන් දෙන්නේ තමුන්නාන්සේලා වටේ ඉන්න පිරිසට පමණයි. තමුන්නාන්සේලා වටේ ඉන්න, ඒ වළව්වලට යන්න එන්න වරම් ලත් උදවිය පමණයි ඔය තත්ත්වයෙන් තමුන්නාන්සේලාට අවවාද කරන්නේ. ඒ අය කියනවා ඇති, "අපොයි හාමු මහත්තයෝ, දැන් මේ මුළු රටටම ආණ්ඩුව එපා වෙලා, මැතිවරණයක් තිබ්බොත් අපි තමයි දිනන්නේ" කියලා. ඔය විධියට උපදෙස් දෙන උදවිය ඇති. නමුත් ගෙන්දගම් පොළොවේ පය ගහල ඉන්න අපි රටේ තත්ත්වය ගැන ඊට වඩා හොඳට දන්නවා.

තමුන්නාන්සේලාත් රට නොටේ ඇවිදල බලනවා නම් මීට වඩා හොඳ වාතාවරණයක් මේ රටේ ඇති වෙන්න පුළුවන් බව දැනගන්න පුළුවන් වෙයි. අපේ ආසනවලත් තමුන්නාන්සේලාගේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට අයත් මහත්වරුත් ඉන්නවා. සංවර්ධන සභා මන්ත්‍රීවරුත් ඉන්නවා. ඒ උදවිය අපි සහභාගි වෙන රැස්වීම්වලට සහභාගි වෙමින් කියන්නේ මොනවාද ? තමුන්නාන්සේලාගේ ප්‍රතිපත්තිය වැරදියි කියන එක ඒ උදවිය ප්‍රසිද්ධියේම කියල තිබෙනවා. දහම් පාසැල් රැස්වීම් වගේ ගම්බද පැවැත්වෙන රැස්වීම්වලදී ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ පුරෝගාමී සාමාජිකයින් අපට හමු වෙනවා. ඒ උදවිය, සමහර ආරම්භක සාමාජිකයින් — 1956 සිටම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ හිටියයි කියන සාමාජිකයින් — ඇවිත් කියන්නේ "අපේ නායකත්වය ගන්න ක්‍රියා මාර්ග වැරදියි කියන එක අපි පිළිගන්නවා" කියලයි. ඒ වචන ඒ උදවිය ප්‍රකාශ කර තිබෙනවා. ඒ නිසා තමුන්නාන්සේලා මේවගේ අවස්ථාවකදී තමුන්නාන්සේලා ගැන පමණක් හිතාගෙන වැඩ කළොත් තමුන්නාන්සේලා ගැන ඉතිහාසයේ ලියැවෙන්නේ හොඳ වැඩක් කළ ජාති හිතෛෂී පුද්ගලයන් හැටියට නොවෙයි කියන එක පමණක් කරුණාකර මතක තබා ගන්න.

අපි අතරේ සමගියක් නැහැ, අපිත් බෙදිල ඉන්නවයි කියන එක අපිත් දැන් මුළු ලෝකයටම පෙන්නලා ඉවරයි. සමහර විට තමුන්නාන්සේලා හිතනවා ඇති, තමුන්නාන්සේලාට අවස්ථාවක් ලැබෙයි කියා අපට වඩා වෙනස් දෙයක් කියන්න. වෙන දෙයක් ගැන කථා කරන්න ඕනෑ නැහැ. මාසයක් මාසයක් පාසා මේ පාර්ලිමේන්තුවේ පැවැත්වූ මේ විවාදයේදී තමුන්නාන්සේලා කරන ලද කථාවල් කියවා බලන්න. විපක්ෂයේ මන්ත්‍රීවරුන් විසින් කරන ලද කථා අරගෙන බැලුවොත් දකින්න ලැබෙන්නේ මොකක්ද ? ඒ එක් මන්ත්‍රීවරයෙක්වත් ත්‍රස්තවාදීන් කරන දේවල් හෙළා දකිමින් කථා කර තිබෙනවාද ? ත්‍රස්තවාදීන් අර දේ කළාය, මේ දේ කළාය, මිනීමැරුම් කර තිබෙනවාය, ගමකට ගිනි තබා තිබෙනවාය කියල ඒ ගැන ත්‍රස්තවාදීන්ට දොස් කියල තිබෙනවාද ?

**රිචඩ් පතිරණ මහතා**
**(திரு. றிச்சட் பத்திரன)**
(Mr. Richard Pathirana)

තමුන්නාන්සේ අපේ කථා කියෙව්වාද ?

**මෙරිල් කාරියවසම් මහතා**
**(திரு. மெரில் காரியவசம்)**
(Mr. Merril Kariyawasam)

ඔව්, අහලත් තියෙනවා, කියවලත් තියෙනවා.

**රිචඩ් පතිරණ මහතා**
**(திரு. றிச்சட் பத்திரன)**
(Mr. Richard Pathirana)

අපි ඒවා හෙළා දැකල නැද්ද ? බොරු කියන්නෙ.

**මෙරිල් කාරියවසම් මහතා**
**(திரு. மெரில் காரியவசம்)**
(Mr. Merril Kariyawasam)

තමුන්නාන්සේලා මෙතැනට ඇවිත් බණින්නෙ ත්‍රස්තවාදීන්ට නොවෙයි, ත්‍රස්තවාදීන්ට බණින්න හයයි.

**රිචඩ් පතිරණ මහතා**
**(திரு. றிச்சட் பத்திரன)**
(Mr. Richard Pathirana)

තමුන්නාන්සේලායි හය.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**මෙරිල් කාරියවසම් මහතා**
**(திரு. மெரில் காரியவசம்)**
(Mr. Merril Kariyawasam)

මෙතැනට ඇවිත් රජයට බණිනවා.

**රිචඩ් පතිරණ මහතා**
**(திரு. றிச்சட் பத்திரன)**
(Mr. Richard Pathirana)

බොරු කියන්න එපා.

**මෙරිල් කාරියවසම් මහතා**
**(திரு. மெரில் காரியவசம்)**
(Mr. Merril Kariyawasam)

තමුන්නාන්සේලා බණින්නෙ රජයටයි. අනුරාධපුරේ වෙඩි තිබ්බාය, වෙනත් තැනක නැත්නම් ඩොලර් පාර්ම් එකේ වෙඩි තිබ්බාය කියා ඇවිත් දොස් කියන්නෙ රජයටයි. එය හරියට අර කැලේ ඉන්න මුවත් ගොයම් කෑවාම ගෙදර තිබෙන මුව හමට තඩිබානවා වාගෙයි. තමුන්නාන්සේලා මාසයක් මාසයක් ගානේ ඇවිත් මොකක්ද කියන්නෙ ? මෙවැනි දේ ගැන කියන කොට දත් ලැජ්ජා හිතෙනවා ඇති. තමුත් තමුන්නාන්සේලා කළ කථාවල් හොඳට කියවලා බලන්න. මම හොඳට කියවා බැලුව නිසයි මම මෙහෙම කියන්නෙ. කිසිදක ත්‍රස්තවාදීන්ගේ ක්‍රියා හෙලා දකල නැහැ. කිසිදක ත්‍රස්තවාදීන්ට දොස් කියල නැහැ. කිසිදක ත්‍රස්තවාදීන් අමනුස්ස වැඩක් කළ බව කියල නැහැ.

**රිචඩ් පතිරණ මහතා**
**(திரு. றிச்சட் பத்திரன)**
(Mr. Richard Pathirana)

බොරු, බොරු.

**මෙරිල් කාරියවසම් මහතා**
**(திரு. மெரில் காரியவசம்)**
(Mr. Merril Kariyawasam)

හැමදාම මෙතැනට ඇවිත් කියන්නෙ ත්‍රස්තවාදීන් කරන වැඩවලට මේ රජය වගකිවයුතු බව පමණයි. හැමදාම කරන්නෙ කැලේ ඉන්න ගෝනු මොනව හරි කලාම ගෙදර තිබෙන ගෝන හමට බණිනවා වගේ රජයට දොස් කීම පමණයි. තමුන්නාන්සේලා එයින් එහාට කථා කර නැති බව මට භය නැතිව කියන්න පුළුවන්. තමුන්නාන්සේලා කළ කථාවල් ගැන තමුන්නාන්සේලාට ලැජ්ජා හිතෙන්නෙ සමහර විට තමුන්නාන්සේලා තව ටිකක් වයසට ගියාට පසුවයි. මේ ප්‍රශ්නය විසඳුණාම, ජාතියේ සමගිය නැවත ඇති වුණාම අනාගතයේදී තමුන්නාන්සේලා විසින්ම තමුන්නාන්සේලාට දොස් කියා ගනීවි. තමුන්නාන්සේලා කළ දේවල් ගැන තමුන්නාන්සේලාට එතකොට ලැජ්ජා හිතේවි. මම දන් අර විධියට කියන විට අක්මීමන ගරු මන්ත්‍රීතුමාට (රිචඩ් පතිරණ මහතා) ලැජ්ජා හිතුණා. ඔයිටත් වඩා ලැජ්ජා හිතෙන්නෙ තව ටිකක් නාකි වෙනකොටයි. මේ ප්‍රශ්නය විසඳුණාට පසු—

**රිචඩ් පතිරණ මහතා**
**(திரு. றிச்சட் பத்திரன)**
(Mr. Richard Pathirana)

වයසට ගියාම තමයි ප්‍රශ්නය විසඳන්න පුළුවන්. ඒව ඔප්පු වෙලා තිබෙනවා.

**මෙරිල් කාරියවසම් මහතා**
**(திரு. மெரில் காரியவசம்)**
(Mr. Merril Kariyawasam)

හුඟක් ලැජ්ජා හිතෙන විධියේ දේවල් තමයි තමුන්නාන්සේලා කරන්නෙ. තමුන්නාන්සේලාගේ පක්ෂයට වැහැරිච්ච නායකත්වයක් තිබෙනවා. ඒ නායකත්වය තමයි ජාතියට අවශ්‍ය වී තිබෙන්නෙ කියල තමුන්නාන්සේලා හිතනවා. පසුගිය කාලයේ බිත්තිවල ලියා තිබුණා. පෝස්ටර් ගහල තිබුණා. " යුගයේ අවශ්‍යතාවය, ඔබගේ නායකත්වය " කියල. තමුත් අද කොළඹ නගරයේ එක පෝස්ටරයක්වත් තිබෙනවාද කියල බලන්න.

**රිචඩ් පතිරණ මහතා**
**(திரு. றிச்சட் பத்திரன)**
(Mr. Richard Pathirana)

තමුන්නාන්සේලාගේ ගෝලයෝ දමල ගලවනවා නේ ?

**මෙරිල් කාරියවසම් මහතා**
**(திரு. மெரில் காரியவசம்)**
(Mr. Merril Kariyawasam)

නැහැ, කවුරුවත් ගලවන්නෙ නැහැ. ඔය පෝස්ටර් අලවලා දවස් තුනකට පසුව ගල්කිස්ස සුසාන භූමිය පසු කරල මම ගියා.

**රිචඩ් පතිරණ මහතා**
**(திரு. றிச்சட் பத்திரன)**
(Mr. Richard Pathirana)

ගෝලයෝ දමල තගස්ලා දමල පෝස්ටර් ගලවනවා නේ ?

**මෙරිල් කාරියවසම් මහතා**
**(திரு. மெரில் காரியவசம்)**
(Mr. Merril Kariyawasam)

නැහැ නැහැ, කවුරුවත් දේශපාලනය වශයෙන් නොවෙයි. ඒක කරන්නේ. හිතන්න එපා, යූ. එන්. පී. කාරයෝ කරනවාය කියා. හිතන්න එපා දේශපාලන වශයෙන් කරනවාය කියා. එද මම කළුතර ඉඳලා කොළඹ එන කොට ගල්කිස්සේ සුසාන භූමිය ඉදිරිපිට මම දක්කා, සිරිමා බණ්ඩාරනායක මැතිණියගේ ඡායාරූපක් එක්ක පෝස්ටර් හයක් ගහලා තිබුණා එක දිගට. " යුගයේ අවශ්‍යතාවය ඔබේ නායකත්වයයි " කියලා තිබුණු ඒ පෝස්ටර් යටින් මරණ දැන්වීම් දෙකක් ගහලා තිබුණා, " අනිච්චාවත සංඛාරා " කියලා. ජාතියේ ජනතාව තමුන්නාන්සේලා දිහා බලන්නේ එහෙමයි.

**රිචඩ් පතිරණ මහතා**
**(திரு. றிச்சட் பத்திரன)**
(Mr. Richard Pathirana)

සෝමපාල මැරිච්ච වෙලාවෙ ගහපු මරණ දැන්වීම්. [බාධා කිරීමක්]

**මෙරිල් කාරියවසම් මහතා**
**(திரு. மெரில் காரியவசம்)**
(Mr. Merril Kariyawasam)

ඔවා කියන කොට ලැජ්ජයි ; බොහොම අමාරුයි, කටුකයි. තමුත් ඔකයි ඇත්ත. තමුන්නාන්සේලා හිතන්න එපා කොළඹ නගරයේ පෝස්ටර් අලවන්නේ දේශපාලන නායකයෝය කියා. නැහැ. නගරයේ පෝස්ටර් ඇලවීමත් එක්තරා ව්‍යාපාරයක්. ගරු මැද කොළඹ දෙවන මන්ත්‍රීතුමා (ජබීර් ඒ කාදර් මහතා) තමුන්නාන්සේලාට කියා දේවි ඔය සිනමා දැන්වීම්, පෝස්ටර් අලවන්නේ කොහොමද කියා. මමත් ඒ දේ කළ නිසා මමත් ඒ ගැන දන්නවා. චිත්‍රපටියක් සිනමා ශාලාවක ප්‍රදර්ශනය කරන්න යනකොට පෝස්ටර් ඇලවීම භාර ගන්නා එක්තරා පිරිසක් ඉන්නවා. අන්න ඒ පිරිස් තමයි පෝස්ටර් අලවන්නේ. තමුන්නාන්සේලාගේ ඔය පෝස්ටර් ටික වහලා බයස්කෝප් පෝස්ටර් අලවලා ඒක වහලා දම්මේ, " ජාතියේ නායකත්වය යුගයේ අවශ්‍යතාවය, ඔබේ නායකත්වය නොවේය " කියා පෙන්වා දුන්නේ සාමාන්‍ය ජනතාවයි කියා මම තමුන්නාන්සේලාට කියනවා. එද පැහැදිලිව පෙන්වා දුන්නා, " යුගයේ අවශ්‍යතාවය ඔබේ නායකත්වය නොවේය " කියලා.

මම රජයේ අවධානය යොමු කරවනවා, මේ ගැන. ඇයි, මේ වගේ අවස්ථාවලදී, අපේ රට බිහිසුණු සටනකට මැදිවී සිටින අවස්ථාවකදී, රජයට යුතුකමක් තියෙනවා, රජයට අයිතියක් තියෙනවා. රටේ අනෙකුත් පළාත්වල සාමය සහ සමගිය ඇති කරගන්න. මේ වගේ අවස්ථාවකදී මැතිවරණයක් ඕනැය කියන කොට වෙනත් දේවල් කියන කොට, ඒ දේවල් කියන අය ජාති ද්‍රෝහීන් හැටියට සලකන විධියේ නීතියක් ඇතිකළ යුතුය කියා මම කල්පනා කරනවා.

පසුගිය දවස්වල ලන්ඩන් නුවර ත්‍රස්තවාදීන්ට, ඊලාම් වාදීන්ට, හවුල්වුණු දෙමළ තරුණයන් පිරිසක් සමඟ එකට බැනර් උස්සාගෙන ගිය වාසුදේව නානායක්කාර වගේ උදවිය ගැන මේ ජාතිය මොකක්ද කරන්නේ කියන එක අපි අහන්න ඕනැ. වාසුදේව නානායක්කාර මහත්මයාත් එක්ක නීති විද්‍යාලයේ, Voet Inn එකේ එක කාමරයේ අවුරුදු තුනහමාරක් හිටපු පුද්ගලයෙක් නිසා මම දන්නවා, ඒ මහත්මයා ගැන.

**රිචඩ් පතිරණ මහතා**
**(திரு. றிச்சட் பத்திரன)**
(Mr. Richard Pathirana)

වැරදි ආශ්‍රය !

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**මෙරිල් කාරියවසම් මහතා**
**(திரு. மெரில் காரியவசம்)**
(Mr. Merril Kariyawasam)

අපිට නියම ආශ්‍රයක් තිබුණා. ඒ නිසා අපි නියම පැත්තට ආවා. ඒ ගොල්ලෝ ආශ්‍රය කළේ තමුන්නාන්සේලාගේ උදවිය. ඒ නිසා වැරදි පැත්තට ගියා.

අද ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අය ප්‍රතිපත්ති ගැන කථා කරනවා. දැන් මුල්කිරිගලත් ගිහිල්ලා කථා කරන්නේ කවුද ? " රිපියුජීස් " ලා. නැත්නම් ඒ ඒ පැතිවල සිට ආපු උදවියයි. මේ රටේ මේ විධියේ බිහිසුණු තත්ත්වයක් තිබෙන අවස්ථාවේදී ත්‍රිකුණාමලය, වවුනියාව ආදී ප්‍රදේශවල ඉන්න සිංහල මිනිස්සු දකුණු පළාතට එන එකත්, දෙමළ මිනිස්සු උතුරටත් යන එක ඇත්ත. තමුන්නාන්සේයි මමයි ඒ පළාත්වල හිටියා නම් අපි දෙන්නත් ඒ වැඩේ කරනවා ; ආරක්ෂාව තිබෙන ස්ථානයක් කරා එනවා. දැන් මුල්කිරිගල ආසනයේ තමුන්නාන්සේලාට කවුද ඉන්නේ ? එක්සත් ජාතික පක්ෂයෙන් අතුගා දන කුණු ගොඩක් ඇද්ද, උදේට දමන කෙළ පහරක් වගේ අපි විසි කරන යමක් ඇද්ද, තමුන්නාන්සේලා ඔළුවේ තියා ගත්තේ ඕක නේද ? අපි තියනපාලව පැන්නුවා, තමුන්නාන්සේලා තියනපාලව ගත්තා. අපි සූරියප්පෙරුමව පැන්නුවා. තමුන්නාන්සේලා සූරියප්පෙරුමව ගත්තා. අද —

**රිචඩ් පතිරණ මහතා**
**(திரு. றிச்சட் பத்திரன)**
(Mr. Richard Pathirana)

ගරු මුදල් ඇමතිතුමා කවුද ? මුදල් ඇමතිතුමා කොහේ ඉඳලද ආවේ ?

**මෙරිල් කාරියවසම් මහතා**
**(திரு. மெரில் காரியவசம்)**
(Mr. Merril Kariyawasam)

අද තමුන්නාන්සේලාට බැරිවුණා, මුල්කිරිගල ආසනයේ තමුන්නාන්සේලාගේ අපේක්ෂකයාගේ නම යෝජනා කරන්න කෙනෙක්ව හොයාගන්න. අපි පන්නා දැමූ පැන්සිස්කු — පුරන්සිස්කු — ඇරෙන්න කවුද හිටියේ ? අපි නෙවිල් ප්‍රනාන්දුව පැන්නුවා. තමුන්නාන්සේලා ගත්තා ; ලොකු වුණා. එක්සත් ජාතික පක්ෂයට එපා වෙන්නේ මොකක්ද, එක්සත් ජාතික පක්ෂයේ කුණු බක්කියට වැටෙන්නේ මොකක්ද, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ එහෙම නැන්වලට යන්නේ අපේ කුණු බක්කියේ දන දේවල්. තමුන්නාන්සේලාගේ ප්‍රතිපත්තිය ඕකයි ? පසුගිය සභා රැස්වීමකදී මම ඇසුවා, අපේ නායකතුමා බැරිවෙලාවත් සිරිමා බණ්ඩාරනායක මැතිනියට සමාව දීලා එතුමියට සිවිල් අයිතිවාසිකම් ලැබුණොත් එතුමියට පාර්ලිමේන්තුවට ඒමට කොයි මන්ත්‍රීතුමා අයින්වෙලා පුටුව දෙනවාද කියා. අත්තනගල්ලේ ගරු මන්ත්‍රීතුමා (ලක්ෂ්මන් ජයකොඩි මහතා) ඊට පසුව ප්‍රකාශ කළා, එතුමා යනවාය කියලා. හොඳයි අපි ඒක පිළිගන්නවා. අපි හිතමු එතුමියට ප්‍රජා අයිතිවාසිකම් ලැබී අත්තනගතල්ලේ ගරු මන්ත්‍රීතුමා (ලක්ෂ්මන් ජයකොඩි මහතා) ආසනයෙන් අයින් වී අත්තනගල්ල ආසනය බණ්ඩාරනායක මැතිනියට දුන්නාය කියා. අපි අහනව ප්‍රශ්නයක් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන්. එතුමියට උරුමයක් තියෙනවද, අයිතිවාසිකමක් තියෙනවද " විට් " එකෙන් ඇවිත් මේ පාර්ලිමේන්තුවේ වාඩි වෙන්න ? අපි අභියෝග කරනවා සිරිමා බණ්ඩාරනායක මැතිනියට. [බාධා කිරීම්] ආණ්ඩුවක් පිහිටුවන්න එතුමියට ඔය තරම් රුදවක් තියෙනව නම් මැතිවරණ ඉල්ලන්න ඔය තරම් ආසාවක් එතුමියට තියෙනව නම් අතුරු මැතිවරණවලට ඉදිරිපත් වෙන්න. ඉදිරිපත් වෙලා අඩු ගණනේ ඡන්ද දිනලා [බාධා කිරීම්] මෙහාට එන්න කියල අපි අභියෝග කරනවා. අත්තනගල්ලේ වර්තමාන මන්ත්‍රීතුමා ඒ ආසනයෙන් අස්වුණොත් හේම ඒ ආසනයට එන්න බණ්ඩාරනායක මැතිනියට උරුමයක් අයිතිවාසිකමක් තිබෙනවාද කියල අපි බලමු. [බාධා කිරීමක්]

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
(Mr. Lakshman Jayakody)

මම මෙතැන නැති වෙලාවෙ ගරු මන්ත්‍රීතුමා මොකක්ද කිව්වේ ? (බාධා කිරීම්)

**මෙරිල් කාරියවසම් මහතා**
**(திரு. மெரில் காரியவசம்)**
(Mr. Merril Kariyawasam)

නැ තමුන්නාන්සේ. . . . . .

**නියෝජ්‍ය කථානායකතුමා**
**(பிரதிச் சபாநாயகர் அவர்கள்)**
(Mr. Deputy Speaker)

Order, please ! Two more minutes.

**මෙරිල් කාරියවසම් මහතා**
**(திரு. மெரில் காரியவசம்)**
(Mr. Merril Kariyawasam)

I will not take more than that.

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
(Mr. Lakshman Jayakody)

The day she gets her civic rights, the very moment, I will resign.

**නියෝජ්‍ය කථානායකතුමා**
**(பிரதிச் சபாநாயகர் அவர்கள்)**
(Mr. Deputy Speaker)

Order, please ! Hon. Member for Attanagalla you can answer in your reply.

**මෙරිල් කාරියවසම් මහතා**
**(திரு. மெரில் காரியவசம்)**
(Mr. Merril Kariyawasam)

මම ඊළඟට අහන්නේ තමුන්නාන්සේ අයින් වුණාට පස්සේ සිරිමා බණ්ඩාරනායක මැතිනියට අයිතියක් තිබෙනවාද ඔය පුටුවට ඇවිත් වාඩි වෙන්න මහජන මැතිවරණයකට අතුරු මැතිවරණයකට ඉදිරිපත් නොවී ?

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
(Mr. Lakshman Jayakody)

සම්පූර්ණ අයිතියක් තියෙනව. මම පත් වී ආවෙ වැඩ බලන්න විතරයි. (බාධා කිරීම්)

**මෙරිල් කාරියවසම් මහතා**
**(திரு. மெரில் காரியவசம்)**
(Mr. Merril Kariyawasam)

අපි බලමු ගරු නියෝජ්‍ය කථානායකතුමනි. (බාධා කිරීම්)

**නියෝජ්‍ය කථානායකතුමා**
**(பிரதிச் சபாநாயகர் அவர்கள்)**
(Mr. Deputy Speaker)

Order, please !

**මෙරිල් කාරියවසම් මහතා**
**(திரு. மெரில் காரியவசம்)**
(Mr. Merril Kariyawasam)

තමුන්නාන්සේ " ඇක්ටිං " හැටියට . . . . .

**වීරසිංහ මල්ලිමාරච්චි මහතා (කොළඹ දිසා ඇමතිතුමා)**
**(திரு. வீரசிங்ஹ மல்லிமாரச்சி — கொழும்பு மாவட்ட அமைச்சர்)**
(Mr. Weerasinghe Mallimaratchi-District Minister, Colombo)

මොනවටද " ඇක්ටිං ?"

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
(Mr. Lakshman Jayakody)

Not the way you act for others. I will tell how you act for others.

**මෙරිල් කාරියවසම් මහතා**
**(திரு. மெரில் காரியவசம்)**
(Mr. Merril Kariyawasam)

I was disturbed, may I be given two or three minutes more.

අත්තනගල්ලේ මන්ත්‍රීතුමා අස් වුණත් සිරිමා බණ්ඩාරනායක මැතිණියට අයිතියක් තියෙනවද ඇවිත් ඔය පුටුවේ වාඩි වෙන්න ? අපි බලමු 1947 සිට අත්තනගල්ලේ ප්‍රතිඵල. 1947 දී එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මහත්මය අපේ පක්ෂයෙන් ඇවිත් අත්තනගල්ලේ ඡන්දවලින් සියයට 86ක් ගත්තා. 1952 දී එතුමා සියයට 85 ක් ගත්තා. 1956 බණ්ඩාරණායක මහත්මයා සියයට 91ක් ගත්තා. ඊට පස්සේ ජේ. පී. ඔබේසේකර මහත්මයා සියයට 81ක් ගත්තා. 1960 ශ්‍රී ලංකා නිදහස් පක්ෂය පැරදුණු වෙලාවෙත් ජේ. පී. ඔබේසේකර මහත්මයා සියයට 71ක් ගත්තා. ඊට පස්සේ බණ්ඩාරනායක මහත්මිය 1965 දී ඇවිත් කීයද ගත්තෙ ? සියයට 58 යි. සියයට 58 ක් පමණයි ගත්තෙ.

**මන්ත්‍රීවරයෙක්**
**(அங்கத்தவர் ஒருவர்)**
(A Member)
ඔය හදිසි නීතිය ගැනද කතා කරන්නෙ ?

**මෙරිල් කාරියවසම් මහතා**
**(திரு. மெரில் காரியவசம்)**
(Mr. Merril Kariyawasam)
ඔව් මේව කතා කරත කොට රිදෙනවා. මම දන්නව ඒක. ඊට පස්සෙ ජනාධිපති වරණයේදී. . . . . [බාධා කිරීම්]

**රිචඩ් පතිරණ මහතා**
**(திரு. றிச்சட் பத்திரன)**
(Mr. Richard Pathirana)
සෝමපාලට මොකද වුණේ ?

**වීරසිංහ මල්ලිමාරච්චි මහතා**
**(திரு. வீரசிங்ஹ மல்லிமாரச்சி)**
(Mr. Weerasinghe Mallimarachchi)
මැරුණා.

**රිචඩ් පතිරණ මහතා**
**(திரு. றிச்சட் பத்திரன)**
(Mr. Richard Pathirana)
මැරුණ නෙමෙයි. මැරුවා.

**මෙරිල් කාරියවසම් මහතා**
**(திரு. மெரில் காரியவசம்)**
(Mr. Merril Kariyawasam)
ඒ ගොල්ලො කවද හරි නිවන් දකියි [බාධා කිරීම්] ඔය සෝමපාලලා දඹරාවේ හාමුදුරුවො ඒවගේ උදවිය. They have attained nirvana. Please let them jest in peace. ඒක නෙමෙයි අපි කතා කරන්නෙ. අත්තනගල්ලේ මන්ත්‍රීතුමා බැරි ලොවත් ඔය ආසනයෙන් නැගිට ගියොත් බණ්ඩාරනායක මැතිනියට ඔය පුටුවේ වාඩි වෙන්න උරුමයක් අයිතියක් නැහැ. මොකද ? ජනමතවිචාරණයේදී ඔය ආසනයේ ජනතාව සියයට 66 ක් කියා සිටිය මේ රජය තවදුරටත් පවත්වාගෙන යා යුතුයි කියල. එමනිසා ඔය පුටුව අයිති නැහැ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට. අපි අභියෝග කරනව සිරිමා බණ්ඩාරනායක මැතිනියට කොහාට හරි ඇවිත් ආසනයක් දිනල අතුරු මැතිවරණයක් දිනලා මහා මැතිවරණයක් ඉල්ලලන්නය කියල. එතුමිය ඔප්පු කරන්න ඕනැ අඩු වශයෙන් මේ ලංකාවේ කොහේ හරි ආසනයක් එතුමියට දිනන්න පුළුවන් කියලා. අපි දන්නවා [බාධා කිරීමක්]

**නියෝජ්‍ය කථානායකතුමා**
**(பிரதிச் சபாநாயகர் அவர்கள்)**
(Mr. Deputy Speaker)
Order, please ! I must control this Debate.

**මෙරිල් කාරියවසම් මහතා**
**(திரு. மெரில் காரியவசம்)**
(Mr. Merril Kariyawasam)
I will not take long.

මම තමුන්නාන්සේට ස්තූතිවන්ත වෙනව මට මේ කාලය දීම ගැන. මම දැන් කතාව අවසාන කරනවා. ඇත්ත වශයෙන්ම ජාතිය අතවරයකට මුහුණ පා තිබෙන මේ අවස්ථාවේ දී ජාතියේ සමගිය භේද කරන අන්දමට ක්‍රියා කරන හැම කෙනෙක්ම හෙළා දකිමින් කවද හරි ශ්‍රී ලංකා නිදහස් පක්ෂය දේශ ද්‍රෝහීන් වශයෙන් මේ රටේ ඉතිහාසයේ [බාධා කිරීම්]

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
(Mr. Lakshman Jayakody)

**නැගී සිටියේය–**
**எழுந்தார்.**
***rose.***

**නියෝජ්‍ය කථානායකතුමා**
**(பிரதிச் சபாநாயகர் அவர்கள்)**
(Mr. Deputy Speaker)
You can reply. You are the Acting Leader of the Opposition.

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
(Mr. Lakshman Jayakody)
I know, Sir, but this is a very serious charge. – [*Interruption]*

**නියෝජ්‍ය කථානායකතුමා**
**(பிரதிச் சபாநாயகர் அவர்கள்)**
(Mr. Deputy Speaker)
Order, please ! You can reply when you are speaking.

**මෙරිල් කාරියවසම් මහතා**
**(திரு. மெரில் காரியவசம்)**
(Mr. Merril Kariyawasam)
I make hat charge with a full sense of responsibility. – [*Interruption]*. I charge that the SLFP's attitude is anti-national. I repeat it.

**නියෝජ්‍ය කථානායකතුමා**
**(பிரதிச் சபாநாயகர் அவர்கள்)**
(Mr. Deputy Speaker)
You need not repeat it.

**මෙරිල් කාරියවසම් මහතා**
**(திரு. மெரில் காரியவசம்)**
(Mr. Merril Kariyawasam)
I say that the attitude of the SLFP today is anti-national. I repeat it. I say that with a full sense of responsibility.

අමරසිරි දොඩන්ගොඩ මහතා (බද්දේගම)
(திரு. அமரசிறி தொடங்கொட — பத்தேகம)
(Mr. Amarasiri Dodangoda–Baddegama)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හදිසි නීතිය දීර්ඝ කිරීම පිළිබඳ මේ විවාදයේදී මට කතා කිරීමට අවස්ථාව ලබා දීම ගැන තමුන්නාන්සේට ස්තූතිවන්ත වෙනවා. අගලවත්තේ ගරු මන්ත්‍රීතුමා (මෙරිල් කාරියවසම් මහතා) තම අදහස් ප්‍රකාශ කළාට පස්සේ – ඒ අදහස් බොහොමයක් මේ හදිසි නීති විවාදයට අදාළ නොවුණත් – ඒ කරුණු පිළිබඳව ප්‍රථමයෙන් මගේ අදහස් ප්‍රකාශ කරන්න කැමතියි. පසුගියද පැවැත්වුණු ස්වා වතිනා ඒකකයේ සාංවත්සරික මහා සභා රැස්වීමේදී මේ ජන වාර්ගික ප්‍රශ්නය වරද්ද ගත් හැටි, මුල වැරදුණු හැටි එතුමා ප්‍රකාශ කළා. එවකට පාර්ලිමේන්තුවේ මහ ලේකම්ව සිටි සැම් විජේසිංහ මහතා විරුද්ධ පාර්ශ්වයේ නායකත්වය පැවරීම පිළිබඳව ඉදිරිපත් කළ අදහස ප්‍රතික්ෂේප කරමින් ඒ තනතුර දුන්නා, අමිර්තලිංගම් මහත්මයාට. එය වරදක්ය කියන්නේ මම නොවෙයි, තමුන්නාන්සේලාගේම විධායක ජනාධිපතිතුමායි. අමිර්තලිංගම් මහතා විරුද්ධ පාර්ශ්වයේ නායකකම අරගෙන ඒ තනතුරු විශේෂ වරප්‍රසාද පාවිච්චි කරමින් මුළු ලෝකය පුරා සවාරි ගියා ; තමන්ගේ ඊලාම් මතය ඒ ඒ රටවලදී දැඩිව ප්‍රචාරය කළා. අමිර්තලිංගම් මහතාට විරුද්ධ පාර්ශ්වයේ නායකකම ලැබීමේ හේතුවෙනුයි, වෙනම ද්‍රවිඩ රාජ්‍යයක් ඉල්ලීමේ එතුමන්ලාගේ පක්ෂයේ මතය රට-රටවල් පුරා පතුරුවා හරින්නට පහසුකම් සැලසුණේ. ඒ නිසයි, ජනාධිපතිතුමා අර විධියේ ප්‍රකාශයක් කළේ. ඒ අවස්ථාවේදී වැරැද්දක් සිදු වුණාය කියා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[අමරසිරි දොඩන්ගොඩ මහතා]

විරුද්ධ පාර්ශ්වයේ නායකකම අමිර්තලිංගම් මහත්මයාට පැවරීමත්, මැතිනියගේ ප්‍රජා අයිතිය අහෝසි කරනු ලැබීමත් මේ ප්‍රශ්නයේ වර්තමාන උග්‍ර තත්ත්වයට හේතු වී තිබෙනවා. අගලවත්තේ ගරු මන්ත්‍රීතුමා (මෙරිල් කාරියවසම් මහතා) මොන විධියේ අදහස් ප්‍රකාශ කළත් මුලදී තමා හිතූ විධිය වැරදි බව ජනාධිපතිතුමාම පිළිගෙන තිබෙනවා.

මේ ප්‍රශ්නය පිළිබඳව අපි හැමදමත් විවාද කරනවා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය මේ රට බෙදනවාට කැමැති පක්ෂයක් යයි ආණ්ඩු පක්ෂය කියනවා. නමුත් මේ රටේ ඒකීයභාවය රැක ගැනීමටයි, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය හැමදමත් කටයුතු කරන්නේ ; සහාය දෙන්නේ. අපේ රට කුඩා කැබැලිවලට කඩා — බෙදා දමන්න අපි කැමැති නැහැ.

මාසයක් පාසා හදිසි නීතිය දීර්ඝ කිරීමට සිදු වන්නේ ඇයිද කියන ප්‍රශ්නය කෙරෙහි අපි සැලකිලිමත් වන්න ඕනෑ. එයින් තේරෙන්නේ මේ ප්‍රශ්නය ඉවර වන්නේ නැති බව නේද ? මේ ප්‍රශ්නය ඉවර නොවන්නේ ඇයි ? අද පවතින තත්ත්වය යටතේ දහස් ගණන් ජනතාවට තමන්ගේ ගම් — බිම්, ගෙවල් — දොරවල්, අවුරුදු තිහ — හතළිහක කාලයක් භුක්ති වින්ද දේපොළ අහිමි වී ගොස් තිබෙනවා. ඒ ප්‍රදේශවල සිංහල ජනතාව තමන්ගේ සියලු දේවල් අතහැර දමා සිය අත දරුවනුත් වඩාගෙන දකුණට පලා එනවා. ඒ අනාථයන් ඉතාම කනගාටුදායක ආකාරයට කඳවුරුවල ජීවත් වන්නේ මොන වරදක් කළාටද ? ඒ අනාථයන්ගෙන් සමහර අයට විශාල වශයෙන් දේපළ, මිල — මුදල් තිබුණා. සමහරුන්ට නම් ඒ තරම් වත්කමක් තිබුණේ නැහැ. කොහොම නමුත් මේ තත්ත්වය එන්න — එන්නම උග්‍ර වෙනවා. මාස්පතා හදිසි නීතිය දීර්ඝ කරන්න සිදු වන්නේ මේ තත්ත්වය පවතින නිසා නේද ? ඒ නිසා අප කරන කථාවලදී මේ ප්‍රශ්නයට දිය හැකි විසඳුමක් දීම කෙරෙහි අපේ අවධානය යොමු වෙන්න ඕනෑ.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂය කිසිසේත්ම දෙකඩ වුණු රාජ්‍යයකට, රට බෙදීමකට සහාය නොදෙන බව මේ අවස්ථාවේදී නැවතත් අවධාරණයෙන් ප්‍රකාශ කරන්න කැමැතියි. ඒ අතර රජය පසුගිය වකවානුවේදී ගෙන තිබෙන ක්‍රියාමාර්ග දෙස බලන විට ඒ හැම එකක්ම අසාර්ථක වී තිබෙන බව පෙනෙනවා. මේ විධියට හදිසි නීතිය මාස්පතා දීර්ඝ කිරීමේ තේරුම ඒකයි. රජය ගෙන තිබෙන පියවරවල් සාර්ථක වුණා නම් මේ හදිසි නීතිය දීර්ඝ කිරීමේ අවශ්‍යතාවයක් මතු වන්නේ නැහැ.

උදාහරණයක් වශයෙන්, අගලවත්තේ ගරු මන්ත්‍රීතුමාගේ ප්‍රකාශයක් ගෙන හැර දක්වන්නම්. එතුමා සිංහල සමගියක් පිළිබඳව කථා කළා ; සිංහලයන් එකතු වී ඉන්නවා නම් මේ ප්‍රශ්නය විසඳන්න පුළුවන්ය කිවා. සිංහලයන් එකතු වෙලා තමයි, හයෙන් පහක බලයක් සහිතව මේ රජය පත් කර ගත්තේ. එසේ බලයට පත් වුණු මේ රජය අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්මත කරගෙන තමන්ගේ බලය තහවුරු කරගෙන තිබෙනවා. මේ ජන වාර්ගික ප්‍රශ්නය සම්බන්ධයෙන් සිංහලයන් කළ හානිය මොකක්ද ?

මේ ප්‍රශ්නය සිංහල — දෙමළ ප්‍රශ්නයක්, ජාතිවාදී ප්‍රශ්නයක් බවට පත් කරන්න — පත් කරන්න එය විසඳීම වඩාත් අමාරු වෙනවා. එහිලා එක උදාහරණයක් දෙන්නම්. ටික කලකට උඩදී රජයේ යෝජනාවක් තිබුණා, එක ආසනයකින් සිංහලයන් 250 බැගින් තෝරා ගෙන ඔවුන් උතුරේ — 'බවුන්ඩ්‍රියේ ' —පදිංචි කරවන්න, තුවක්කුත් දීලා. සටන් නවතින ක්‍රමයක්ද, ඒ ? එක පැත්තකින් තුවක්කු දීලා සිංහලයන් ඒ ප්‍රදේශයේ පදිංචි කරවනවා. අනෙක් පැත්තෙන් දෙමළ මිනිසුන් සිංහලයන්ට වෙඩි තියනවා. ඒක සටන් නතර කිරීමේ නොව සටන් දික් ගැස්සීමේ ක්‍රමයක් බව කියන්න ඕනෑ. ජාතිවාදය මතු කිරීමෙන් මේ ප්‍රශ්නය විසඳන්න බැහැ. ජාතිවාදය මතු කරන්න — මතු කරන්න —

**වීරවන්නි සමරවීර මහතා (නියෝජ්‍ය අධ්‍යාපන ඇමතිතුමා)**
**(திரு. வீரவன்னி சமரவீர — கல்விப் பிரதி அமைச்சர்)**
(Mr. Weerawanni Samaraweera–Deputy Minister of Education)

1956 දී නමුත්නාත්සේලාමයි, ඒක මතු කළේ.

**අමරසිරි දොඩන්ගොඩ මහතා**
**(திரு. அமரசிறி தொடங்கொட)**
(Mr. Amarasiri Dodangoda)

දැන් මොහොතකට කලින් අගලවත්තේ ගරු මන්ත්‍රීතුමා කථා කළ විධිය අමතකද ?

**අනුර බණ්ඩාරනායක මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
**(திரு. அனுர பண்டாரநாயக்க — எதிர்க்கட்சி முதல்வர்)**
(Mr. Anura Bandaranaike–(Leader of the Opposition)

ලංකාවේ සිතියමක් ඇඳලා එහි යම් — යම් කොටස් රතු පාටින් දමලා ඒවා දෙමළ අයට දෙනවායයි කියමින් රට පුරා ඇවිදිමින් කෑ ගැහුවේ අපිද ? නැහැ, නමුත්නාත්සේලාගේ අතිගරු ජේ. ආර්. ජයවර්ධන ජනාධිපතිතුමායි.

**වීරවන්නි සමරවීර මහතා**
**(திரு. வீரவன்னி சமரவீர)**
(Mr. Weerawanni Samaraweera)

රාජරත්න.

**අමරසිරි දොඩන්ගොඩ මහතා**
**(திரு. அமரசிறி தொடங்கொட)**
(Mr. Amarasiri Dodangoda)

රාජරත්නත් නමුත්නාත්සේලාගේ පැත්තේ. [බාධා කිරීමක්]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඇත්ත වශයෙන්ම ද්‍රවිඩ පිරිස් ඉල්ලන්නේ — [බාධා කිරීමක්]

**අනුර බණ්ඩාරනායක මහතා**
**(திரு. அனுர பண்டாரநாயக்க)**
(Mr. Anura Bandaranaike)

නමුත්නාත්සේලාගේ මන්ත්‍රීතුමත් අපේ පැත්තෙ නේ ? නමුත්නාත්සේ මේ මොනවද කියන්නේ ? අවුරුදු 17 ක් සංවිධායකතුමා අපේ වේදිකාවේ !

**අමරසිරි දොඩන්ගොඩ මහතා**
**(திரு. அமரசிறி தொடங்கொட)**
(Mr. Amarasiri Dodangoda)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ද්‍රවිඩ පිරිස් සාකච්ඡාවලට ගියත්, අද ඒ අයගෙ ඉල්ලීම මොකක්ද ? වෙනම රාජ්‍යයක්. ද්‍රවිඩ පිරිස් ඉල්ලා සිටිනවා වෙනම රාජ්‍යයක්. අපි වෙනම රාජ්‍යයක් දෙන්නෙ නැහැ. මොකක්ද ඉතින් සාකච්ඡා කරන්නෙ ? මොනවද අපි සාකච්ඡා කරන්නේ ? අපි වෙනම රාජ්‍යයකට විරුද්ධයි, ඒගොල්ලො වෙනම රාජ්‍යයක් දෙනතුරු පසුබසින්නේ නැහැ. ඉතින් සාකච්ඡාවලදී මොනවද කරන්නෙ ? තත්ත්වය මේකයි. ලෝකයේ කිසිම රටක මේ ප්‍රශ්නය විසඳී නැහැ. මේ ප්‍රශ්නය විසඳී තිබෙන්නේ පෞද්ගලික අයිතිය අහෝසි කළ තැන්වල පමණයි, ඒ රටවල පමණයි. මම මීට පෙර වතාවකත් කිව්වා ; ඉඩම් ප්‍රශ්නය මත දැන් උතුරේත්, නැගෙනහිරත්, ප්‍රශ්න. මේ රටේ ඉඩම් අයිතිය පිළිබඳ ප්‍රශ්නයක් නැත්නම්, කිසිවකුටත් හිමි ඉඩම් නැත්නම්, මේ ප්‍රශ්නය පැන නගින්නෙ නැහැ. නමුත් නමුත්නාත්සේලාගේ රජයේ ප්‍රතිපත්තිය අනුව ඒක නැති කරන්න බැහැ. ද්‍රවිඩ මිනිසුන්ට ඉඩම් තිබෙවා, සිංහල මිනිසුන්ටත් ඉඩම් තිබෙනවා. එවිට තමයි මේ මායිමක් ඇති වෙන්නෙ.

**වීරසිංහ මල්ලිමාරච්චි මහතා**
**(திரு. வீரசிங்ஹ மல்லிமாரச்சி)**
(Mr. Weerasinghe Mallimarachchi)

නමුත්නාත්සේලාගේ ප්‍රතිපත්තිය මොකක්ද මේ ඉඩම් ගැන ?

**අමරසිරි දොඩන්ගොඩ මහතා**
**(திரு. அமரசிறி தொடங்கொட)**
(Mr. Amarasiri Dodangoda)

ඉඩම් ගැන නොවෙයි, මේ ප්‍රශ්නයට දියයුතු උත්තරය ගැනයි මම කියන්නෙ. අපේ පක්ෂය රට බෙදීමට විරුද්ධයි. අපි උත්තරයක් සොයනවා. නමුත්නාත්සේලා බලයේ සිටින පක්ෂය මේ ප්‍රශ්නයට උත්තරයක් සොයන්න ඕනෑ. ඒ නිසා අපි ඒකට සහාය දෙන්න කැමතියි. ඒකයි මේ අදහස දක්වන්නෙ. [බාධා කිරීමක්]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම සඳහන් කරන්නට කැමතියි තවත් කරුණක්. දැන් මේ ප්‍රශ්නය පිළිබඳව අපි ප්‍රවේශමෙන් බලා, ඒ සම්බන්ධයෙන් ආණ්ඩුව ගත් පියවරවල් ගැන ආපසු හැරී බලමු. ඒවා විසඳූ හැටි බලමු. දැන් අළුතෙන්ම තිබෙනවා ගරු අගමැතිතුමාගේ යෝජනා. අළුත් පාලන ක්‍රමයක්. 'ග්‍රාම ජනාධිපති ' ඒක තමයි අළුත්ම ක්‍රමය. පරිපාලන ඒකක 200 ක මහජන ඡන්දයෙන් නියෝජිතයන් ' මේක ' දවස ' පත්‍රයේත්, ' දිවයින '

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පත්‍රයේත් තිබෙනවා. ඒක තමයි අළුත්ම යෝජනාව. ඉස්සරවෙලා ග්‍රාමාරක්ෂක කියා කොටසක් පත් කළා. ඒ අය තුවක්කු අරගෙන ඒ අයගෙ තරහකාරයින්ට වෙඩි තියන්නට පටන්ගත්තා. සිංහල ජනපද පිහිටුවන්නටය කියා එක් ආසනයකින් 250 ක් බැගින් තෝරා ගත්තා. ඒක සම්පූර්ණයෙන්ම ඇද වැටුණා. ඇත්ත වශයෙන්ම මේ ගත් පියවරවල් එක එක අරගෙන බැලුවොත් හැම එකක්ම ඇද වැටුණු බව පේනවා. ඒක නිසයි මේ හදිසි නීතිය දීර්ඝ කිරීමට අපට සිද්ධවෙලා තිබෙන්නෙ. ඒවායින් විසඳුමක් ලැබුණා නම් මේ හදිසි නීතිය දීර්ඝ කරන්නට වුවමනා නැහැ. ඒ වාගේම මම සඳහන් කරන්නට කැමතියි මේ තත්ත්වය ඇතිවුණේ ද්‍රවිඩ ප්‍රශ්නය ජන වාර්ගික ප්‍රශ්නයක් කර මේ ජාතීන් දෙක අතර සමගිය ඇති කිරීමට ආණ්ඩුව ගත් පියවරවල් අසාර්ථකවූ නිසා බව. ඒ පියවරවල් බොහෝවිට මේ ප්‍රශ්නය උග්‍රවීමට හේතුවුණා. මම මීට පෙරත් ඉදිරිපත් කළා මේ උදාහරණය.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මිනිසුන් වශයෙන් බැලුවොත් සිරගෙදර සිරකරුවන් ප්‍රමාණයක් මරා දැම්මා. ඒකට උත්තරයක් එහෙන් දුන්නා, ඩොලර් f ාම්වල තවත් ගණනක් මරල. මේ දෙපැත්ත ගැන අපි කතා කරන විට තමුන්නාන්සේලා කල්පනා කරනවා අපි මේ කරන්නේ ත්‍රස්තවාදයට උදව් දීමක්ය කියා. නමුත් මෙහි යථාර්ථය අපි තේරුම් ගන්නට නම්, ද්‍රවිඩ පිරිස්වලට වෙන හානියත්, සිංහල පිරිස්වලට වන හානියත් ගැන අපි සැලකිලිමත්විය යුතුයි. අද උතුර - නැගෙනහිර මායිම්වල මැරෙන මිනිස්සුන්, ඒ ප්‍රදේශ හැර දමා පලා යන මිනිස්සුන් ඒ දුක් වේදනා විඳින්නේ මේ ප්‍රශ්නය විසඳීමේ රජයේ තිබෙන අසාර්ථකත්වය නිසයි. ඒ නිසා අපි මතක් කරනවා රජය යම් පියවරක් ගන්නා විට, ඒ පියවර වැරදුණොත් එහි ප්‍රතිඵල භුක්ති විඳින්නට සිදුවන්නේ ජනතාවට කියා. ඒ නිසා ජනතාව පුළුවන්තරම් දුරට බලාපොරොත්තුවෙනවා ඊළඟ පියවර ගැන. මිනිස්සු බොහොම උනන්දුයි 'තිම්පු ' කතා ගැන. මිනිස්සු බොහොම උනන්දුවෙන් සිටියා ' සර්ව පාක්ෂික සමුළුව ' ගැන. මිනිස්සු බොහොම උනන්දුවෙන් සිටියා ' සර්ව ආගමික සමුළුව ' ගැන. තමුන්නාන්සේලා ඒ හැම අත්හදබැලීමක්ම කරන අතරේ උතුරේත් නැගෙනහිරත් මායිම්වල සාමාන්‍ය මිනිස්සු මැරුණා. ඒ නිසා අපි තමුන්නාන්සේලාට පෙන්වා දෙන්නට කැමතියි, මේ ප්‍රවෘත්ති පත්‍රවලින් ප්‍රකාශයට පත් කරන, රජය ගන්න ලැස්තිවෙන පියවරවල් ගැන හොඳට කල්පනා කර, ඒවායින් ලැබෙන ප්‍රතිඵල ගැන නෙව ඒවායේ ප්‍රතිඵලවලින් ලැබෙන ප්‍රතිඵල ගැන, කල්පනා කර ඒවා ගතයුතු බව. දහස් ගණනක් දිනපතා අනාථ භාවයට පත්වෙනවා.

සිංහලයන් ලක්ෂයක් උතුරේ පදිංචි කරවන්නටයි බලාපොරොත්තු වුණේ. අද ලක්ෂයක් පැනලා ඇවිදින් අනාථ වෙලා. එහි අනික් පැත්තයි සිදු වී තිබෙන්නේ. ඒ නිසා සැහෙන දුරට තමුන්නාන්සේලා ගන්නා පියවරවලින් බලාපොරොත්තු වන දේවල්, කියන දේවල් නොවෙයි සිදු වෙන්නේ. අලුත් පාලන ක්‍රමයක් පිළිබඳ අදහස් අදත් යෝජනා කර තිබෙනවා. නමුත් තිම්පු කථාවලට ගෙනහිත් තිබෙන යෝජනා මොනවාද ? ඒ යෝජනාවලින් කියන්නේ සිරිමා - ශාස්ත්‍රී ගිවිසුම අහෝසි කර ඒ වෙනුවට ද්‍රවිඩ වතු කම්කරු පවුල්වලට මෙහෙත් යවන්නට බලාපොරොත්තු වුණ පිරිසටත් මෙහි පුරවැසිකම් දෙන්නයි. ඒ එක යෝජනාවක්. ඒ වාගේම තවත් යෝජනාවක් තමයි, හමුදා බලය නැතිව සෙසු බලතල පැවරූ ප්‍රාන්ත රාජ්‍යයක්. දැන් මේ ප්‍රාන්ත රාජ්‍යයක් කිරීමේ අදහස උතුරට විතරක් දීලා බැහැ. මුළු රටටම වෙන වෙනම ප්‍රාන්ත රාජ්‍යයන් දෙන්නට සිදු වෙනවා. [බාධා කිරීමක්] මේවා තමයි යෝජනා. මේවාද මේ ගෙනිහිත් තිබෙන යෝජනා කියලයි අපි අහන්නේ. [බාධා කිරීමක්] මේවා තමයි, තිම්පු සාකච්ඡාවලට ගෙනිහිත් ගිය සුමානේ සාකච්ඡා කළ යෝජනා.

**මන්ත්‍රීවරයෙක්**
**(அங்கத்தவர் ஒருவர்)**
(A Member)
කාගේ යෝජනාද ?

**අමරසිරි දොඩන්ගොඩ මහතා**
**(திரு. அமரசிறி தொடங்கொட)**
(Mr. Amarasiri Dodangoda)
තමුන්නාන්සේලාගේ යෝජනා. ආණ්ඩුවේ යෝජනා. ඒ විතරක් නොවෙයි. ඒ ප්‍රදේශයේ ඉඩම් අයිතිය පිළිබඳව තීරණය කරන්නේ ඒ රාජ්‍යයයි. සිංහල මුස්ලිම් දෙගොල්ලන්ටම ඒ ප්‍රදේශයේ ජීවත් වෙන්නට පුළුවන්. නමුත් ඉඩම් අයිතිය තීරණය කරන්නේ ඒ රාජ්‍යයයි. මේ යෝජනාවලටත් ත්‍රස්තවාදී කොටස් එකඟ නැහැ. ඒ උදවිය ඉල්ලන්නේ බවුන්ඩරිය ශුද්ධ කර ගත් වෙනමම ආණ්ඩුවක්.

**මන්ත්‍රීවරයෙක්**
**(அங்கத்தவர் ஒருவர்)**
(A Member)
අපි ඒක දෙන්නේ නැහැ.

**අමරසිරි දොඩන්ගොඩ මහතා**
**(திரு. அமரசிறி தொடங்கொட)**
(Mr. Amarasiri Dodangoda)
දෙන්නේ නැති එක නොවෙයි. මේක ඇද ඇද ඉන්නකොට මිනිසුන් මැරෙන එකයි, මිනිසුන් අනාථ වෙන එකයි, පවුල් අනාථ වෙන එකයි සිදු වන්නේ. අද උතුරු - නැගෙනහිර තිබෙන්නේ හමුදා. ත්‍රිකුණාමලය කච්චේරිය තිබෙන්නේ හමුදා කඳවුරේ. දිසාපති ඉන්නේ නාවික හමුදා කඳවුරේ. මොකක්ද එහේ තිබෙන ආණ්ඩුව ? දිසාපතිවරයා නාවික හමුදා කඳවුර ඇතුළේ. මා ළඟ මේ යෝජනා කීපයක් තිබෙනවා. මට තව වෙලාව දෙන්නට ලැස්ති නම් මම ඒවා ඉදිරිපත් කරන්නම්.

**වීරසිංහ මල්ලිමාරච්චි මහතා**
**(திரு. வீரசிங்ஹ மல்லிமாரச்சி)**
(Mr. Weerasinghe Mallimarachchi)
තමුන්නාන්සේව එහාට යවන්නම්.

**අමරසිරි දොඩන්ගොඩ මහතා**
**(திரு. அமரசிறி தொடங்கொட)**
(Mr. Amarasiri Dodangoda)
මාව යවන්න එපා. මේ ගිය උදවිය කළ වාර්තා.

**මන්ත්‍රීවරයෙක්**
**(அங்கத்தவர் ஒருவர்)**
(A Member)
මෙයාව යවන්න ඕනෑ අංගොඩට.

**අමරසිරි දොඩන්ගොඩ මහතා**
**(திரு. அமரசிறி தொடங்கொட)**
(Mr. Amarasiri Dodangoda)
අංගොඩට නොවෙයි, මේ ගිය උදවිය කළ වාර්තා. තිම්පු සාකච්ඡා ආරම්භ කළ දිනයේ සිට අවසන් වන තුරු ත්‍රස්තවාදීන් තම ක්‍රියා මාර්ග අත්හිටුවා නැහැ. එහෙත් ශ්‍රී ලංකා රජයේ නියෝජිත පිරිස එම සාකච්ඡාවේ කිසිම අවස්ථාවක මේ සම්බන්ධව වාර්තා කර නැහැ. දැනට තිම්පු සාකච්ඡාවල වාර්තා වී තිබෙන්නේ වවුනියාවේ යුද්ධ හමුදා ප්‍රහාරයකින් ද්‍රවිඩ ජනතාව මැරුණ එක විතරයි. [බාධා කිරීමක්] මේ සාකච්ඡා ඉදිරියට ගියාම කෙනෙකුට පෙනෙන්නේ සාකච්ඡා කරද්දීත් මිනිසුන් මරා තිබෙන්නේ හමුදාව විතරයි කියන එකයි. එම නිසා මෙහේ සිදු වෙන සටන් තමුන්නාන්සේලාගේ නියෝජිතයන්ට කියන්න. ත්‍රස්තවාදීන් තවම මිනිසුන් මරනවාය කියන එක වාර්තා කරන්නය කියා ඒ උදවියට කියන්න. ඒ උදවිය ගිහින් මොනවාද මේ කථා කර තිබෙන්නේ ? ඒ නිසා මේ සාකච්ඡා දැන් ගෙන යන විධියට මිනිසුන් මේ දිහා බලාගෙන ඉන්නේ වටමේසය දිහා බලාගෙන සිටියා වගේයි. තමුන්නාන්සේලාට දැන් සිදු වී තිබෙන්නේ මොකක්ද ? ජාතික ආරක්ෂක ඇමතිතුමා එංගලන්තයට ගොස් කළ කථාවක මේ විධියට දක්වා තිබෙනවා. ත්‍රස්තවාදීන්ට යුද්ධයක් අවශ්‍යයිලු. ඒකට ලැස්ති වෙන්නෙ ඕනෑලු. ඒ ලැස්ති වෙනවිට දැන් මුලදීම තමුන්නාන්සේලා ඒක පටලවාගෙන තිබෙනවා. මට තව විනාඩි 15ක් මේ අවස්ථාවේදී දෙනවා නම් මම ඒක කියන්නම්. එහෙම දෙයි කියා මම හිතන්නේ නැහැ. මොකද ? මේ ප්‍රශ්නය පිළිබඳව වැරදි, ආණ්ඩුවේ ඇති වුණු අසාර්ථකත්වය ගැන අපි කථා කරනවාට තමුන්නාන්සේලා කැමති නැහැ.

**අනුර බණ්ඩාරනායක මහතා**
**(திரு. அனுர பண்டாரநாயக்க)**
(Mr. Anura Bandaranaike)
We can give him 15 minutes of the time of the hon. Third Member for Colombo Central.

**නියෝජ්‍ය කථානායකතුමා**
**(பிரதிச் சபாநாயகர் அவர்கள்)**
(Mr. Deputy Speaker)
He can take 13 minutes because he has already taken 2 minutes.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**අමරසිරි දොඩන්ගොඩ මහතා**
**(திரு. அமரசிறி தொடங்கொட)**
(Mr. Amarasiri Dodangoda)

විරුද්ධ පාර්ශ්වය හැටියට මේ ගත් පියවරවල් ගැන නැවත ආපසු හැරී බලා අපි පැහැදිලිව කථා කළ යුතුයි.

**වෛද්‍යාචාර්ය පී. එම්. බී. සිරිල් මහතා (හම්බන්තොට දිසා ඇමතිතුමා)**
**(வைத்திய கலாநிதி பீ. எம். பி. சிறில்—ஹம்பாந்தோட்டை மாவட்ட அமைச்சர்)**
(Dr. P. M. B. Cyril – District Minister, Hambantota)

තමුන්නාන්සේලා මේක අවුල් කරන්න කථා කරනවා මිසක් විසඳුමක් ඇති කරන්න කථා කරන්නේ නැහැ. ඉන්දියාවේ විපක්ෂය ඔය විධියට කථා කරන්නේ නැහැ.

**අමරසිරි දොඩන්ගොඩ මහතා**
**(திரு. அமரசிறி தொடங்கொட)**
(Mr. Amarasiri Dodangoda)

විසඳුමක් ගැන නොවෙයිද අපි කථා කරන්නේ ? මිනිසුන් මැරෙන එක ගැන වගකියන්නට ඕනෑ ආණ්ඩුව. අනාථ වන එක ගැන වගකියන්නට ඕනෑ ආණ්ඩුව. අපි නොවෙයි. ඒකයි අපි මේ ආණ්ඩුවට කියන්නේ. ඒගැනයි අපි කථා කරන්නේ. දිනපතා පැනලා එනවා. ගෙවල් අත්හැරලා පැනලා එනවා. පැහැරගෙන ගිහින් එහේ වහල් වැඩ ගන්නවා. ගජබා රජ්ජුරුවන්ගේ කාලයේ එහෙන් ගෙනැවිත් මෙහේ වහල් වැඩ ගත්තා වගේ අද මෙහෙන් ගෙනිහින් එහේ වහල් වැඩ ගන්නවා. තවත් ලජ්ජා නැතිව කථා කරනවා. [බාධා කිරීමක්] එය විරෝධය පෑමක්, ආණ්ඩුව මේ ප්‍රශ්නය විසඳන්නේ නැති එකට. තමුන්නාන්සේලාගේ නායකයා කියන්නේ හිංසාවාදී විරෝධය ගැනයි. තමුන් සත්‍යග්‍රහ පටන් ගත්තේ තමුන්නාන්සේලා.

**වෛද්‍යාචාර්ය පී. එම්. බී. සිරිල් මහතා**
**(வைத்திய கலாநிதி பீ. எம். பி. சிறில்)**
(Dr. P. M. B. Cyril)

ඒ සත්‍යග්‍රහ කළේ බිම ඉඳගෙන. තමුන් මේක පුටු උඩ ඉඳගෙන, කාර්වල ඉඳගෙන කරන්නේ.

**අනුර බණ්ඩාරනායක මහතා**
**(திரு. அனுர பண்டாரநாயக்க)**
(Mr. Anura Bandaranaike)

ඒක තමුන්නාන්සේලාගේ ප්‍රශ්නයක් නොවෙයි. ඒක අපේ ප්‍රශ්නයක්.

**අමරසිරි දොඩන්ගොඩ මහතා**
**(திரு. அமரசிறி தொடங்கொட)**
(Mr. Amarasiri Dodangoda)

තුන්මුල්ලේ තිබුනු පන්සලත් උස්සගෙන ගියේ තමුන්නාන්සේලාතේ. බුදු පිළිමයත් උස්සාගෙන ගියා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි—

**වෛද්‍යාචාර්ය පී. එම්. බී. සිරිල් මහතා**
**(வைத்திய கலாநிதி பீ. எம். பி. சிறில்)**
(Dr. P. M. B. Cyril)

ඒකද හෝන් ගහන්න කිව්වේ ?

**අමරසිරි දොඩන්ගොඩ මහතා**
**(திரு. அமரசிறி தொடங்கொட)**
(Mr. Amarasiri Dodangoda)

රජය මේ ප්‍රශ්නය විසඳන්නේ නැති වුණාම මහා සංඝරත්නය හා සියලු බලවේග එකතු වී විරෝධය පානවා. ඒ මොකද, එහෙ ඉන්න මිනිස්සු පැනලා එනවා. මිනිස්සු මැරෙනවා. රජයේ සේවකයින්ට එහෙ ඉන්න බැහැ. කච්චේරිය තිබෙන්නේ හමුදා කඳවුරේ. දිසාපති ඉන්නේ නාවික හමුදා කඳවුරේ. මොකක්ද එහෙ තිබෙන ආණ්ඩුව. රටෙන් බාගයක ක්‍රියාත්මක වෙන්නේ ව්‍යවස්ථා ක්‍රමය නොවෙයි, හමුදා ක්‍රමයයි. ඒ නිසා අපි විරෝධය පාන්න ඕනෑ. [බාධා කිරීමක්] අවුරුදු පනහක් තිස්සේ දේපළ උපයා ගෙන බොහොම අමාරුවෙන් දෙහි වත්තේ ජීවත් වූ මිනිස්සු ඒ ගම්-බිම් අත් හැර දමා ඇවිත් මාතර ස්ටේෂන් එකේ යන්න එන්න තැනක් නැතිව ඉන්න විට—

**වීරවන්නි සමරවීර මහතා (නියෝජ්‍ය අධ්‍යාපන ඇමතිතුමා)**
**(திரு. வீரவன்னி சமரவீர — கல்விப் பிரதி அமைச்சர்)**
(Mr. Weerawanni Samaraweera–Deputy Minister of Education)

තමුන්නාන්සේ ගිහින් මොනවද දුන්නේ ? හාල් මිටක් දුන්නාද ?

**අමරසිරි දොඩන්ගොඩ මහතා**
**(திரு. அமரசிறி தொடங்கொட)**
(Mr. Amarasiri Dodangoda)

මේක තමුන්නාන්සේ එක්ක තිබෙන ප්‍රශ්නයක් නොවෙයි.

පාකිස්ථානයේ අනාථයින් බලන්න ඒ අනාථ කඳවුරුවලට ගියා තමුන්නාන්සේලාගේ ලොක්කෝ. තමුන් ලංකාවේ අනාථ කඳවුරු බලන්න ආවාද ? [බාධා කිරීමක්] බංගලාදේශයේ ගංවතුර බලන්න ගියා. මෙහෙ අනාථයින් බලන්න ගියාද ? මොනවද මේ තමුන්නාන්සේලා කථා කරන්නේ ? [බාධා කිරීමක්] මේ වැඩය පටන් ගන්නවා නම් ඉන්දියාව හොඳින් තියා ගන්නය කියා මා තමුන්නාන්සේලාට කියන්න කැමතියි. ඉන්දියාව හොඳින් තියාගන්න තමුන්නාන්සේලාට මොළය පෑදුනේ පස්සෙයි. ඇයි ? ඊළඟ තුන්වැනි යුද්ධයට ලෑස්ති වෙනවිට දිනන්නේ ඉස්සේල්ලාම යුද්ධ ආරංචි ගිය පැත්තයි. ඉස්සෙල්ලාම යුද්ධ ආරංචි කාට සපයන්නද අපේ රටේ අවස්ථාව දී තිබෙන්නේ ? අන්න ඒ ප්‍රශ්නය ඉන්දියාව අහනවා. " ඇමරිකන් හඬ " මෙහෙ ගෙනැවිත් වෙන්නප්පුවේ අක්කර දහස් ගණනක් දීලා තැවැත්තුව. ඇමරිකන් හඬ ඇයි එහෙම තැවැත්තුවේ ? ඇයි අපේ ආණ්ඩුව ඇමරිකන් හඬට මෙහෙ ඉඩ දුන්නේ ? ඇමරිකන් හඬ ලංකාවේ පිහිටුවාගෙන තියන එකයි ඉන්දියාවට තිබෙන ලොකුම තර්ජනය. ඉන්දියාව ලෝකයේ පස්වැනි බලවතා. ඒ නිසා අද ඉන්දියාව කල්පනා කරන්නේ—

**ජී. එම්. ප්‍රේමචන්ද්‍ර මහතා (නියෝජ්‍ය ධීවර ඇමතිතුමා)**
**(திரு. ஜீ. எம். பிரேமசந்திர — கடற்றொழில் பிரதி அமைச்சர்)**
**(Mr. G. M. Premachandra–Deputy Minister of Fisheries)**

ඉන්දියාවෙත් තිබෙනවා.

**අමරසිරි දොඩන්ගොඩ මහතා**
**(திரு. அமரசிறி தொடங்கொட)**
(Mr. Amarasiri Dodangoda)

ඉන්දියාවේ තිබෙනවා. තමුන් ඉන්දියාවේ තිබෙන්නේ මේ විධියේ යුද්ධ ආරංචි සපයන එකක් නොවෙයි.

මේ යුද්ධ ආරංචි සපයන මධ්‍යස්ථානය පළමුවැනි ආරංචිය සැපයූ ගමන් ඊළඟට පරමාණු යුද්ධයක් ක්‍රියාත්මකවීමේ ශක්තිය ඇති වෙනවා. ඒ නිසා තමයි අපි ප්‍රවේශම් වෙන්න ඕනෑ. අපි ත්‍රිකුණාමලය වරාය දෙන්න ගියොත්, තෙල් ටැංකි දෙන්න ගියොත් ඉන්දියාව කල්පනා කරනවා ඉන්දියාවට විරුද්ධ බලවේගයක් ලංකාවේ අත්තිවාරමක් දමා ගන්නවාය කියා. තමුන්නාන්සේලාගේ විදේශ වැඩපිළිවෙලවලින් අපේ නොබැඳි බව සම්පූර්ණයෙන්ම නැති වී අපි බැඳුනු තත්ත්වයට වැටිලා ඉන්නවා. ඉන්දියාව ඒ පිළිබඳ අමනාපයක් තිබෙනවා. එමනිසා මා හිතනවා, මේ ප්‍රශ්නය විසඳා ගන්න නම් තමුන්නාන්සේලා සම්පූර්ණයෙන්ම ඉන්දියාවේ සහාය ලබා ගත යුතුයි කියා. ඒ ඉන්දියාවේ සහාය ලබා ගැනීමට අවශ්‍ය බව තමුන්නාන්සේලාට වැටහුණේ හුඟක් පහුවෙලා. පහුවෙලා හරි ඒක වැටහීම ගැන අපි සතුටු වෙනවා.

ඒ වාගේම මම කියන්න කැමතියි, මේ ප්‍රශ්නය පිළිබඳව ජනවාර්ගික පැත්තෙන් පමණක් බලන්න එපා කියල. රජය මේ ප්‍රශ්නය දෙස බලන්නේ බොහෝ විට සිංහල – දෙමළ ප්‍රශ්නයක් වශයෙන්. මෙය සිංහල – දෙමළ ප්‍රශ්නයක් පමණක් නොවෙයි. මේ පිළිබඳව ත්‍රස්තවාදී සංවිධාන ජාතිවාදී මට්ටමෙන් බලන්න පුළුවන්. ඒ වාගේම සිංහල සංවිධාන සිංහලවාදී මට්ටමෙන් බලන්න පුළුවන්. ඔය දෙපැත්තෙන් බලනතුරු ඔය ප්‍රශ්නය ඔය විධියට දිගටම තිබෙනවා. ඒක මග හරින්නට, ජනවාර්ගික කියන ප්‍රශ්නය ඉවතට දමා, මේ රටේ ඒකීයභාවය රැක ගැනීම සඳහා දේශපාලන වශයෙන් විසඳුමක් ඇති කර ගන්නා තත්ත්වයට සම්පූර්ණයෙන්ම මෙය ගෙන එන්නට ඕනෑ.

**වෛද්‍යාචාර්ය පී. එම්. බී. සිරිල් මහතා**
**(வைத்திய கலாநிதி பீ. எம். பி. சிறில்)**
(Dr. P. M. B. Cyril)

තමුන්නාන්සේලා සාකච්ඡාවකටවත් එන්නේ නැහැ නේ. සර්ව පාක්ෂික රැස්වීමටවත් තමුන්නාන්සේලා ආවේ නැහැ නේ !

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**අමරසිරි දොඩන්ගොඩ මහතා**
**(திரு. அமரசிறி தொடங்கொட)**
(Mr. Amarasiri Dodangoda)

ඒක නිකම් විහිළුවක් නේ ! සර්ව පක්ෂ කිව්වත් ඒකට කවුද ආවේ ?

**මන්ත්‍රීවරයෙක්**
**(அங்கத்தவர் ஒருவர்)**
(A Member)

ඒක නිකම් සර්ව පුට්ටුවක් විතරයි.

**අමරසිරි දොඩන්ගොඩ මහතා**
**(திரு. அமரசிறி தொடங்கொட)**
(Mr. Amarasiri Dodangoda)

තුන් පලකට ගැහැව්වාට පස්සේ, මෙහෙත් තිකවැරටියට, මැදින් අනුරාධපුරයට, නැගෙනහිරින් වෙරලෙ දෙහිවත්තට ගැහැව්වාට පස්සේ තේරුම් ගත්තා ත්‍රස්තවාදි කොටස් එක්කත් සාකච්ඡා කළ යුතු බව. ආණ්ඩුව දණ ගැහැව්වා. මෙතෙක් තිබුණු සියලු තත්ත්වයන්ගෙන් ආණ්ඩුව දණ ගසා තිබෙනවා. ඒකයි එදා සර්ව පාක්ෂික සමුළුවට නොකැඳවූ මිනිසුන් පස්සේ තිම්පු සාකච්ඡාවට කැඳවා තිබුණේ. රාජිව් ගාන්ධි මහත්මයා තිම්පු නුවර සූදනම් කර දුන් සාකච්ඡාවට ත්‍රස්තවාදීනුත් සම්බන්ධ වුණා. අපි එදත් ඒ ගැන කිව්වා. අපේ රට ඒකීය, ස්වාධීන රාජ්‍යයක් බව කිව්වත්, ඉන්දියාවේ විදේශ ඇමතිතුමා ඇවිත් සාකච්ඡා මෙහෙයවන මට්ටමකට විදේශ සම්බන්ධතා තත්ත්වය, අපේ ඒකීයභාවය, ස්වාධීනත්වය දුබල වී තිබෙනවා. ඇත්තවශයෙන්ම ආණ්ඩුවට ලජ්ජා සහගත තත්ත්වයකුයි තිබෙන්නේ. අපේ ආණ්ඩුව මේ මට්ටමට වැටීම, ජාතියක් හැටියට, මුළු රටක් හැටියට සලකා බැලීමේදී අපට ඉතාම ලජ්ජාවට කරුණක්. අන්න ඒ නිසා තමයි, සාකච්ඡාවලට එන්නට කලින්, යම් යම් ප්‍රශ්න සම්බන්ධයෙන් යම් ක්‍රියාමාර්ග ගන්නට කලින්, මා කලිනුත් කිව්වා වාගේ, නියම අවබෝධයකින් කටයුතු කළ යුතු බව කියන්නේ. ඇත්තෙන්ම ඒ පිරිසට ඕනෑ කරන්නේ වෙනම රටක්. ආණ්ඩුව වෙනම රටක් ලබා දෙන්නට ලැහැස්ති නැහැ. එහෙමනම් මේ සාකච්ඡා පැවැත්වීමේ තේරුම මොකක්ද ?

**වෛද්‍යාචාර්ය පී. එම්. බී. සිරිල් මහතා**
**(வைத்திய கலாநிதி பீ. எம். பி. சிறில்)**
(Dr. P. M. B. Cyril)

සාකච්ඡා පවත්වන්නේ නැතුව තීරණයක් ගන්නේ කොහොමද ?

**අමරසිරි දොඩන්ගොඩ මහතා**
**(திரு. அமரசிறி தொடங்கொட)**
(Mr. Amarasiri Dodangoda)

සාකච්ඡා කළාට කමක් නැහැ. නමුත් ආණ්ඩුව ලක්ෂයක් එහාට යවන්නට සිටියත්, දැන් සිදුව තිබෙන්නේ ලක්ෂයකට මෙහාට එන්නටයි. තුවක්කු දෙසීය පණහක් දී ඒ ප්‍රදේශවල සිංහල වැසියන් පදිංචි කරවන්නට බලාපොරොත්තුව සිටියත්, දැන් අනාථයන් හැටියට සිංහල වැසියන් මෙහාට පැන ඇවිත් සිටිනවා. මෙහිදී සිදු වුණේ අනික් පැත්තයි.

**වීරසිංහ මල්ලිමාරච්චි මහතා**
**(திரு. வீரசிங்ஹ மல்லிமாரச்சி)**
(Mr. Weerasinghe Mallimarachchi)

ඒ පිරිස ආපසු පදිංචි කරන තුරු තීරණ ක්‍රියාත්මක කරන්නේ නැති බව කියා තිබෙනවා.

**අමරසිරි දොඩන්ගොඩ මහතා**
**(திரு. அமரசிறி தொடங்கொட)**
(Mr. Amarasiri Dodangoda)

යම් යම් කටයුතු සම්බන්ධයෙන් විරෝධය පැවත් වැරදියි. අඩුපාඩුකම් පෙන්වා දුන්නත් වැරදියි.

හම්බන්තොට දිසා ඇමතිතුමාත් ගරු සභාවේ සිටින නිසා, විශේෂයෙන් සඳහන් කළ යුතු එක් කාරණයක් තිබෙනවා. එම දිස්ත්‍රික්කයේ සංවර්ධන සභාවේ සභිකයෙක්, හදිසි නීතිය යටතේ සිරභාරයේ ඉන්නවා. විජේවීර මහතාගේ කථාවක් අඩංගු කැසට් එකක් ඇසුවාය කියන චෝදනාව උඩ.

**වෛද්‍යාචාර්ය පී. එම්. බී. සිරිල් මහතා**
**(வைத்திய கலாநிதி பீ. எம். பி. சிறில்)**
(Dr. P. M. B. Cyril)

ඒක සම්පූර්ණයෙන්ම අසත්‍ය ප්‍රකාශයක්. ත්‍රස්තවාදි කඳවුරක් මෙහෙයවූවාය කියන කාරණය උඩයි සිරභාරයට ගෙන තිබෙන්නේ.

**අමරසිරි දොඩන්ගොඩ මහතා**
**(திரு. அமரசிறி தொடங்கொட)**
(Mr. Amarasiri Dodangoda)

මොකක්ද මෙහෙයවා තිබෙන්නේ ?

**වෛද්‍යාචාර්ය පී. එම්. බී. සිරිල් මහතා**
**(வைத்திய கலாநிதி பீ. எம். பி. சிறில்)**
(Dr. P. M. B. Cyril)

කල දේවල් මම කියන්නම්; මම කථා කරන විට.

**අමරසිරි දොඩන්ගොඩ මහතා**
**(திரு. அமரசிறி தொடங்கொட)**
(Mr. Amarasiri Dodangoda)

කැසට් එකකට ඇහුම්කන් දුන්නාය කියා දකුණේ, මෙහේ මිනිසුන් හිර කර ගෙන ඉන්නවා. නමුත් උතුරේ හය සිය ගණනක් නිදහස් කර යවා තිබෙනවා.

**රිචඩ් පතිරණ මහතා**
**(திரு. றிச்சட் பத்திரன)**
(Mr. Richard Pathirana)

යාපනයේ පිට්ටනියක යුද පුහුණුවන හැටි පත්‍රවල පළ වුණා. නමුත් ආණ්ඩුව ඒ සම්බන්ධයෙන් කළේ මොකක්ද ?

**වෛද්‍යාචාර්ය පී. එම්. බී. සිරිල් මහතා**
**(வைத்திய கலாநிதி பீ. எம். பி. சிறில்)**
(Dr. P. M. B. Cyril)

ඊලාම් රජයක් එක්ක, උතුරත් එක්ක එකතු වෙන්නටඅ, කඳවුරු බැඳ ගන්නටය කියන කථාව කියා තිබෙනවා.

**අමරසිරි දොඩන්ගොඩ මහතා**
**(திரு. அமரசிறி தொடங்கொட)**
(Mr. Amarasiri Dodangoda)

ඔය සංවර්ධන සභික මහත්මයා, ජනතා විමුක්ති පෙරමුණේ සාමාජිකයෙක් නිසා සිරභාරයේ තබා ගෙන සිටින බව කියනවා. මෙයින් පැහැදිලි වෙනවා, ආණ්ඩුව කොයි තරම් මට්ටමක වැටී තිබෙනවාද කියන කාරණය. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් ආයුධ ගබඩාවත් ගාල්ලට ගෙනල්ලා. ආණ්ඩුව වැටුණු වැටිල්ලක තරම, දැන් ආයුධ ගබඩා කිරීම කරන්නේ කොළඹ නොවෙයි, ගාල්ලේ. අපට ඇති ප්‍රශ්නය—

**රිචඩ් පතිරණ මහතා**
**(திரு. றிச்சட் பத்திரன)**
(Mr. Richard Pathirana)

අපි එහෙ ඉන්නකම් බය නැහැ.

**අමරසිරි දොඩන්ගොඩ මහතා**
**(திரு. அமரசிறி தொடங்கொட)**
(Mr. Amarasiri Dodangoda)

දැන් ටික ටික පහළට ඒමයි. අන්තිමට ගාල්ලේ ආයුධ ගබඩාව තබා නොගෙන ප්‍රවේශම් කර ගන්නට බැරි තත්ත්වයකට පත් වී තිබෙනවා. ගාල්ලෙත් බැරි වුණොත් අපි සේරම දෙනා ගොළු මුහුදටයි වැටෙන්නේ. තත්ත්වය ඔහොම තමයි. අපි කැමතියි, එහේ ආයුධ ගබඩා කර තබනවාට. කඳවුරු පටන් ගත්තේ කන්කසන්තුරෙන්. දැන් ටික ටික ඉවත් කර ගෙන, පොලිසි හැම එකක්ම ඉවත් වී, ඊළඟට මැද රටට ඇවිත්, අද මැද රට බවුන්ඩරියත් පාස් කර ගෙන ඇවිත්, ආයුධ ගබඩා කිරීමත් ගාල්ලට වැටෙන තරමට ආරක්ෂාව බංකොලොත් වී තිබෙනවා. මෙන්න මේ නිසා හදිසි නීතිය දීර්ඝ කරමින් ඒ ගැන කථා කර කර සිටින්නට සිදු වී තිබෙනවා, මේ විධියේ මෝඩ පියවරවල්, අසාර්ථක පියවරවල් ගන්නා තුරු. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ ප්‍රදේශවල මිනිසුන් දිනපතා මැරෙනවා. අනාථ වෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[අමරසිරි දොඩන්ගොඩ මහතා]

පැහැර ගෙන ගිහින් වහල් වැඩ ගන්නවා. උතුරේ රජයක් නැහැ. දිසාපතිවරු නැහැ. රජයේ සේවකයන්ට සේවා ස්ථානවලට යන්නට බැරුව සිටිනවා. ඒ සම්බන්ධයෙන් ගන්නා පියවරක් නැහැ. සිවිල් පාලනයක් නැහැ. හමුදා සිටිනවා. නමුත් ව්‍යවස්ථාවක් එහාට බලපාන්නේ නැහැ. මන්ත්‍රීවරුන්ගේ නියෝජනයක් නැහැ. එහෙමනම් වෙනමම රාජ්‍යයක් නැතැයි කියනවාද ? මගේ අදහස් පළ කිරීම මෙයින් අවසන් කරනවා.

පූ. භා. 11. 43

**රොහාන් අබේගුණසේකර මහතා** (හඟුරන්කෙත)
**(திரு. ரொஹான் அபேகுணசேக்கர — ஹங்குரன்கெத்த)**
(Mr. Rohan Abeygunasekera–Hanguranketa)

Mr. Deputy Speaker, today we are debating this Emergency soon after the Thimpu talks have been postponed or adjourned indefinfitely. In a sense, it is already in some danger. At this time I think it is the responsibility of both sides of the House to contemplate this problem soberly and act with a sense of responsibility. Even if there is no actual violence in some of our areas, we cannot deny the fact that the fears and anxieties that have been caused by terrorism have taken toll of all of us. However, it stands to the credit of the President and the Indian Prime Minister that they have been able to achieve some measure of dialogue between the terrorists and the Government. We must cangratulate all those who were instrumental in bringing the two sides together at Thimpu.

An aspect of Tamil terrorism which is very disturbing to us is the totally extremist and uncompromising attitude of the terrorists. We see the almost total commitment of the Tamil youth who have taken up arms. We hear of the teenagers who have joined them. We hear of terrorists with cyanide capsules hidden in case they are arrested. We find that a good many of them are in fact prepared to make the supreme sacrifice.

Looking at the Sinhalese side, we have found that of late the Sinhalese are becoming more and more restive. I was told last week that there were some posters that came up in Kandy. Apparently, the posters had been threatening some of the Tamil businessmen and the Tamil community in the area. I believe some of the Tamil families in Kandy had taken these poster warnings very seriously, and I was told that some of them even started leaving the city. I am not sure to whom responsibility has to be attributed for these posters, but it is certainly a very disturbing feature that these posters have started reappearing and the fears of 1983 are resurfacing.

Now what has happened is that mutual suspicion between the two commuinities has been growing more and more. We find that the attitudes and the feelings of bitterness have hardened. We find that there is a vicious circle which is extremely difficult to break through. Whatever negotiations we have, whatever solutions we may arrive at in a foreign place, we find that one of the chief obstacles to implementing those proposals would be this mutual suspicion and this vicious circle of intenecine war that we have at this moment.

One question that we have to ask ourselves is why the Tamil youths have taken such an extreme position. We have also to ask ourselves why some Sinhalese have taken such an extreme position. Sir, my belief is that the TULF and the Eelam supporters have over a very long period been propagating various false myths about the history of our country. This propaganda, as we all know, has been anathema to the Sinhalese people. For a very long time interested people have been spreading these myths to further their own aims, and peace-loving people have had to suffer for it. Some political leaders, some intellectuals, some academics, some Marxist theoreticians have been promoting these falsehoods not only here but also abroad, and I feel that a good many people have started believing these stories, a good many people believe that these myths are the actual history of this country, because they have had no occasion to know the actual truth of our history. These propagandists are actually living a very safe distance away from the actual suffering and the people affected, and therefore they are able to continue to do their propaganda, which keeps adding to our miseries.

The false propaganda and beliefs that the Eelamists are promoting can be seen from one of their publications, the "Tamil Times". I would like to read some excerpts from the editorial of the "Tamil Times" of July 1985. It says :

"Before one can discuss constitutional arrangements or units of devolution, it is essential to diagnose the political disease by establishing certain facts."

Sir, what are these facts ?

"The Tamils, including the Tamil-speaking Muslims, perceive themselves as an oppressed people and this oppression has been carried out by successive governments representing or purporting to represent the interests of the majority Sinhala community."

Now they have linked up the Muslims also in this cry for Eelam, which is absolutely untrue.

Then this editorial goes on to say :

"The Tamil people were treated as a separate people when ethnicity became a criterion for discriminatory recruitment to employment and admission to institutions of advanced learning."

Sir, this totally ignores the very rational basis of the standardization system and the district quota system for admissions to universities as it is operated today.

Further down in this editorial it says :

"The fact that the Sinhala people have lived predominantly and traditionally in the seven provinces other than the north and east, must be recognised. Equally, the fact that the Tamil speaking people, including the Muslims, have lived in the northern and eastern provinces must also be accepted."

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

You find statements like this being issued by the Eelamist propagandists, and you find that these very same ideas have expressed in their manifestos also. They have said that even before the Christian era the entire Island had been ruled by Tamil kings. They have insisted that the Sinhalese and the Tamils have always lived separately and that they have been ruling two different nations, two different states.

Sir, I came across a paper written by a Peradeniya Don by the name of Mr. G. H. Peiris. Its title is, "An Appraisal of the Concept of a Traditional Tamil Homeland in Sri Lanka". In this paper he has discussed it in relation to a number of historical studies done by authoritative historians, and some of them are Tamils. He has analysed the whole history of this problem of a Tamil nation, and it is very interesting to find what his conclusions are. In this Paper he refers to a report of the 1890s by a British Officer. This is about the Trincomalee district. It says :

"This part of the district (i.e. Kaddukulam Pattu West) is inhabited by Sinhalese villagers of Kandyan descent.... (who), I fear, are dying out of becoming effaced. This district is most interesting, being dotted over by numerous village tanks, some of which are restored and others abandoned.

The villagers retain many of their primitive Kandyan customs, but they are rapidly becoming 'Tamilized'.... They intermarry with the Tamils and many of them speak Tamil as well as they speak Sinhalese. Even the government schoolmaster is Tamil..... "

And it goes on to say further down :

"and even the names of villages are assuming a Tamil dress".–[*Interruption*]

It is at Kaddululam Pattu West. This report has been written in the 1890s by an English officer. Sir, he has analysed the population census since 1871 when the official census was first taken. Some of the conclusions that he had come to are very interesting indeed. He says :

"In the Eastern Province almost all Tamil settlements were confined to a coastal strip barely extending even ten miles to the interior. The Sinhalese settlements though comparatively fewer in mumber were scattered over extensive areas of the interior covering the entirety of the Administrative Districts of Bintenna Paththa, Uda Palatha, Meda Palatha and Wevgam Pattu."

Then, this is his second conclusion :

"In the northern parts of the Batticaloa District and Trincomalee district extensive tracts of territory in the interior were either uninhabited or venues of scattered Sinhalese settlements".

Then, another conclusion :

"The only non-Sinhalese settlements in the interior were those associated with the irrigation works which were restored. This Tamil settlement nearest to the claimed 'Southern boundary'...."

That is, the Kumbukkan Oya.

"of the Tamil homeland was a coastal township of mixed population, 35 miles north of that boundary".

The fourth conclusion :

"The 1921 pattern of settlement was the culmination of a long drawn out historical process the chief feature of which was the advances of the Tamil population and the retreat and recession of the Sinhala population. This means that the process of Tamilization of the Eastern lowlands of Sri Lanka had not penetrated significantly into the interior even at its most extensive territorial spread".

Another conclusion, Sir, is :

"The area claimed as the traditional homeland encompasses areas with entensive tracts never occupied by Tamils and in fact was the traditional homeland of other groups".

The sixth conclusion, Sir, is :

"The Eastern littoral is not homogeneous because it is the traditional homeland of the Muslims as well as the Tamils."

These conclusions were based on censuses since 1871 up to 1921, well before any government-organized colonization really started in those areas.

Another contention of the Eelamists is that State-sponsored colonization in Tamil areas is making the Tamils a minority in an area where they were traditionally a majority. But when you compare the population figures of 1921 with those of 1981 you see that there is no significant change in the population composition except in the Trincomalee and Amparai Districts, where due to irrigation schemes like Gal Oya there has been a sudden influx of Sinhalese. But these schemes do not cover areas occupied by Tamils, and very often Muslims and Tamils have been included in these colonization schemes. Where there is a drop in the percentage of Tamils in predominantly Tamil districts, there is an off-setting gain of the Tamil population in other districts.

A look at the peasant and youth settlement schemes shows that not only Sinhalese but also Tamils have been settled. The percentage of Sinhalese is slightly higher than the national average because peasants are drawn mostly from the Sinhalese community and also because density of population and land hunger are found more in the Sinhalese areas than in the Northern and Eastern areas. No settlements have been done at all in the Districts of Jaffna, Mullaitivu, Batticaloa and Mannar.

In 1979, Sir, the Land Commissioner's Department did a survey on encroachment of crown lands. One significant finding is the encroachment of crown land in Mannar, Mullaitivu and Vavuniya by Indian Tamils. The State has never sponsored encroachment, and very recently, when the Government acted against encroachers, it was done against the Sinhalese.

Dr. Pieris in his conclusion says that Tamilization of the North and certain sections of the Eastern littoral had no effect on the interior of these areas, which remained very much a traditional home of the Sinhalese peasantry. He also says that the settlement schemes do



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[රොහාන් අබේගුණසේකර මහතා]

not involve any intrusion, and State- sponsored land settlements were meant for the poorest segments of the poulation, that is, the ladless peasantry. There is no discrimination when selecting families and when taking action against encroachment. One conclution that he makes there which is very, very significant, I feel, is that the Northern and Eastern Provinces , which constitute about 29 per cent of the total area of Sri Lanka, are inhabited by 72.6 per cent of the Sri Lankan Tamil population. This is equivalent to approximately 9 per cent of the total population of the country. So the demands for separation in the North and the East is equivalent to saying that 9 per cent of the population should live in 29 per cent of our land area. This is rather and unfair demand in a country where there is such intense land hunger.

Sir, the "Daily News" of 14th August 1985 gives a report of the statement made by Dr. H. W. Jayewardene. It is captioned, "Govt. vetoes 3 Tamil claims". It is correct that we have rejected the principles or arguments brought by the Tamil terrorist groups that there is a distinct Tamil nation, that we should recognize a Tamil homeland, and that there is the right of self-determination of the Tamil nation. All these have ben rejected.

Sir, what we should do now, particularly at this time when myths are actually operating on both sides, both the Sinhalese and the Tamil sides is to explode these myths. The Government has to put the mas media – the radio, television, the press – to proper and more effective use. Not only abroad, but if we cannot manage a propaganda war abroad at least in our own country, we should be able to convince the people of what the truth is. Whatever solution we arrive at at Thimpu or at any other foram has to be implemented here, and I am sure the people of this country, whether they be Sinhalese or Tamils would then be more receptive to the solution. They will look at it in a different light if we succed in exploding al these myths about the new history of Sri Lanka.

Thank you.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(Mr. Deputy Speaker)

The Sitting is suspended till 2 p.m.

*රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ. භා. 2 ට නියෝජ්‍ය කාරක සභාපතිතුමා, [එඩ්මන්ඩ් සමරවික්‍රම මහතා] ගේ සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.*

*அதன்படி, அமர்வு பி. ப. 2 மணிவரை இடைநிறுத்தப்பட்டு, மீண்டும் ஆரம்பமாயிற்று. குழுப் பிரதித் தலைவர் அவர்கள் [திரு. எட்மன் சமரவிக்ரம] தலைமை வகித்தார்கள்.*

*Sitting accordingly suspended till 2 p.m. and then resumed,* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES [MR.EDMUND SAMARAWICKREMA] *in the Chair.*

**දිනේෂ් ගුණවර්ධන මහතා (මහරගම)**
**(திரு. தினேஷ் குணவர்த்தன — மஹரகம)**
(Mr. Dinesh Gunawardene–Maharagama)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පසුගිය කාල පරිච්ඡේදය තුළ සිදුවුණු සහ සිදුවන්නට ඉඩ තිබෙන කරුණු පිළිබඳව මේ ගරු සභාවේදී හදිසි තත්ත්වය දීර්ඝ කිරීමේ යෝජනා පිළිබඳ විවාදවලදී අපි අපේ අදහස් කීපවරක් ප්‍රකාශ කර තිබෙනවා. හදිසි නීතිය පනවා ගැනීමෙන් බලාපොරොත්තු වන කටයුතු ඉටු කිරීමට රජය පැත්තෙන් කර නොමැති ක්‍රියාවන් පිළිබඳව කීප වරක් අපි කරුණු ඉදිරිපත් කළා. ගියවර හදිසි තත්ත්වය දීර්ඝ කිරීම පිළිබඳ විවාදය තිබුණු අවස්ථාවේ ඊට පෙරාතුව රජය විසින් ප්‍රකාශ කරන ලද අවි ගැටුම් නතර කිරීමේ එකඟතාවය පිළිබඳව කරුණු ඉදිරිපත් වුණා. ඒ අවස්ථාවේදීත් අපි ආණ්ඩුවෙන් ප්‍රශ්න කළා, මේ අවි ගැටුම් නතර කිරීමේ එකඟතාවය තිම්පු නුවර පැවැත්වෙන සාකච්ඡාවට පෙරාතුව රජය පැමිණි ්‍යකඟතාවයක ස්වභාවයක්ද, එසේ නැතිව රජය ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වී තමන්ගේ හමුදාංක සහ අවි ආයුධ රාජ්‍ය ආරක්ෂාව සඳහා පාවිච්චි නොකිරීමේ ක්‍රියාවලිය ආරම්භ කර තිබෙනවාද කියා. සැබවින්ම අපට පෙනෙන්නට තිබෙන්නේ රජය තම රාජ්‍ය ආරක්ෂාව සඳහා වූ කාර්යභාරය, අවි ගැටුම් නැවැත්වීමේ එකඟතාවය කියන කරුණ මත ඉටු කර නොමැති බවයි.

අගෝස්තු මාසයේ 8 වැනි ද සභාව කල් තබන අවස්ථාවේදී මා ප්‍රශ්නයක් ඉදිරිපත් කළා. ඒ වන විට මේ රටේ උතුරු සහ නැගෙනහිර පළාත්වල– විශේෂයෙන්ම නැගෙනහිර පළාතේ–සංඝයාවහන්සේලාත්, වැඳපුද ගන්නට ආගමික ආයතනවලට ගිය අයත්, ඉතා අමානුෂික විධියට කෲර අන්දමින් ඝාතනය කර දමා තිබුණා. ඒ ප්‍රශ්නයත්, දහස් ගණන් ගම් වැසියන් උපන්හිටි තැන්වලින් පලවා හැරීමේ ද්‍රවිඩ ජාතිවාදී ක්‍රියාදාමය දරුණු ලෙස ක්‍රියාත්මක කරන්නට ඉඩදී රජයේ ක්‍රියාකාරීත්වය නැවතී ඇති බවත්, ඒ පිළිබඳව මහජන ආරක්ෂාව දීම සඳහා රජය අවශ්‍ය නියෝගයන් නොදෙන්නේ ඇයි කියන ප්‍රශ්නයත්, ඒ අවස්ථාවේ අපි ඉදිරිපත් කළා. ඒ අවස්ථාවේදීත් අපට ලැබුණු පිළිතුර අවි ගැටුම් නැවැත්වීමේ එකඟතාවයක් තිබුණත් රජය අවශ්‍ය හමුදා පියවරවල් ගැනීමට නියෝග කර තිබෙනවාය කියන එකයි. ඒ අගෝස්තු මාසයේ 8 වනිදයි. අද අගෝස්තු 23 වැනිදයි. ඉන් පසුවත් ඉතා දරුණු සහ අමානුෂික විධියට මේ රටේ සාමාන්‍ය පුරවැසියන් ඝාතනය කිරීම මේ ත්‍රස්තවාදී කණ්ඩායම් විසින් කරගෙන යනවා. ඝාතකයේ ස්වභාවය කොහොමද කිව්වොත් ඉතාමත් කනගාටුදායක විධියටයි අද ඒ කටයුතු කෙරෙන්නෙ. විශේෂයෙන් සිංහල ජන කොටස් බලහත්කාරයෙන් ගෙන ගොස් පණ පිටින් පුළුස්සා දමන තරමේ අග්‍ර කෲර විධියට හැසිරෙන කොට රාජ්‍ය ආරක්ෂාවට කුමක් වී තිබෙනවාද, හදිසි නීතිය පවතින්නේ කොහේද කියන ප්‍රශ්න අපි අහන්න ඕනැ.

පළමුව තම රටේ ආරක්ෂාව ලබා දීමයි, රජයක යුතුකම වන්නේ. රටේ ජීවත්වන සෑම පුරවැසියෙකුටම මේ රටේ ජීවත් වීමේ අයිතිය ඇති කිරීම සඳහාත් මේ රට ආරක්ෂා කර ගැනීම සඳහාත් කාර්යයන් ඉෂ්ට කිරීමට ආණ්ඩුවට වගකීමක් තිබෙනවා. දහස් ගණනින් මහජනයා මරා දමන විට ආණ්ඩුව බලා ඉන්නවා නම්, සිය ගණනින් මහජනයා පුළුස්සා දමන විට ආණ්ඩුව බලා ඉන්නවා නම්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 9 වෙනි වගන්තිය යටතේ රාජ්‍ය ආගම වූ බුද්ධාගමට තැන දෙනවාය කියන වගන්තිය එළිපිටම උල්ලංඝනය කරමින් අමානුෂික අන්දමින් ක්‍රියා කරගෙන යනවිට ආණ්ඩුව බලා ඉන්නවා නම්, රාජ්‍යයේ යුතුකම රාජ්‍ය පාලනය විසින් ඉටු නොකරනවා නම්, අපි අහන්න ඕනැ අද තමුන්නාන්සේලා හදිසි නීතියක් කියා එකක් පවත්වාගෙන යන්නේ මොකටද කියා.

උතුරු නැගෙනහිර ප්‍රදේශවලට තමුන්නාන්සේලා හදිසි නීතිය පාවිච්චි කරන්න සූදානම් නැත්නම් හදිසි නීතිය ක්‍රියාත්මක කිරීම දීර්ඝ කරන්නට ඉල්ලන්නේ මේ මේවා සඳහාය කියා තමුන්නාන්සේලා ගේ ඔය වට්ටෝරු දීමෙන් වැඩක් නැහැ. අවි ගැටුම් නැවැත්වීමේ එකඟතාව එක් අවස්ථාවකදී දෙසිය වාරයක් කැඩුවා. ඊට පසුව හය සිය වාරයක් කැඩුවා. දැන් වන විට මම හිතන්නේ එක් දහස් වාරයක් කැඩුවාය කියා ප්‍රකාශ කරන්න පුළුවන්. නමුත් මොකක්ද මෙහි ප්‍රතිඵලය ? සාමාන්‍ය පුරවැසියන් මරා දමනවා. ඔවුන් උපන්හිටි තැන්වලින් ගම් නියම්ගම්වලින් පලවා හරිනවා. පොලිස් නිලධාරීන් මරා දමනවා. හමුදාංකවල නිලධාරීන් මරා දමනවා. භික්ෂූන් වහන්සේලා මරා දමනවා. මහජන දේපළට හානි කරනවා, පැහැරගෙන යනවා. මුදල් පැහැරගෙන යනවා. මේ ආකාරයේ මහා විනාශ සිදුකරගෙන යන විට අපේ රටේ ආරක්ෂක බලකායවලට නියෝග කරන්න ඕන එදිනෙද තත්ත්වය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය පියවර ගන්නය කියා. මේ අදහස මම සැමදම ඉදිරිපත් කළා. අදත් එය ඉදිරිපත් කරනවා. ආණ්ඩුව ඒ පළමුවෙනි යුතුකම ඉටු කරන්න ඕනෑ. ඒ යුතුකම ඉටු නොකළොත් මොකද වෙන්නෙ ? අද " සන් " පත්‍රයේ තිබෙනවා ඉන්දියාවේ මදුරාසි ප්‍රාන්තයේ කරුණානිධි මහතා කර තිබෙන ප්‍රකාශයක්. ලංකාව බෙදන්න ඕනෑය, එය පමණයි විසඳුම කියන කරුණානිධිගේ ප්‍රකාශයේ මෙසේ සඳහන් වෙනවා :

**"As Tigers Call For War Karunanidhi wants Lanka partitioned New Delhi, August 22 – A prominent Indian Tamil leader today said a partition of Sri Lanka was the only solution to the Island's festering ethnic problem, and Tamil guerrillas called for an armed struggle to establish a separate state on the Island."**

මේ ප්‍රකාශය මම සම්පූර්ණයෙන් කියවන්න යන්නේ නැහැ. සිරස්තලයෙන් සහ මූල වාක්‍යයෙන්ම පේනවා අද අපේ රටේ කටයුතු පවත්වාගෙන යාම කුමන ආකාරයේ මහා බලපෑමකට අසුවී තිබෙනවාද කියා. අද උතුරු නැගෙනහිර පළාත්වල පමණක් නොවෙයි, ඒ ත්‍රස්තවාදී ප්‍රහාර උතුරු මැද පළාතටත් සංක්‍රමණය වෙන්න පටන්ගෙන තිබෙනවා. අනුරාධපුර දිස්ත්‍රික්කයේ සමහර ගම්වලට සහ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ සමහර ගම්වලටත් අද මේ තත්ත්වය උදා වී තිබෙනවා. ඒ නිසා උතුරු නැගෙනහිර පළාත්වල පමණක් නොවයි, උතුරු මැද පළාතේ රාජ්‍ය පාලනයත් ගමින් ගමට බිඳී යන තත්ත්වයක් උදා වී තිබෙනවා. තමුන්නාන්සේලා අපට කියන්න පුළුවන් තිම්පු සාකච්ඡා නිසා මේ සඳහා කිසිම පියවරක් ගන්න බැහැ කියලා. තමුන්නාන්සේලාගේ රජයේ ප්‍රධානීන් කීප වතාවක්ම ප්‍රකාශ කර තිබෙනවා තිම්පු නුවර මොන විධියේ සාකච්ඡා ගියත් අපි අවි ආයුධව සූදානම් වෙනවාය, අපේ හමුදාංක සැරසෙනවාය මේ කාල පරිච්ඡේදය අපි නිවාඩුවක් හැටියට ගන්නේ නැත කියා. එතකොට ආණ්ඩුව එක පැත්තකින් සාකච්ඡා කෙරෙහි විශ්වාසයක් තබනවා. ඒ වාගේම අනිත් පැත්තෙන් කියනවා සාකච්ඡා කඩ වුණොත් මේ කොටස්වලට එරෙහිව කරන්නට පුළුවන් උපරිමය සඳහා අපි සූදානම් වෙමින් සිටිනවාය කියා. සාකච්ඡාවට යන මිනිසුන් විශ්වාස කරයිද, තමුන්නාන්සේලාව. එක්කෝ තමුන්නාන්සේලා සාකච්ඡාවක් ඇති කරන්න ඕනෑ පළමුවෙන්ම රාජ්‍ය අනසක රටේ ක්‍රියාත්මක කරලයි. එසේ නැත්නම් මහජනතාව සන්තෝෂ කිරීම සඳහා කරන තමුන්නාන්සේලාගේ ඔය ප්‍රකාශයන්, දූන්වත් යම්කිසි වගකීමකින් යුතුව පාලනය කරන්න ඕනෑ. අනුරාධපුරයට ගහන කොට සිංහල ජාතියම භය වෙලයි කියල තමුන්නාන්සේලා කිව්වා. සිංහල ජාතිය භය කරලා, අනුරාධපුරයට ගහලා— අනුරාධපුරයේ බෞද්ධ සිංහල පදනමට, ලංකාවටම පහර දීලා — රටේ ජනයා බිය වුණයි කියල, සාකච්ඡාවකට යන්න ඒ ත්‍රස්තවාදීන්ට ශක්තියක් දී බලන් ඉඳල, අද ඊටත් වඩා ශක්තියක් දෙනවා, ගමින් ගම අතහැර දහස් ගණනින් උන්හිටි තැන් නැතිව සිංහල ජනතාව ප්‍රධානව මුස්ලිම් සහ ද්‍රවිඩ ජනතා කොටස්වලටත් කඳවුරුවල ජීවිතය ගත කරන්නට සැලැස්වීමෙන් ඒ තත්ත්වය උදාවෙලා තිබෙනවා. නමුත් මේ තත්ත්වයට වගකියන්න ඕනෑ කවුද ? මේ තත්ත්වය පාලනය කරන්න උත්සාහ කරන්නෙ නැත්තේ ඇයි ? මා අහන ප්‍රශ්නය ඒකයි. මා ඉල්ලා සිටින්නෙත් ඒකයි. හැම දිස්ත්‍රික්කයේම මේ තත්ත්වය පාලනය කරන්න ඕනෑ. අගෝස්තු 14 වෙනිද මේ රටේ සංඝයා වහන්සේලා, බෞද්ධ සංවිධාන ජාතික සංවිධාන එද අනුරාධපුරයේ කළ අමානුෂික මිනිස් ඝාතනයට තුන් මසක් පිරෙන කොට කොළඹ තුන්මුල්ල හන්දියේ බුද්ධ රූපය ළඟට ඇවිත් —

**වෛද්‍යාචාර්ය පී. එම්. බී. සිරිල් මහතා**
**(வைத்திய கலாநிதி பீ. எம். பி. சிறில்)**
(Dr. P. M. B. Cyril)

හෝන් ගහන්න.

**දිනේෂ් ගුණවර්ධන මහතා**
**(திரு. தினேஷ் குணவர்த்தன)**
(Mr. Dinesh Gunawardene)

හෝන් ගහනවා තමයි. හෝන් ගහනවා ! දහස් ගණනින් මරණ කොට බලන් ඉන්නවා ; මරණ කොට බලන් ඉන්නවා. හෝන් ගහන එක කොලොප්පමකට ගන්නවා. විලිලජ්ජ නැති ආණ්ඩුව මිනී මරණ කොට බලන් ඉඳලා, අද හෝන් ගහන එක විහිළුවට අරන් තියෙනවා.

**වෛද්‍යාචාර්ය පී. එම්. බී. සිරිල් මහතා**
**(வைத்திய கலாநிதி பீ. எம். பி. சிறில்)**
(Dr. P. M. B. Cyril)

බොරු වීරයෝ වගේ මෙතන කෑගහල මොනවා කරන්නද ?

**දිනේෂ් ගුණවර්ධන මහතා**
**(திரு. தினேஷ் குணவர்த்தன)**
(Mr. Dinesh Gunawardene)

බොරු වීරයො නොවෙයි. තමුන්නාන්සේලා දහස් ගණනින් මරා දමන, පුළුස්සා දමන අයට වගකියන්න ඕනෑ. මේ රටේ බෞද්ධ භික්ෂූන් වහන්සේලාට අයිතියක් තියෙනවා, තුන් මුල්ල හන්දියට නොවෙයි (බාධා කිරීමක්) තමුන්නාන්සේලාගේ කෝච්චිය අරගෙන ගියා දවස් දෙකක්. හර්තාල් දවසේ අරගෙන ගියා. එක මනුෂ්‍යයෙක් අත්අඩංගුවට ගන්න තමුන්නාන්සේලාගේ ආණ්ඩුවට බැරි වුණා. නමුත් සිංහලයන්, බෞද්ධයින් තුන්මුල්ල හන්දියට ඇවිත් අනුරාධපුර මිනිස් ඝාතනයට තුන් මාසයක් පිරීම නිමිත්තෙන් තමන්ගේ මානසික විරෝධය පාන විට ආයුධ සන්නද්ධව පොලිස් බල ඇති එවන්න පුළුවන් වුණා. මහා බවුසර්, වාහන වතුර පුරවල හාමුදුරුවරුන්ට වතුර ගහන්න එවුවා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නවවැනි වගන්තියෙන් කියනවා රාජ්‍ය ආගම බෞද්ධාගමය කියල. මෙහෙමද තමුන්නාන්සේලා බෞද්ධාගමට සලකන්නෙ ? සමස්ත ලංකා බෞද්ධ ශිෂ්‍ය සම්මේලනය තමන්ගේ වාර්ෂික සම්මේලනය පැවැත්වීම සඳහා ගිය මාසයේ 18 වැනිද ආනන්ද විද්‍යාලයේ සිට බෞද්ධාලෝක මාවතේ සමස්ත ලංකා බෞද්ධ සම්මේලන ගොඩනැගිල්ලට පෙරහැරකින් එන විට පොලීසියෙන් ඇවිත් කිව්වා පෙරහැර යන්න එපාය කියල. මේ පෙරහැරට ගහන්න පුළුවන්. රටේ තත්ත්වය කොළඹ නගරයේ ආරක්ෂක තත්ත්වය හොඳ නැහැ කියල පෙරහැර නවත්වන්න කිව්ව. නමුත් ඊටපසු දවසක කොටහේනේ සිට බම්බලපිටියට කෝවිල් කරන්නය එතකොට ආරක්ෂක ඇමතිතුමාටත් ජනාධිපතිතුමාටත් පාරට බැහැල, එය පිළිගන්නටත් පුළුවන් තරමට රටේ ආරක්ෂාව තිබුණා. මෙන්න තමුන්නාන්සේලා බෞද්ධ සිංහල සංවිධාන සහ ඒ කටයුතුවලට සලකන අන්දම. කාවඩි කරන්නයට එන්න ආරක්ෂාව තිබුණා. බෞද්ධ ශිෂ්‍ය සම්මේලනයට ආනන්ද විද්‍යාලයේ සිට බෞද්ධාලෝක මාවතට එන්න ආරක්ෂාව නැහැ කියල තමුන්නාන්සේලාගේ ආරක්ෂක බලකායන් කිව්වා නම් එය සම්පූර්ණ බොරුවක්. හිතාමතාම මේ රටේ ජාතික, සිංහල, බෞද්ධ, බලවේගයන්ට එරෙහිව කතගාටුදයක ලෙස ක්‍රියාත්මක වන මේ කුමන්ත්‍රණයෙන් මිදෙන්නය කියන ඉල්ලීමයි අද මම විශේෂයෙන් ආණ්ඩුවෙන් ඉල්ලා සිටින්නෙ. ඒ කොටස් තමයි අද ඝාතනයට පත් වෙන්නේ. එපමණක් නොවෙයි, අද උතුරු නැගෙනහිර පළාත්වලින් ආදයමක් නැහැ. නැගෙනහිර පළාතෙන් ආදයමක් නැහැ. පුනරුත්ථාපන බද්දක් දාලා ආණ්ඩුව මහජනයාගේ පඩියෙන් සියයට එක ගණනේ බලෙන් කැපුවා, අසුතුනේදී වූ සිද්ධියට. අද තමුන්නාන්සේලා බද්දක් දල තිබෙන්නේ කාටද ? මුදල් ඇමතිතුමාගෙන් මම අහන්න ඕනෑ උතුරු නැගෙනහිර පළාත්වල ජනතාව අද බදු ගෙවනවාද කියා ? නැහැ. තමුන්නාන්සේලාගේ රාජ්‍ය පාලනය ඕනෑකමින්ම අද ඒ පළාත්වලින් මිදිලා ගිහිල්ලා තිබෙනවා. ඒ මුදල් එකතු කරන්නට පටන් ගෙන තිබෙනවා ත්‍රස්තවාදී කණ්ඩායම්. ත්‍රස්තවාදී කණ්ඩායම් ඒ පළාත්වල ගෙවල්වලට ගිහිල්ලා ආදයම් බදු එකතු කරනවා. වෙනත් බදු එකතු කරනවා. මේ රටට ලැබෙන්නට ඕනෑ ආදයම ඒ පළාත්වලින් ලැබෙන්නේ නැහැ. මේ තත්ත්වය පාලනය කිරීම සඳහා හමුදාංකවල බලය පාවිච්චි කරන්න බැරි වෙලා තිබෙන්නේ ඇයි ? අපි අහන්නේ ඒකයි.

වවුනියාවේ සිද්ධිය අරගෙන බලන්න. තමුන්නාන්සේලාගේ ආණ්ඩුවේ ප්‍රකාශනයෙන් කිව්වා මේ සිද්ධිය වැරදි සහගත ලෙස ප්‍රසිද්ධ කර තිබෙනවාය කියා. රාජ්‍ය ඇමතිතුමාගේ ප්‍රකාශනය සඳුද ප්‍රවෘත්ති පත්‍රවල පළ වුණා. මොකක්ද අද තත්ත්වය ? ඊයේ තමුන්නාන්සේලාගේ ආණ්ඩුව නියෝග කර තිබෙනවා වවුනියාවේ සිද්ධිය සම්බන්ධයෙන් හමුද නිලධාරීන්ගේ ක්‍රියා පරිපාටිය පරීක්ෂා කිරීම කොමිසමකට පැවරීමට. ආණ්ඩුව දවස් දෙකකට ඉස්සරවෙලා කිව්වා, " මෙකේ සත්‍යතාවයක් නැහැ, මේ කියන දේ අසත්‍යයයි " කියලා. ඊයේ ආණ්ඩුව කියනවා, " ඒ වුණත් දූත් අපිට සැකයි " කියල. අපි කියපු දේ බොරුය කියන එකයි ඒ කියන්නෙ.—අර්ථ නිරූපණය වන්නේ ඒ විධියටයි.—මෙකේ ඇත්තත් තිබෙන්නට පුළුවන්, එම නිසා මේක හොයන්න ඕනෑය කියා හමුද නිලධාරීන්ට එරෙහිව පරීක්ෂණ පවත්වන්නට පටන් ගෙන තිබෙනවා. කවුරු හරි පැමිණිලි ගෙනෙන කොට හමුදාංකවල ක්‍රියාකලාපය මේ ආකාරයෙන් පරීක්ෂණයට භාජනය කරලා හමුදවල නිලධාරීන් සහ සොල්දාදුවන්ව මේ විධියට යුද්ධ අධිකරණයට පමුණුවා පරීක්ෂණවලට භාජන කරන කොට, ඒ හමුද භටයින්ට සිය කාර්ය භාරය විශ්වාසයකින් කැපවීමකින් යම්කිසි වගකීමකින් යුක්තව කරන්නට පුළුවන් වේය කියලා තමුන්නාන්සේලා විශ්වාස කරනවාද ? ඒ ගැන මොහොතකටවත් කල්පනා කරන්න.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[දිනේෂ් ගුණවර්ධන මහතා]

සිංහල අය සිය ගණනින් මරලා, උන් හිටි තැන් නැති කරලා, පුළුස්සා දමන කොට කිසිම දෙයක් නැහැ. වවුනියාවේ සිද්ධියක් සිද්ධ වුණාය කියලා ඒක මහ ලොකු පරීක්ෂණයකට භාජන කර තිබෙනවා. මෙන්න මේ තත්ත්වයන් ගැනයි මම අදත් මේ හදිසි නීතිය පිළිබඳ විවාදයේදී නමුන්නාන්සේලාගෙන් අහන්නේ.

ත්‍රස්තවාදී කොටස්වල ක්‍රියාකලාපය ගැන බලන විට, ඔවුන් පළමුව සැහවි හමුදංකවලට සහ රජයේ නිලධාරීන්ට පහර දුන්නා. ඊට පස්සේ සංවිධානාත්මකව සැලසුම් සහගතව, බෝම්බ සහ විවිධ ' ග්‍රෙනේඩ් ' ප්‍රහාර එල්ල කරන්නට පටන් ගත්තා. ඊට පස්සේ හමුදාවලට පහර දෙන්නට පටන් ගත්තා. පසුගිය අවුරුදු එකහමාරක දෙකක කාල පරිච්ඡේදය තුළ අදියරෙන් අදියර ඔවුන්ගේ යුද්ධ උපක්‍රම දියුණු කරන ආකාරය අපි බලාගෙන ඉඳලා තිබෙනවා. රජයේ උපක්‍රම ගැන බලනවිට අපිට කථාවෙන් කියලා තියෙනවා මේවා කරනවාය අරවා කරනවාය කියලා. ඒ ත්‍රස්තවාදී කොටස් අද ප්‍රසිද්ධියේ හමුද බලකායයන් හැටියට ඇවිත් ප්‍රසිද්ධියේ ක්‍රියා කරනවා. ඒකයි අද තත්ත්වය. මේ අනිත් බලනවිට අද මේ රටේ ඉතා භයානක තත්ත්වයක් තිබෙන්නේ. අඩුවශයෙන් මේ රටේ එදිනෙද තත්ත්වය යථා තත්ත්වයට ගෙන එන්නටවත් මේ හදිසි නීතිය පාවිච්චි කරන්න ඕනැ.

තිම්පු සාකච්ඡා පිළිබඳව කුමන තත්ත්වයක් තිබෙනවාද කියලා අද වනතුරු අපට දැන ගන්නට නැහැ. නමුත් ප්‍රසිද්ධ ප්‍රකාශ තුළින් අපි එක කාරණයක් දන්නවා. තිම්පු සාකච්ඡා අද ඇණහිට තියෙනවා. ඇණ හිටින්නට මත්තෙන් රජය පැත්තෙන් ඉදිරිපත් කළාය කියන අදහසක් අගෝස්තු මාසයේ 22 වනද ' සන් ' ප්‍රවෘත්ති පත්‍රයේ තියෙනවා :

"LANKA PREPARED TO DISCUSS CWC PROPOSALS

Sri Lanka has indicated that it is prepared to discuss the Ceylon Workers' Congress proposals that were placed before the All Party Conference in Colombo in November paving the way for resumption of talks in Thimpu late this week, says the Madras Hindu of Tuesday.

The report adds: 'The proposals to solve the ethnic issue, put forward by the Lankan Minister, S. Thondaman, provide for a separate linguistic region for north and east and another region for the plantation labourers of Indian origin in the central highland of the island. These linguistic regions would be called regional councils and would have powers to enforce law and order in their regions.

The proposals were presented to Foreign Secretary, Romesh Bhandari by the leader of the Sri Lankan delegatio, Dr. Hector Jayewardene'."

නමුන්නාන්සේලා තව අදියරක් එහාට ගිහිල්ලාත් තිම්පු සාකච්ඡා පටන්ගන්න උත්සාහ කළා. නමුන්නාන්සේලා ඒ යෝජනාව කරලාත්, ඒ යෝජනාව කළ අවස්ථාවේ තිබුණු තත්ත්වයට වඩා එහාට නමුන්නාන්සේලා ගිහිල්ලාත් සාකච්ඡා කරන්න ලෑස්ති වුණත් සාකච්ඡාව ආරම්භ කරන්නට බැරි වුණා. ඒ අනුව අද මේ සාකච්ඡාව ඇදෙමින් යන්නේ ඉතාම භයානක තත්ත්වයක් තුළයි. මම කියන්නේ ඒකයි.

මම ආණ්ඩුවෙන් අද විශේෂයෙන් එක් ප්‍රශ්නයක් අහනවා. මේ සාකච්ඡා ඇන හිටියත් රජය පැත්තෙන් සිය කැමැත්තෙන් පාර්ශ්ව දෙකක් නැතිව එක් පාර්ශ්වයක් ඉතුරු වුණත් ආණ්ඩුව හැටියට ආණ්ඩු පාර්ශ්වය විතරක් සූදානම් වෙනවාද යම් යම් තීරණ ප්‍රකාශයට පත් කර ඒවා ක්‍රියාත්මක කිරීම ආරම්භ කරන්න ගිවිසුමක් නැතිව ? ආණ්ඩුව සිය කැමැත්තෙන් අවි ආයුධ බිම තිබ්බා වාගේ සූදානම් වෙනවාද සිය කැමැත්තෙන් මේ තත්ත්වයන් තුළ යම් යම් බලතල පැවරීම සඳහා තනියම ක්‍රියා කරනවාය කියන්න ? ඒකටද රජය ලෑස්ති වන්නේ කියන ප්‍රශ්නයයි මම අහන්නේ. අපි එය පැහැදිලිව අහනවා. කිසිම පාර්ශ්වයක් එකඟ නොවන ගිවිසුමකට ආණ්ඩුව යනවාද නැද්ද කියන දේ ප්‍රසිද්ධියේ ප්‍රකාශ කරතොත් ඒක ඉතාම හොඳයි. ඒ වාගේ භයානක තත්ත්වයකට ආණ්ඩුව එන්නේ.

රජය මේ තත්ත්වයට උත්තර දෙන්නේ නැත්නම් අපට සැක හිතෙන්න පුළුවන් රජය විසින්ම ප්‍රාන්ත ආණ්ඩු ඇති කරන්නට ප්‍රාන්ත ස්වෛරීභාවය ප්‍රකාශයට පත් කර ඒ අනුව නීති ක්‍රියාමාර්ග ආරම්භ කරන්නට බලාපොරොත්තු වෙනවාය කියා. මේකයි මේකේ තිබෙන භයානක තත්ත්වය.

සාකච්ඡා ඇනහිට තිබෙනවා. අපි දන්නවා, ඉන්දියානු ගුවන් සේවා යාත්‍රාව තිම්පු නුවර ත්‍රස්තවාදී කණ්ඩායම් ගෙන යැමට තිබුණා. නමුත් ත්‍රස්තවාදී කණ්ඩායම් කීපයක් තිම්පු නුවර වෙනත් වාණිජ යාත්‍රාවක නැග ඉන්දිය ගුවන් හමුදාවටත් හොරෙන් කල්කටාවට ඇවිත් තමයි මද්‍රාසියට ආවේ. අපි හිතනවාට වඩා දරුණු අන්දමට ඒ අය තමන්ගේ ස්වයං ක්‍රියාමාර්ග සඳහා ඇදී යනවා.

. මම මේ කරුණු ටික විශේෂයෙන් මතක් කළේ හදිසි නීතිය දීර්ඝ කරගෙන – කරගෙන පැමිණියත් මේ රටේ සිංහල ජනතාවගේ වේවා සමස්ත ජනතාවගේ වේවා ජීවිත ආරක්ෂා කරන්නට බැරි තත්ත්වයකට ආණ්ඩුව ඇවිත් තිබෙන බව පෙන්නුම් කරන්නටයි. නමුන්නාන්සේලා යෝජනාවෙන් යෝජනාවට මේ රටේ ප්‍රාන්ත හෙවත් පළාත් ආණ්ඩු ඇති කිරීමේ තත්ත්වයට ක්‍රියාත්මක වන්නට පටන්ගෙන තිබෙනවා. මෙන්න මේ තත්ත්වයෙන් මිදී මහජන මතයට එරෙහිව කිසිදු ක්‍රියමාර්ගයකට අවතීර්ණ නොවන ලෙස මම නැවතත් මේ හදිසි නීති විවාදයේදී ඉල්ලා සිටිනවා.

අවසාන වශයෙන් මේ වේලාවේදී මම කියන්න ඕනැ නමුන්නාන්සේලා බැංකු සේවකයන්ට සැලකූ අන්දම ගැන. ඒ අය නීත්‍යානුකූලව කටයුතු කළා. ගිය නොවැම්බර් මාසයේදී ගරු මුදල් ඇමතිතුමා කිව්වා, " දැනට බැංකු සේවකයන්ගේ ඉල්ලීම් පිළිබඳව සාකච්ඡාවක් යනවා. ඒ සඳහා විශේෂ නිලධාරියෙක් පත්කර තිබෙනවා. ඒ සාකච්ඡාවේ වාර්තාව ලැබුණාම ඒ සඳහා ක්‍රියාමාර්ගයක් ගන්නවාය " කියා. නමුත් මොකක්ද තත්ත්වය ? ඒ වාර්තාව දුන්නාද නැද්ද යන්න ගැන විවිධ තැන්වල විවිධ ප්‍රකාශ දැන් කෙරෙනවා. ඒ අනුව බැංකු සේවකයන් තම අදහස් කියා පෑම සඳහා දවසක් සවස තුනට වැඩ අත්හැර කෙටි විරෝධයක් පෑම සඳහා ක්‍රියාමාර්ගයක් ගත්තා. නමුන්නාන්සේලා එය නීති විරෝධී කරලා හදිසි නීතිය පාවිච්චි කර බැංකු සේවකයන්ගේ ප්‍රධාන නිලධාරීන් අත්අඩංගුවට ගත්තා. නමුන්නාන්සේලා හදිසි නීති රෙගුලාසි පාවිච්චි කළා. ඒ අය ඉල්ලීමක් විතරයි කළේ. දිනක් වැඩ වර්ජනයක් කළේ නැහැ. දීර්ඝ කාලීන වැඩ වර්ජනයක් ප්‍රකාශයට පත් කළේ නැහැ. තමන්ගේ විරෝධය පෑවා විතරයි. නොවැම්බර් මාසයේදී මුදල් ඇමතිතුමා දුන් පොරොන්දුවක් තිබුණා. මුදල් ඇමතිතුමා මේ ගරු සභාවේදී කීවා, ඒ වාර්තාව ලැබුණාම ඒ ඉල්ලීම් ගැන රජය සලකා බලනවාය කියා. සමහර බැංකු මේ ඇතැම් ඉල්ලීම් ඉටු කිරීම සඳහා තමන්ගේ වාර්ෂික වැය ශීර්ෂ යටතේ මුදල් පවා වෙන් කර තිබුණා. එහෙම තත්ත්වයක් තිබියදී තමයි, රජය බැංකු සේවකයන්ට අර විධියට සලකා තිබෙන්නේ. එහෙම නම් නමුන්නාන්සේලා මේ හදිසි නීති පාවිච්චි කරන්නේ කාට එරෙහිවද ?

සංඝයා වහන්සේලා කොළඹ නගරයට එන විට රජය හදිසි නීති පාවිච්චි කරනවා. එහෙම නම් රජය සංඝයා වහන්සේලාට විරුද්ධව හදිසි නීති පාවිච්චි කරනවා. ඒ වාගේම බෞද්ධ ශිෂ්‍ය සම්මේලනයට විරුද්ධව හදිසි නීති පාවිච්චි කරනවා. මොනරාගල ප්‍රදේශයේ ගොවි ජනතාව තමන්ගේ ගේ – දොර දිනපතා බුල්ඩෝසර්වලින් විනාශ වී යැමට විරුද්ධව නැඟී සිටින විට ඔවුන්ට විරුද්ධව හදිසි නීති පාවිච්චි කරනවා. එහෙම නම් මේ රජය අද වැඩි හරමක් හදිසි නීති පාවිච්චි කරන්නේ මාස්පතා හදිසි නීති දීර්ඝ කර ගැනීම සඳහා මේ ගරු සභාව ඉදිරියේ තබන හේතු සඳහා නොවෙයි මේ හදිසි නීති පාවිච්චි කරන්නේ. මේ රටේ ආරක්ෂාව, මේ රටේ ඒකීයභාවය, මේ රටේ මහජනතාවගේ එදිනෙද ජීවිතය හා පරිපාලනය පවත්වාගෙන යැම සහතික කිරීම සඳහා නොවේ නම් මේ විධියට මාස්පතා හදිසි නීති දීර්ඝ කිරීමේ අවශ්‍යතාවක් නැති බව මා පෙන්වා දෙන්න කැමතියි. මේ රජය අද හදිසි නීති පාවිච්චි කරන්නේ මේ රටේ ආරක්ෂාව, ජනතාවගේ එදිනෙද ජීවිතය පවත්වාගෙන යැම සහතික කිරීමට නොව මේ රටේ වැඩ කරන ජනතාවගේ අත – පය බඳින්න නම්, විරුද්ධ පාර්ශ්වය දඩයම් කරන්න නම්, තමන් වෙත ඉදිරිපත් වන ඉල්ලීම් මර්දනය කරන්න නම් ඊට විරුද්ධ වන්න අපට සිදු වෙනවා.

ඒ නිසා මම ඉතා ඕනෑකමින් කියා සිටින්නේ, මේ හදිසි නීති පාවිච්චි කරන්න අදහස් කරන්නේ රටේ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා නම් දැන් උතුරු – නැගෙනහිර පළාත් පමණක් නොව උතුරු මැද පළාතට පවා පැතිරී ගොස් තිබෙන ද්‍රවිඩ ජාතිවාදී ත්‍රස්තවාදී ක්‍රියාදාමයන්ට මුහුණදීම සඳහා එය මෙල්ල කිරීම සඳහා ඒ පළාත්වල රාජ්‍ය පරිපාලනය හා මහජනතාවගේ එදිනෙද පැවැත්ම යථා තත්ත්වයට පත් කිරීම සඳහා ක්‍රියා කරන ලෙසයි. නමුත් අද එය ක්‍රියාත්මක වන්නේ ඒ සඳහා නොවෙයි. අද පවතින තත්ත්වයෙන් හෙළි වන්නේ මොකක්ද ? අද රට අරාජිකයි. උතුරට යන දුම්රියක් නැවත ආපසු එයිද කියන්න දන්නේ නැහැ. අද ඒ පළාත්වල තැපැල්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සේවයක් ඇත්තේ නැහැ ; ආදයම් බදු එකතු වන්නේ නැහැ ; එදිනෙද රාජ්‍ය පරිපාලන කටයුතු සිද්ධ වන්නේ නැහැ ; උප දිසාපති කාර්යාල වැඩ කරන්නේ නැහැ. ඒ පළාත්වල ධීවරයන්ට මසුන් මරන්න නිදහසක් නැහැ ; බෞද්ධ භික්ෂූන් වහන්සේලාට තමන්ගේ පන්සල්වල ඉන්න නිදහසක් නැහැ ; ආගම දේශනා කරන්න නිදහසක් නැහැ ; සිංහල ජනයාට තමන්ගේ ගෙවල්වල ජීවත් වන්න විශ්වාසයක් නැහැ. එහෙම නම් තමුන්නාන්සේලා මේ හදිසි නීතිය දීර්ඝ කරගෙන කරන්නේ කුමක්ද කියන ප්‍රශ්නය අහන්න අපට සිදු වෙනවා. මේ තත්ත්වය මෙල්ල කිරීම සඳහා, රටේ පාලනය නැවත වරක් යථා තත්ත්වයට ගෙන ඒම සඳහා, මේ රටේ දැනට ත්‍රස්තවාදීන් අතින් සිදු වන අමානුෂික ක්‍රියාවන් වැළැක්වීම සඳහාවත් අඩු තරමින් මේ හදිසි නීතිය පාවිච්චි කරන හැටියට මම ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිනවා.

නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට ලැබී තිබෙන කාලය අනුව මම මීට වඩා කථා කරන්න අදහස් කරන්නේ නැහැ. නමුත් අවසාන වශයෙන් කිව යුතු දෙයක් තිබෙනවා. අද ඇති වෙගෙන. යන තත්ත්වයන් තුළ අපට දකින්න තිබෙනවා මේ රට අනිවාර්යයෙන්ම ජාතීන් අනුව පළාත් බෙදුමකට තැඹුරු වන තත්ත්වයක් අවසානයේදී ඇති වන ආකාරයක්. ඒ නිසා, රජය අද මේ පාර්ලිමේන්තුවෙන් ලබා ගන්නා වරම අනුව පාවිච්චි කරන්න බලාපොරොත්තු වන හදිසි නීතිය මේ රටේ ආරක්ෂාවත්, ජනතාවගේ ආරක්ෂාවත්, රටේ භෞමික අඛණ්ඩතාවත් සඳහා හරියාකාරව පාවිච්චි කරන හැටියට මම ඉල්ලා සිටිනවා. එසේ නොවුණොත් තමුන්නාන්සේලා මේ හදිසි නීතිය දික් කර ගැනීම සඳහා ලබා ගත්තාවූ අති මහත් බහුතර ඡන්දයේ අනුමැතිය කිසි සේත් අර්ථවත් වන්නේ නැහැ. එයින් සිද්ධ වන්නේ, ජනතාවගේ අයිතිවාසිකම් වැළලී යෑමක් පමණයි.

ඒ ටික මතක් කරන අතර අවසාන වශයෙන් මම නැවතත් රජයෙන් අහනවා, අද ඇති වී තිබෙන තත්ත්වයන් තුළ රජය ප්‍රකාශ කරන්න සූදනම් වන්නේ යම් - යම් විසඳුම් වෙනත් පාර්ශවයන් සමඟ ගිවිසුමක් නැතිවම තනිව සිය කැමැත්තෙන්ම ඉදිරිපත් කිරීමක්ද කියා. එසේ කළොත් එය ඉතාම කනගාටුදයක තත්ත්වයක් බව කියන්න ඕනෑ. එවැනි තත්ත්වයක් ඇති කිරීම තුළින් තමුන්නාන්සේලා අවතීර්ණ වන්නේ මේ රට - ජාතිය ඉතා කනගාටුදයක විනාශයකට ගොදුරු කිරීමකට බව ප්‍රකාශ කරන්න ඕනෑ. ඒ බැවින් මේ හදිසි නීතිය එහි මුඛ්‍ය පරමාර්ථය සඳහා පාවිච්චි නොකරන අතර ඒ හදිසි නීති වරම අරගෙන ඊට කිසි සේත් සම්බන්ධ නැති කොටස් මර්දනය කිරීම සඳහා එය පාවිච්චි කිරීම ගැන මේ අවස්ථාවේදී මගේ දැඩි විරුද්ධත්වය ප්‍රකාශ කරනවා. මේ විධියට හදිසි නීතිය පාවිච්චි කරනවා නම් ඊකට විරුද්ධ වන්න අපට සිද්ධ වෙනවාය කියන ටික මතක් කරමින් මම නිහඬ වෙනවා.

ආ. භා. 2.30

**වෛද්‍යාචාර්ය පී. එම්. බී. සිරිල් මහතා (හම්බන්තොට දිසා ඇමතිතුමා)**
**(வைத்திய கலாநிதி பீ. எம். பி. சிறில்—ஹம்பாந்தோட்டை மாவட்ட அமைச்சர்)**
(Dr. P. M. B. Cyril – District Minister. Hambantota)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, හදිසි නීතිය දීර්ඝ කිරීමේ විවාදයට සහභාගිවන්නට අවස්ථාව සලසාදීම ගැන මම එතුමාට ස්තුතිවන්ත වෙනවා. 1982 ජනමත විචාරණයේදීත්, ජනාධිපතිවරණයේදීත්, හම්බන්තොට දිස්ත්‍රික්කයෙන් අපේ පක්ෂයට සියයට 50ක ඡන්දය නොලැබීමේ හේතුවෙන් හම්බන්තොට දිස්ත්‍රික්කයේ සියලුම ආසනවල අතුරු මැතිවරණ පවත්වනු ලැබුවා. ඒ අතුරු මැතිවරණය ජයග්‍රහණය කර අපි මේ සභාවට පැමිණියේ හදිසි නීතිය දීර්ඝකිරීමේ සාකච්ඡාවකට සහභාගිවීමටයි. අපි එද සිට සෑම මාසයකම මේ ගරු සභාව තුළින් හදිසි නීතිය දීර්ඝ කිරීමේ අවසරය පතනවා. ඒ වාගේම ඒ අවසරය පතන්නේ තුනෙන් දෙකක ඡන්දයක් මගිනුයි.

දෙවෙනිවරටත් අපි පාර්ලිමේන්තුවට පැමිණි දවසේම පැමිණි මහරගම ගරු මන්ත්‍රීතුමා (දිනේශ් ගුණවර්ධන මහතා) මේ හදිසි නීතිය දීර්ඝ කිරීම ගැන එද සිටම කෑගහනවා. නමුත් අපට නම් පෙනෙන්නට නැහැ මේ විරුද්ධ පක්ෂයෙන්, උතුරු නැගෙනහිර පළාත්වල ඇතිවී තිබෙන මේ ප්‍රශ්නය විසඳන්නට, කිසිම අන්දමක සංවිධානාත්මක උදව්වක් රජයට ලැබුණාය කියා.

**ආනන්ද දසනායක මහතා (කොත්මලේ)**
**(திரு. ஆனந்த தஸநாயக்க — கொத்மலே)**
(Mr. Ananda Dassanayake–Kotmale)

මොකක්ද ඕනෑ කරන උදව්ව ?

**වෛද්‍යාචාර්ය පී. එම්. බී. සිරිල් මහතා**
**(வைத்திய கலாநிதி பீ. எம். பி. சிறில்)**
(Dr. P. M. B. Cyril)

උදව්ව, තමුන්නාන්සේලා ගිහිල්ලා මේක විකෘතිකරන්නේ නැතුව ඉන්න එක.

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
(Mr. Lakshman Jayakody)

කවිද විකෘති කළේ ?

**වෛද්‍යාචාර්ය පී. එම්. බී. සිරිල් මහතා**
**(வைத்திய கலாநிதி பீ. எம். பி. சிறில்)**
(Dr. P. M. B. Cyril)

තමුන්නාන්සේලා මේ හතරමං හන්දි ගාණේ වාඩිවෙලා, හැම වේදිකාවක් ගානේම ගිහිල්ලා මිනිසුන් කුල්මත් කරන එක. ඒක විකෘති කිරීමක් තමයි. තමුන්නාන්සේලා ඇත්ත වශයෙන්ම විරුද්ධ පක්ෂය හැටියට අද ඉන්දියාවේ විරුද්ධ පක්ෂය ඒ රජයට දෙන සහයෝගය මේ රජයට දෙනවාද ? විරුද්ධ පාර්ශවයේ ගරු නායකතුමා තමන්ගේ පපුවට තට්ටු කර බලා කියන්න, අද ඉන්දියාවේ විරුද්ධ පක්ෂය ඒ රජයට දෙන සහයෝගය තමුන්නාන්සේලා මේ රජයට දෙනවාද කියා.

**අනුර බණ්ඩාරනායක මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
**(திரு. அனுர பண்டாரநாயக்க — எதிர்க்கட்சி முதல்வர்)**
(Mr. Anura Bandaranaike–(Leader of the Opposition)

මොකක්ද ඉල්ලන සහයෝගය ?

**වෛද්‍යාචාර්ය පී. එම්. බී. සිරිල් මහතා**
**(வைத்திய கலாநிதி பீ. எம். பி. சிறில்)**
(Dr. P. M. B. Cyril)

කිසිම සහයෝගයක් ලැබෙන්නෙ නැහැ තමුන්නාන්සේලාගේ, රජයට.

**අනුර බණ්ඩාරනායක මහතා**
**(திரு. அனுர பண்டாரநாயக்க)**
(Mr. Anura Bandaranaike)

මොකක්ද ඉන්දියාවේ දෙන සහයෝගය ?

**වෛද්‍යාචාර්ය පී. එම්. බී. සිරිල් මහතා**
**(வைத்திய கலாநிதி பீ. எம். பி. சிறில்)**
(Dr. P. M. B. Cyril)

ඉන්දියාවේ පන්ජාබ් ප්‍රශ්නය විසඳන අවස්ථාවේදී – [Interruption]

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
**(குழு உப தலைவர்)**
(The Deputy Chairman of Committees)

Order, please ! hon. Member for Kotmale, you can follow him later. Then I will give an opportunity to the hon. Member for Akmeemana also to speak, but let him continue his speech.

**අනුර බණ්ඩාරනායක මහතා**
**(திரு. அனுர பண்டாரநாயக்க)**
(Mr. Anura Bandaranaike)

A question is asked and we are answering his question.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
**(குழு உப தலைவர்)**
(The Deputy Chairman of Committees)

I have given him only 15 minutes to speak.

**අනුර බණ්ඩාරනායක මහතා**
**(திரு. அனுர பண்டாரநாயக்க)**
(Mr. Anura Bandaranaike)

I am not bothered about the length of time that he has been given. He asked me a specific question and I have answered the question. Please, ask him not to ask questions.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
(Mr. Lakshman Jayakody)

What is the question ?

**වෛද්‍යාචාර්ය පී. එම්. බී. සිරිල් මහතා**
**(வைத்திய கலாநிதி பீ. எம். பி. சிறில்)**
(Dr. P. M. B. Cyril)

ඉන්දියාවේ අගමැතිතුමාට පන්ජාබ් ප්‍රශ්නය විසඳන්න විරුද්ධ පක්ෂයෙන් මොනතරම් සහයෝගයක් ලැබුණාද. අද තමුන්නාන්සේලා එවැනි සහයෝගයක් මේ රජයට දෙන්නේ නැති විත්තිය මුළු මහත් රටම දන්නා එකක්.

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
(Mr. Lakshman Jayakody)

එහේ ආණ්ඩුව කියනවා ඡන්දයක් ඕනෑ කියලා. විරුද්ධ පක්ෂය කියනවා ඡන්දයක් එපා කියලා. මේ දෙක පරස්පර විරෝධියි. දන්නෙ නැති ඒවා ගැන කථා කරන්න එපා.

**අනුර බණ්ඩාරනායක මහතා**
**(திரு. அனுர பண்டாரநாயக்க)**
(Mr. Anura Bandaranaike)

හම්බන්තොට ගරු දිසා ඇමතිතුමාට මම කියන්න කැමතියි, රජයෙන් කිසිම දවසක කිසිම අවස්ථාවකදී විරුද්ධ පක්ෂයේ සහයෝගය ඉල්ලා නැති බව, අද වෙනතුරු.

**වෛද්‍යාචාර්ය පී. එම්. බී. සිරිල් මහතා**
**(வைத்திய கலாநிதி பீ. எம். பி. சிறில்)**
(Dr. P. M. B. Cyril)

අපි හැමදාමත් ඉල්ලනවා.

**අනුර බණ්ඩාරනායක මහතා**
**(திரு. அனுர பண்டாரநாயக்க)**
(Mr. Anura Bandaranaike)

ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ අනාථ වුණු සිංහල ජනතාව ගැන මම ජනාධිපතිතුමාට ලිව්වාම මට එව් පිළිතුරෙන් මොකක්ද කිව්වෙ ? තමුන්නාන්සේලාගේ උපදෙස් අවවාද මට ඕනෑ නැහැ කියලයි. ඉතින් කොහොමද අපි සහයෝගය දෙන්නේ ? කරුණාකරලා මට පිළිතුරක් දෙන්න.

**වෛද්‍යාචාර්ය පී. එම්. බී. සිරිල් මහතා**
**(வைத்திய கலாநிதி பீ. எம். பி. சிறில்)**
(Dr. P. M. B. Cyril)

තමුන්නාන්සේලා ඒ වෙනුවට ඉල්ලන්නෙ මැතිවරණයක්. මේ ප්‍රශ්නය ශ්‍රී ලංකා නිදහස් පක්ෂය, එක්සත් ජාතික පක්ෂය කියා පක්ෂ වශයෙන් නොවෙයි, සිංහලයන් වශයෙන් කාටත් බලපාන ප්‍රශ්නයක්.

**අනුර බණ්ඩාරනායක මහතා**
**(திரு. அனுர பண்டாரநாயக்க)**
(Mr. Anura Bandaranaike)

මැතිවරණ පැත්තකින් තියන්න. උපදෙස් දුන්නාම එපා කිව්වාම කොහොමද සහයෝගයක් දෙන්නෙ ?

**වෛද්‍යාචාර්ය පී. එම්. බී. සිරිල් මහතා**
**(வைத்திய கலாநிதி பீ. எம். பி. சிறில்)**
(Dr. P. M. B. Cyril)

අපි අද තමුන්නාන්සේලාගෙන් විරුද්ධ පක්ෂය හැටියට ඉල්ලන්නෙ මේකයි. අද මේ ප්‍රශ්නය ප්‍රජාතන්ත්‍රවාදයේ අවසානය වෙන්න පුළුවන්. ඒ නිසා පක්ෂ භේදයෙන් තොරව සිංහලයන් හැටියට, බෞද්ධයන් හැටියට මේ අවස්ථාවේදී එය විසඳන්නට සහයෝගය දීමයි තමුන්නාන්සේලාගේ යුතුකම. අද බද්දේගම ගරු මන්ත්‍රීතුමාගේ (අමරසිරි දොඩන්ගොඩ මහතා) කථාවේදී සියලුම දේශපාලන පක්ෂ එකතුවෙලා සාකච්ඡාවක් ඇතිකරමු කියා ඉල්ලීමක් කළා. අපි කැඳෙව්වෙ නැද්ද තමුන්නාන්සේලාව සර්ව පාක්ෂික රැස්වීමට ? සියලුම දේශපාලන පක්ෂ කැඳවා සාකච්ජාවක් පැවැත්වුවේ නැද්ද ? ශ්‍රී ලංකා නිදහස් පක්ෂය තමයි කිව්වෙ ඔක්කොම පක්ෂ කැඳවා සාකච්ජා කරමු කියා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නායිකාවගේ ඉල්ලීම උඩ අනිකුත් ද්‍රවිඩ පක්ෂවල නායකයනුත් කැඳෙව්වා. නමුත් තමුන්නාන්සේලා ඊට පසුව එක රැස්වීමටයි සහභාගි වුණේ. ඊට පසුව එළියට ගියා එදා සිටම තමුන්නාන්සේලා නොයෙකුත් විවේචන කරමින් ඒ හැම එකක්ම කඩාකප්පල් කරන්න නොවෙයිද කතා කරන්නෙ ? මේ තිම්පු සාකච්ජාව අසාර්ථක වේවා කියන ප්‍රාර්ථනාව තමුන්නාන්සේලා හිත යටින් කළේ නැද්ද ? තමුන්නාන්සේලා යන මාර්ගය අපට පේනවා. හැම දෙයක්ම කඩාකප්පල් කරන්නයි තමුන්නාන්සේලා හදන්නේ.

**අනුර බණ්ඩාරනායක මහතා**
**(திரு. அனுர பண்டாரநாயக்க)**
(Mr. Anura Bandaranaike)

හය හතර තේරෙන අවුරුදු පහක කුඩා ළමයෙක් වුනත් දන්නවා මේ තිම්පු සාකච්ජා සාර්ථක වෙන්නෙ නැති බව.

**වෛද්‍යාචාර්ය පී. එම්. බී. සිරිල් මහතා**
**(வைத்திய கலாநிதி பீ. எம். பி. சிறில்)**
(Dr. P. M. B. Cyril)

තමුන්නාන්සේලා ප්‍රාර්ථනා කළේ ඒක නොවෙයිද ? ඔකට නොවෙයිද තමුන්නන්සේලා ඔය තුන්මං හන්දියේ රැස්වීමක් තිබ්බෙ ? හෝන් ගහන්නයි කියා ජනතාවට කිව්වේ ඒක නිසා නොවේද ? මෙවැනි අවස්ථාවකදී විරුද්ධ පක්ෂයේ නායකත්වය කෙසේ වෙතත් නියම නායකයන් හැටියටද, නියම සිංහලයන් හැටියටද, බෞද්ධයන් හැටියටද තමුන්නාන්සේලා ක්‍රියා කළේ ? බෞද්ධ භික්ෂූන් වහන්සේලා කැඳවාගෙන ගිහින් තුන්මුල්ල හන්දියේ තියාගෙන සත්‍යග්‍රහ කිරීම මේවාගේ අවස්ථාවකදී සුදුසු ක්‍රියාවක්ද කියන එක තමුන්නාන්සේ කියන්න.

**අනුර බණ්ඩාරනායක මහතා**
**(திரு. அனுர பண்டாரநாயக்க)**
(Mr. Anura Bandaranaike)

මහ ලොකුවට සිංහලයන් ගැන කථා කරනවා. අද සිංහල ජනතාව හතළිස් දහසක් අනාථ කඳවුරුවල. ලංකා ඉතිහාසයේ පළමු වතාවට සිංහල ජනතාව හතළිස් දහසක් අනාථ කඳවුරුවල. මහ ලොකු බෞද්ධයෝ.

**වෛද්‍යාචාර්ය පී. එම්. බී. සිරිල් මහතා**
**(வைத்திய கலாநிதி பீ. எம். பி. சிறில்)**
(Dr. P. M. B. Cyril)

හරි! ඒකද තමුන්නාන්සේලා ඒ විධියට ක්‍රියා කළේ. ? ඒ ක්‍රියා කිරීම තුළින් තමුන්නාන්සේලාට විසඳුමක් ඇති වෙනවාද ? පල් වුණු එක නොවෙයි. ඇත්ත වශයෙන්ම සිංහලකමට, බෞද්ධකමට, ප්‍රජාතන්ත්‍රවාදී විරුද්ධ පක්ෂ නායකයන් හැටියට එවැනි දේවල් කරන්නට තමුන්නාන්සේලාට යුතුකමක් තිබෙනවාද ? අද රජයක් හැටියට මේ ප්‍රශ්නය විසඳීමට—[බාධා කිරීමක්]

**රිචඩ් පතිරණ මහතා**
**(திரு. றிச்சட் பத்திரன)**
(Mr. Richard Pathirana)

හාමුදුරුවන් මරණ එක හොඳයි. පූජා තියන එක තමයි නරක. හාමුදුරුවරුන් කෑලි කෑලිවලට කපා මරන එක හොඳයි. බිම වාඩි වෙන එක නරකයි.

**වෛද්‍යාචාර්ය පී. එම්. බී. සිරිල් මහතා**
**(வைத்திய கலாநிதி பீ. எம். பி. சிறில்)**
(Dr. P. M. B. Cyril)

හොඳය කියල කියා තිබෙන්නේ කවදද ? තමුන්නාන්සේලා සිංහලයන් නම්, තමුන්නාන්සේලා බෞද්ධයන් නම්, තමුන්නාන්සේලා ප්‍රජාතන්ත්‍රවාදයට කැමති උදවිය නම් විරුද්ධ පාර්ශ්වය කියන එක අමතක කර දමා රජයට සහයෝගය දීම තුළින් නේද මේ රට ආරක්ෂා කර ගන්නට පුළුවන් වන්නේ. ඔය විධියට හැම වේදිකාවක් ගානේම ගිහින් තමුන්නාන්සේලා වපුරන්නේ වෛරය නොවේද ? තමුන්නාන්සේලා භික්ෂූන් වහන්සේලා භේද කරන්න ක්‍රියා කරන්නේ නැද්ද කියන එක කියන්න. සිංහලයන් භේද කරමින් තමුන්නාන්සේලා ක්‍රියා කරන්නේ නැද්ද කියන එක කියන්න. අද තමුන්නාන්සේලා මෙතැන කිකයනවා. [බාධා කිරීමක්]

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
(Mr. Lakshman Jayakody)

ඒ අය භේද වෙන්නේ නැහැ. ඒ අය එතරම් මෝඩ නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**වෛද්‍යාචාර්ය පී. එම්. බී. සිරිල් මහතා**
**(வைத்திய கலாநிதி பீ. எம். பி. சிறில்)**
(Dr. P. M. B. Cyril)

හපෝ නැහැ ! තමුන්නාන්සේලා කියන කථාවල හැටියට භේද කරන්න නොවෙයිද ක්‍රියා කරන්නේ ? අද තමුන්නාන්සේලා ඒ දෙය නොවෙයිද කරන්නේ ? අද සංඝයා වහන්සේලා භේද කරන්න, ජාතිය දෙකට කඩන්න හදන්නේ තමුන්නාන්සේලායි. එහෙම නැත්නම් ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයක නායකයන් හැටියට රජයට සහයෝගය දී මේ තත්ත්වයෙන් රට මුදා ගැනීමට වැඩ කටයුතු කිරීම තමුන්නාන්සේලාගේ යුතුකමක්ය කියන එක මම මේ අවස්ථාවේදී මතක් කරන්නට ඕනෑ.

**අනුර බණ්ඩාරනායක මහතා**
**(திரு. அனுர பண்டாரநாயக்க)**
(Mr. Anura Bandaranaike)

දී තිබෙන බලය පාවිච්චි කරන්නට බැරුවාට අපි මොකද කරන්නේ ?

**වෛද්‍යාචාර්ය පී. එම්. බී. සිරිල් මහතා**
**(வைத்திய கலாநிதி பீ. எம். பி. சிறில்)**
(Dr. P. M. B. Cyril)

1971 සිට අවුරුදු හයක් තිස්සේ තමුන්නාන්සේලා හදිසි නීතිය දීර්ඝ කරගෙන ගියා. පාර්ලිමේන්තුවට එක දවසක් ඒ ගැන සාකච්ඡා කරන්නට අවස්ථාව ලබා දුන්නේ නැහැ. නමුත් මේ කාලයේදී හැම මාසයකදීම තමුන්නාන්සේලාට ඒ ගැන සාකච්ඡා කරන්නට—අද මහරගම ගරු මන්ත්‍රීතුමා කථා කළ විධියට කෑගසා කියන්නට— තමුන්නාන්සේලාට අවස්ථාව දුන්නේ මේ රජයයි. ඒ තුළින් තමුන්නාන්සේලාගේ අදහස් ප්‍රකාශ කිරීම අපි බලාපොරොත්තු වෙනවා. එය ඉතා වැදගත්. නමුත් මේ අවස්ථාවේදී රජය දුර්වල කරන්නට. එහෙම නැත්නම් වැඩ වර්ජනය ඇති කරන්නට කටයුතු කිරීම හොඳ නැහැ. අද බැංකු ප්‍රශ්නය ගැන කල්පනාකර බලන්න. අද බැංකු වර්ජනය කිරීමට ඒ අවස්ථාව සලසා දීම තමුන්නාන්සේලාගේ යුතුකමක්ද ?

**ආනන්ද දසනායක මහතා**
**(திரு. ஆனந்த தசநாயக்க)**
(Mr. Ananda Dassanayake)

කවුද කරන්නෙ කියන එක කියන්න. ?

**වෛද්‍යාචාර්ය පී. එම්. බී. සිරිල් මහතා**
**(வைத்திய கலாநிதி பீ. எம். பி. சிறில்)**
(Dr. P. M. B. Cyril)

ඇත්ත වශයෙන්ම එවැනි දේවල් සුදුසු නැහැ. ඒකය අපි කියන්නේ.

**දිනේෂ් ගුණවර්ධන මහතා**
**(திரு. தினேஷ் குணவர்த்தன)**
(Mr. Dinesh Gunawardene)

වර්ජනයක් නැහැ.

**වෛද්‍යාචාර්ය පී. එම්. බී. සිරිල් මහතා**
**(வைத்திய கலாநிதி பீ. எம். பி. சிறில்)**
(Dr. P. M. B. Cyril)

වර්ජනය කරවන්න හදන්නේ තමුන්නාන්සේලා. පුළුවන්ද කියා ටෙස්ට් කරලා බලනවානේ.

**දිනේෂ් ගුණවර්ධන මහතා**
**(திரு. தினேஷ் குணவர்த்தன)**
(Mr. Dinesh Gunawardene)

මෙතුමාතේ කිව්වේ ? නොවැම්බර් මාසයේ මුදල් ඇමතිතුමා කිව්වා ඔවා දෙනවාය කියා.

**වෛද්‍යාචාර්ය පී. එම්. බී. සිරිල් මහතා**
**(வைத்திய கலாநிதி பீ. எம். பி. சிறில்)**
(Dr. P. M. B. Cyril)

ඔව් දෙන්න ලැස්තියි. අද එවැනි දෙයකට යෝග්‍ය අවස්ථාවක්ද ? අද මේ තිබෙන්නේ එවැනි පඩි වැඩි කිරීමක් කරන්න. එවැනි තත්ත්වයක් ඇති කරන්න යෝග්‍ය අවස්ථාවක් නොවෙයි. මේ තරම් යුද්ධයක් ඇති වන අවස්ථාවකදී මේ වාගේ සුළු දේවල්වලට රජයේ අවධානය යේදවීම යුතුකමක්ද කියන එක තමුන්නාන්සේලා කල්පනා කර බලන්න.

**ආනන්ද දසනායක මහතා**
**(திரு. ஆனந்த தசநாயக்க)**
(Mr. Ananda Dassanayake)

දිසා ඇමතිතුමාට මෙය පැහැදිලි කරන්නට ඕනෑ. ජේ. එස්. එස්. එකත් වැඩ වර්ජනයට සම්බන්ධයි. ජාතික සේවක සංගමයේ මූලිකත්වයෙනුයි ඒ කටයුතු කරන්නේ. ඒක මතක තබා ගන්න.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
**(குழு உப தலைவர்)**
(The Deputy Chairman of Committees)

පැහැදිලි කරන්නට පුළුවන් ගරු මන්ත්‍රීතුමාට කථා කරන්නට ඉඩ දුන්නාම. එතකොට හොඳට පැහැදිලි කරන්න. දැන් දිසා ඇමතිතුමාට කථා කරන්නට ඉඩ දෙන්න.

**වෛද්‍යාචාර්ය පී. එම්. බී. සිරිල් මහතා**
**(வைத்திய கலாநிதி பீ. எம். பி. சிறில்)**
(Dr. P. M. B. Cyril)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. තිම්පු සාකච්ඡා බිඳ වැටීම තුළින් අද තත්ත්වය වෙනස් වෙමින් පවතින බව තමුන්නාන්සේ හොඳටම දන්නවා. අද එය තාවකාලිකව නතර වී තිබෙනවා. එසේ තාවකාලිකව නතර වී තිබෙද්දී විවිධ ප්‍රදේශවල අද ත්‍රස්තවාදී ආක්‍රමණ ඇති වෙගන යනවා. මේ අවස්ථාවේදී රජයක් වශයෙන් අපි තමුන්නාන්සේලාගෙන් ඉල්ලන්නේ මේවා ප්‍රසිද්ධියේ වේදිකාවලට ගෙනිහින් ඒ මගින් ප්‍රයෝජන ලබන්නට උත්සාහ නොකරන ලෙසයි. ඇත්ත වශයෙන්ම දැන් තමුන්නාන්සේලාට අවස්ථාව ලැබී තිබෙනවා. මුල්කිරිගල අතුරු මැතිවරණයේදී මේවා ඉදිරිපත් කරන්න. නමුත් මේ ජාතිවාදය එවැනි වේදිකාවකට ගෙනිහින් දේශපාලන වශයෙන් තර්ක කර. මිනිසුන් භේද කර. රජය දුර්වල කිරීමෙන් ඇති වන ප්‍රතිඵල ගැන පොඩ්ඩක් කල්පනා කරන්නය කියා අපි මතක් කරනවා.

**අනුර බණ්ඩාරනායක මහතා**
**(திரு. அனுர பண்டாரநாயக்க)**
(Mr. Anura Bandaranaike)

සිංහල ජාතිය ගැන කථා කිරීම ජාතිභේදය ඇවිස්සීමක්ද ?

**වෛද්‍යාචාර්ය පී. එම්. බී. සිරිල් මහතා**
**(வைத்திய கலாநிதி பீ. எம். பி. சிறில்)**
(Dr. P. M. B. Cyril)

තමුන්නාන්සේලා කථාවෙන් එවැනි දේවල් නොවැ කරන්නේ.

**අනුර බණ්ඩාරනායක මහතා**
**(திரு. அனுர பண்டாரநாயக்க)**
(Mr. Anura Bandaranaike)

කරනවා. සිංහලයෙක් හැටියට සිංහල ජාතිය ගැන කථා කිරීමට අයිතියක් තිබෙනවා.

**වෛද්‍යාචාර්ය පී. එම්. බී. සිරිල් මහතා**
**(வைத்திய கலாநிதி பீ. எம். பி. சிறில்)**
(Dr. P. M. B. Cyril)

තමුන්නාන්සේ හිතනවාද අපි දෙමළුය කියා.

**අනුර බණ්ඩාරනායක මහතා**
**(திரு. அனுர பண்டாரநாயக்க)**
(Mr. Anura Bandaranaike)

ඔව් ! තමුන්නාන්සේත් කථා කරන්න. අපිත් කථා කරන්නම්.

**වෛද්‍යාචාර්ය පී. එම්. බී. සිරිල් මහතා**
**(வைத்திய கலாநிதி பீ. எம். பி. சிறில்)**
(Dr. P. M. B. Cyril)

මුළු ලංකාවෙන්ම සියයට අනූ අටක් සිංහලයන් ඉන්නේ අපේ දිස්ත්‍රික්කයේය කියන එක අපි අද ආඩම්බරයෙන් කියනවා. තමුන්නාන්සේට හා සමානව, නැත්නම් තමුන්නාන්සේටත් වැඩියෙන් කථා කරන්නට අපට අයිතියක් තිබෙනවා. මුළු ලංකාවෙන්ම සියයට 98 ක් සිංහලයන් ජීවත් වෙන්නේ මා නියෝජනය කරන දිස්ත්‍රික්කයේයි. සිංහල ජාතිය ගැන කථා කිරීම ජාතිවාදය ඇවිස්සීමක්ය කියා අපි කියන්නේ නැහැ. බෞද්ධ ශාසනය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වෛද්‍යාචාර්ය පී. එම්. බී.සිරිල් මහතා]

ගැන කථා කිරීම ජාතිවාදය ඇවිස්සීමක් නොවෙයි. ස්වාමින් වහන්සේලා ගැන කථා කිරීම ජාතිවාදය ඇවිස්සීමක් නොවෙයි. නමුත් නමුන්නාන්සේලා කථා කරන්නේ රජය දුර්වල කිරීමටයි. නමුන්නාන්සේලා තුන්මුල්ලේ ඇති කළ අරගලය මෙවැනි අවස්ථාවකදී යුක්ති සහගතද ? නමුන්නාන්සේලා ගිහින් ඒ ඔක්කොම කළේ.

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
(Mr. Lakshman Jayakody)
හාමුදුරුවරු එය කළේ.

**වෛද්‍යාචාර්ය පී. එම්. බී. සිරිල් මහතා**
**(வைத்திய கலாநிதி பீ. எம். பி. சிறில்)**
(Dr. P. M. B. Cyril)

නමුන්නාන්සේලා කිව්වේ නැද්ද සෑම වාහනයකටම හෝන් ගහන්නය කියා. යාපනයේ ඉන්න ද්‍රවිඩයින්ට ඇහෙනවද ඒක ? යාපනයේ ඉන්න ද්‍රවිඩ මිනිසුන්ට ඇහෙනවද නමුන්නාන්සේලා හෝන් ගැහුවාම ? මේකද නමුන්නාන්සේලා—

**දිනේෂ් ගුණවර්ධන මහතා**
**(திரு. தினேஷ் குணவர்த்தன)**
(Mr. Dinesh Gunawardene)

තොන්ඩමන් ඇමතිතුමාට ඇහෙනවා. කදුකරය දෙන්න එකඟවෙලා තියෙන්නේ.

**වෛද්‍යාචාර්ය පී. එම්. බී. සිරිල් මහතා**
**(வைத்திய கலாநிதி பீ. எம். பி. சிறில்)**
(Dr. P. M. B. Cyril)

නමුන්නාන්සේ හිතින් මවා ගන්නවා.

**දිනේෂ් ගුණවර්ධන මහතා**
**(திரு. தினேஷ் குணவர்த்தன)**
(Mr. Dinesh Gunawardene)

මම නොවෙයි. එච්. ඩබ්ලිව්. ජයවර්ධන මහත්මයා එකඟවෙලා තිබෙන්නේ. මේ ප්‍රකාශය කියවන්න. මේ ප්‍රකාශය නැහැ කියා කියනවද ඇමතිතුමා ? එච්. ඩබ්ලිව්. ජයවර්ධන මහත්මයා මෙවැනි එකඟතාවයකට ආවේ නැහැ කියා කියනවාද ?

**වෛද්‍යාචාර්ය පී. එම්. බී. සිරිල් මහතා**
**(வைத்திய கலாநிதி பீ. எம். பி. சிறில்)**
(Dr. P. M. B. Cyril)

ඒක අසත්‍යයි කියා අපි ප්‍රකාශ කරනවා.

**ආනන්ද දසනායක මහතා**
**(திரு. ஆனந்த தஸநாயக்க)**
(Mr. Ananda Dassanayake)

එච්. ඩබ්ලිව්. ජයවර්ධන මහත්මයායි කියා තිබෙන්නේ.

**වීරසිංහ මල්ලිමාරච්චි මහතා**
**(திரு. வீரசிங்ஹ மல்லிமாரச்சி)**
(Mr. Weerasinghe Mallimarachchi)

නමුන්නාන්සේ එතකොට රනිල් වික්‍රමසිංහ මහත්මයා එක්ක ලන්ඩන්වල හෝටලයේ කාමරයෙනේ හිටියේ. නමුන්නාන්සේ කොහොමද ඒක දන්නේ ? නමුන්නාන්සේ ගිය මාසෙ එයත් එක්ක කාමරයෙ හිටියෙ.

**ආනන්ද දසනායක මහතා**
**(திரு. ஆனந்த தஸநாயக்க)**
(Mr. Ananda Dassanayake)

නමුන්නාන්සේ කොහොම හිතා ගන්නත් කමක් නැහැ. පත්තරයේ පළවෙලා තියෙන එකයි මම කියන්නේ.

**වෛද්‍යාචාර්ය පී. එම්. බී. සිරිල් මහතා**
**(வைத்திய கலாநிதி பீ. எம். பி. சிறில்)**
(Dr. P. M. B. Cyril)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද සිදු වී තිබෙන්නේ, විරුද්ධ පක්ෂයේ ගරු මන්ත්‍රීවරු කවුරු හරි දෙන දිරව්ව ලණුවක් ගෙනැවිත් මෙතන සාකච්ඡා කරන එකයි, කෑගහන්න එකයි. ඒ උදවියට අවශ්‍ය වී තිබෙන එක අපි දන්නවා. ඒ උදවියගේ දේශපාලන තත්ත්වය ආරක්ෂා කරන ගන්න ජනතාව ඉදිරියේ මොනවා හරි කියා ගන්න වුවමනාවක් තිබෙනවා. ඇත්ත වශයෙන්ම ඒ උදවියට අවශ්‍ය නැහැ මේ ප්‍රශ්නය විසදන්න. මේ ප්‍රශ්නය විසඳුනොත්, අද ලංකාවේ ආර්ථික ප්‍රශ්නය හා අනිකුත් ප්‍රශ්න විසදීම තුළින් ඒ උදවියට අනාගතයක් නැති බව ඒ අය දන්නවා. ඒ නිසා විවිධ වක්‍ර ක්‍රම මගින් මේ තත්ත්වය දුර්වල කරන්න හදන්නේ කියා අපි ප්‍රකාශ කරන්න ඕනැ. නමුන්නාන්සේලා මෙතෙක් මේ ප්‍රශ්නය ගැන කථා කර තිබෙනවා. හදිසි නීතිය දීර්ඝ කිරීමට විරුද්ධ වෙලා තිබෙනවා. නමුත් නමුන්නාන්සේලා මේ ප්‍රශ්නය විසදන්න යන්තමකී හරි සහයෝගය දෙන හැටි කථා කර තිබෙනවාද කියා අපට අහන්න සිදු වෙනවා.

**ආනන්ද දසනායක මහතා**
**(திரு. ஆனந்த தஸநாயக்க)**
(Mr. Ananda Dassanayake)
අපි හැමදම කථා කරනවා.

**වෛද්‍යාචාර්ය පී. එම්. බී. සිරිල් මහතා**
**(வைத்திய கலாநிதி பீ. எம். பி. சிறில்)**
(Dr. P. M. Б. Cyril)

හැමදම කථා කරනවා. ඒ කටින් විතරයි. නමුත් ක්‍රියාවෙන් කිසි දෙයක් නැහැ.

**ආනන්ද දසනායක මහතා**
**(திரு. ஆனந்த தஸநாயக்க)**
(Mr. Ananda Dassanayake)

නමුන්නාන්සේ කොහේ ඉදගෙන ද කථා කරන්නේ ?

**වෛද්‍යාචාර්ය පී. එම්. බී. සිරිල් මහතා**
**(வைத்திய கலாநிதி பீ. எம். பி. சிறில்)**
(Dr. P. M. B. Cyril)

සෑම විවාදයකටම සහභාගි වූ කෙනෙක් හැටියට වගකීමක් ඇතිව මට ප්‍රකාශ කරන්න පුළුවන්, නමුන්නාන්සේලා කථා කරන එක නොවෙයි නමුන්නාන්සේලාගේ පක්ෂයේ ප්‍රතිපත්තිය කියා. පසුගිය හදිසි නීතිය දීර්ඝ කිරීමේ විවාදයේදී අපේ බද්දේගමමන්ත්‍රීතුමා (අමරසිරි දොඩන්ගොඩ මහතා) ඇහුවා, විරුද්ධ පක්ෂයේ නායකයින්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නොවෙයි, ද්‍රවිඩ පක්ෂවල අය පාර්ලිමේන්තුවේ නියෝජනය නොවී කරන සාකච්ඡාවල ප්‍රතිඵලයක් තිබෙනවාද කියා.

**ආනන්ද දසනායක මහතා**
**(திரு. ஆனந்த தஸநாயக்க)**
(Mr. Ananda Dassanayake)
ඒක හරි.

**වෛද්‍යාචාර්ය පී. එම්. බී. සිරිල් මහතා**
**(வைத்திய கலாநிதி பீ. எம். பி. சிறில்)**
(Dr. P. M. B. Cyril)
නමුන්නාන්සේ කියනවා, " හරි " කියා.

**ආනන්ද දසනායක මහතා**
**(திரு. ஆனந்த தஸநாயக்க)**
(Mr. Ananda Dassanayake)
පාර්ලිමේන්තුවේ ආසන හිස්ව තබන්නේ ඇයි ?

**වෛද්‍යාචාර්ය පී. එම්. බී. සිරිල් මහතා**
**(வைத்திய கலாநிதி பீ. எம். பி. சிறில்)**
(Dr. P. M. B. Cyril)

අද මැතිවරණයක් තියන්න පුළුවන් තත්ත්වයක් තිබෙනවාද කියා නමුන්නාන්සේසලා කල්පනා කරල කියන්න.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
**(குழு உப தலைவர்)**
(The Deputy Chairman of Committees

Order, please ! hon. Member for Kotmale, please do not disturb in this manner.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**වෛද්‍යාචාර්ය පී. එම්. බී. සිරිල් මහතා**
**(வைத்திய கலாநிதி பீ. எம். பி. சிறில்)**
(Dr. P. M. B. Cyril)

ද්‍රවිඩ උදවියට අවස්ථාවක් දුන්නොත් ද්‍රවිඩ එක්කෙනෙක් විරුද්ධ පක්ෂයේ නායකයා වෙන බවත් එදම ඒ අවස්ථාවේදීම කිව්වා. මේ විධියට බලනවිට තමුන්නාන්සේලාගේ කථාවල පරස්පරතාවයක් තිබෙනවා. එක මන්ත්‍රීවරයෙක් කියන එක නොවෙයි අනික් එක්කෙනා කියන්නේ. පක්ෂයේ ප්‍රතිපත්තිය නොවෙයි. විවිධ අදහස් ප්‍රකාශ කරන්නේ. විවිධ අවස්ථාවලදී විවිධ උදවිය අදහස් ප්‍රකාශ කරනවා. අද බද්දේගම ගරු මන්ත්‍රීතුමා පළ කළ අදහස් නොවෙයි වෙනත් මන්ත්‍රීවරයෙක් කථා කළොත් ප්‍රකාශ කරන්නේ. ඒ අනුව ජාතිවාදය අවුස්සා ඒ තුළින් පුළුවන් නම්, හැකියාවක් තිබෙනවා නම් රජය පෙරළීම තමුන්නාන්සේලාගේ පරමාර්ථය බව අපට පෙනෙනවා. මේ ජාතිවාදී ප්‍රශ්නය විසඳීමට තමුන්නාන්සේලා උත්සාහයක් දරා නැහැ. අපි අහලා තිබෙන හැම විවාදයකදීම තමුන්නාන්සේලා අදහස් ප්‍රකාශ කර තිබෙනවා. ඒ අදහස් තමුන්නාන්සේලාගේ අදහස් නොවෙයි. විවිධ ප්‍රදේශවල ඇතැම් උදවියව සතුටු කරන්න ඒ උදවියගේ අදහස් තමුන්නාන්සේලා ප්‍රකාශ කරනවා. නිකම් හදාගත් දේවල් තමයි කථා කර තිබෙන්නේ. තමුන්නාන්සේලා මෙහෙ ඇවිත් ඒ විධියට කෑ කෝ ගහලා ගිහින් තිබෙනවා. [බාධා කිරීමක්]

1983 මැයි 18 වැනිද තමුන්නාන්සේලා පාර්ලිමේන්තුවට ආ දවසේ සිට කළ කථාවල සඳහන් එක කරුණක්වත් ඉෂ්ට වෙලා තිබෙනවාය කියා තමුන්නාන්සේලා කියන්න. මහරගම ගරු මන්ත්‍රීතුමා (දිනේෂ් ගුණවර්ධන මහතා) කිව්වා, පත්‍රයක මොනවාදෝ විස්තරයක් පළ කර තිබෙනවාය කියා. රට බෙදන්න එහෙම නැතිනම් කෑලි කඩන්න ඒක පාක්ෂිකව තීරණයක් ගන්නට. මේවා කෙහෙන් හද ගෙන එන ඒවාද කියන්න නම් අපට තේරෙන්නේ නැහැ. රජයේ එහෙම බලාපොරොත්තුවක් නැහැ.

**දිනේෂ් ගුණවර්ධන මහතා**
**(திரு. தினேஷ் குணவர்த்தன)**
(Mr. Dinesh Gunawardene)

තමුන්නාන්සේ දැනගන්න කොට වැඩේ කෙරිලා ඉවරයි. තමුන්නාන්සේට ඕවා දැනගන්නට හම්බ වෙන්නේ නැහැ.

**වෛද්‍යාචාර්ය පී. එම්. බී. සිරිල් මහතා**
**(வைத்திய கலாநிதி பீ. எம். பி. சிறில்)**
(Dr. P. M. B. Cyril)

තමුන්නාන්සේ ඕව හීනෙන් මවා ගන්නා දේවල් පමණයි. හැමදාමත් හීනෙන් මවා ගෙන කටයුතු කරනවා. තමුන්නාන්සේලා ප්‍රශ්න ඉදිරිපත් කරනවා. නමුත් ඒවාට විසඳුම් දෙනවාද ?

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
**(குழு உப தலைவர்)**
(The Deputy Chairman of Committees

දැන් වේලාව අවසානයි. මන්ත්‍රීතුමා කථා නතර කරන්න. දැන් අක්මීමන ගරු මන්ත්‍රීතුමා කථා කරන්න.

**රිචඩ් පතිරණ මහතා**
**(திரு. றிச்சட் பத்திரன)**
(Mr. Richard Pathirana)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, හදිසි නීතිය නැවතත් දීර්ඝ කිරීම සඳහා යෝජනාව ඉදිරිපත් කර ඇති මේ අවස්ථාවේදී මා විශේෂයෙන්ම සඳහන් කරන්නට ඕනෑ, අද අපේ රට ඉතාමත්ම අවිනිශ්චිත තත්ත්වයක පවතින බව. තිම්පු නුවර පැවති සාකච්ඡා පිළිබඳව විශේෂ බලාපොරොත්තුවක් අපේ ජනාධිපතිතුමා තුළ තිබුණු බව පසුගිය දවස්වල පළ වූ පත්‍ර මාර්ගයෙන් අපට මැනවින් පැහැදිලි වුණා. නමුත් ඒ සාකච්ඡා අතරමග නතර වී තිබෙන අවස්ථාවකයි, මේ විවාදය පවත්වනු ලබන්නේ. පසුගිය වර විවාදයේ අප සඳහන් කළා, අපි බිම තැබීමේ කොන්දේසි ත්‍රස්තවාදීන් නියම ආකාරයෙන් ක්‍රියාත්මක නොකරන බව. ප්‍රවෘත්ති පත්‍ර මාර්ගයෙන්, ඡායාරූප ඉදිරිපත් කරමින්, විශේෂයෙන්ම උතුරු ප්‍රදේශයේ අයට යුද පුහුණුව ලබා දෙන ආකාරය පිළිබඳව කරුණු පැහැදිලි කළ අවස්ථාවේදී ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලා ඊට දැඩි විරෝධයක් දක්වා සිටියා. නමුත් පසුගිය මාසය තුළ මේ රටේ ඇති වී තිබෙන තත්ත්වය ගැන කල්පනා කර බලන විට, එද අප කී දේවල් ඉතාමත්ම සත්‍ය බව දැන් පැදිලි වෙනවා ඇති.

විශේෂයෙන්ම මා අද කථා කරන්නට බලාපොරොත්තු වෙන්නේ, ශ්‍රී ලංකාවේ වාසය කරන අවුරුදු දෙදහස් පන්සියයකට වඩා පැරණි අයිතියක් මේ රට සම්බන්ධයෙන් ඇති සියයට හැත්තෑ හතරක් පමණ වන සිංහල ජනතාවගේ අයිතිවාසිකම් ගැනයි. යම් කිසි කෙනෙක් කියනවා නම්, සිංහල ජාතිය ගැන කථා කිරීම ජාතිවාදයක්ය කියා මම ඒ අයට කියන්නට කැමතියි, සියයට හැත්තෑ හතරක් පමණ වන සිංහල ජාතියට, මේ රටේ, මේ දිවයිනේ සෑම තැනකම සමගියෙන්, සමාදානයෙන් ජීවත් වන්නට පුළුවන්කමක් නැතිනම්, ඒ ගැන කථා කිරීම ජාති වාදයක් නොවන බව. ඇත්තෙන්ම ජාතියක් හැටියට සිංහල ජනතාවට අනාගතයේදී කුමන තත්ත්වයකට මුහුණ පාන්න සිද්ධ වෙනවාද කියා සිතන්නට බැරි තරමට අද මේ රටේ සිංහල ජාතිය ඉතාම අසරණ තත්ත්වයකට, භයානක තත්ත්වයකට පත් වී සිටිනවා. විශේෂයෙන්ම අද උතුරු හා නැගෙනහිර පළාත්වල වාගේම උතුරු මැද පළාතේත් සිංහල ජනතාවට මුහුණ පාන්න සිදු වී ඇති ඉතාමත්ම දුක්ඛදායක, ඛේදජනක තත්ත්වය ගැන මේ රජය සම්පූර්ණයෙන්ම වග කියන්නට ඕනෑ බව මේ උත්තරීතර සභාවේදී මා සඳහන් කරන්නට කැමතියි.

යාපනයේ වෙළෙඳ ව්‍යාපාර කර ගෙන ගිය සියළුම සිංහල ජනතාව අද දකුණට පලවා හැර තිබෙනවා. ත්‍රිකුණාමලයේ සිංහල ජනතාව අද දකුණට පලවා හැර තිබෙනවා. වවුනියා දිස්ත්‍රික්කයේ සිංහල ජනතාව ක්‍රමයෙන් පහතට — දකුණට — පලවා හරිනවා. මුස්ලිම් ජනතාවටත් ඒ වාගේ ඉතාම කනගාටුදායක තත්ත්වයකට මුහුණ පාන්නට සිදු වී ඇති අවස්ථාවකයි, අප මේ විවාදය පවත්වන්නේ. විශේෂයෙන්ම උතුරු, නැගෙනහිර පළාත්වල මෙන්ම මැද පළාතේත් බෞද්ධ භික්ෂූන් වහන්සේලා සිය ගණනක් බෞද්ධ ධර්මය දේශනා කරමින්, විහාරාරාම හදගෙන සිටියා. එසේ සිටි ඒ ස්වාමීන් වහන්සේලා කෑලි කෑලිවලට කපා, තු තු කඩ කර මරණයට පත් කිරීමේ තත්ත්වයකට අද පත් වී තිබෙනවා. එසේ වුණත් ද්‍රවිඩ ජනතාවට අද පුළුවන්කමක් තිබෙනවා, ගාල්ලට ගිහින් වෙළෙඳ ව්‍යාපාර කරන්නට. කොළඹට ඇවිත් වෙළෙඳ ව්‍යාපාර කරන්නට. මාතරට ගිහින් වෙළෙඳ ව්‍යාපාර කරන්නට. හම්බන්තොටට ගිහින් වෙළෙඳ ව්‍යාපාර කරන්නට. මහනුවරට ගහිහින් වෙළෙඳව්‍යාපාර කරන්නට. ගම්පොළට ගිහින් වෙළෙඳ ව්‍යාපාපර කරන්නට., රත්නපුරයට ගිහින් වෙළෙඳ ව්‍යාපාර කරන්නට. නමුත් සිංහල ජාතියට අද ඒ අයිතිය මේ රටේ නැහැ. ඒ නිසා අද අපි සිංහල ජාතිය හැටියට ඉතාම ඛේදනීය හා ශෝකජනක තත්ත්වයකට පත්වී සිටින අවස්ථාවකයි, මේ විවාදය කරනු ලබන්නේ. එම නිසා මම කිසිම බියක් සැකක් නැතිව මේ උත්තරීතර සභාවේදී කියන්නට කැමතියි, සිංහලයින් හැටියට අද අපි පත් වී සිටින්නේ ලජ්ජාවිය යුතු තත්ත්වයකටයි කියා.

පසුගිය දවස්වල පුවත්පත් දෙස බලන විට මේ තත්ත්වය මැනවින් පැහැදිලි වෙනවා. අද පත්‍ර බලන්න. මහරගම ගරු මන්ත්‍රීතුමාත් මෙය කිව්වා, කරුණානිධි මහතා කර ඇති ප්‍රකාශයක් අද " සන් " පත්‍රයේ පළවී තිබෙනවා. " දවස " පත්‍රයෙත් ඒ ප්‍රවෘත්තිය තිබෙනවා. " යුද වැදී අයිතිය දිනා ගන්නවාලු ". කවුද ඒ ප්‍රකාශය කරන්නේ ? බාලසිංහම් කියා ද්‍රවිඩ විමුක්ති සංවිධානයක නායකයෙක්. මදුරාසියේ සිටයි, එසේ කියා තිබෙන්නේ. " අපි යුද්ධයෙන් මේ සටන දිනා ගන්නවා " යි කියා තිබෙනවා. කරුණානිධි මහතාත් එවැනිම ප්‍රකාශයක් කර තිබෙනවා. මේ අය මේ තිම්පු සාකච්ඡාවලට ගියේත් අවි බිම තැබීමේ කොන්දේසිවලට එකඟ වුණේත් අවංකව නොවෙයි. ඒ බව අපි මේ උත්තරීතර සභාවේදීත් කිව්වා. ඔවුන් එසේ කළේ ඒ අයගේ ශක්තිය වර්ධනය කර ගන්නයි. රජයේ හමුද අවි බිම තබා ඒ අයට සාමකාමීව සාකච්ජා පවත්වා ගෙන යන්නට ඉඩ තබා තිබෙන අවස්ථාවේදී ත්‍රස්තවාදීන් කළේ මොකක්ද ? ඒ අය යුද්ධමය ශක්තිය අතින් වර්ධනය වුණා. පසුගිය මාසයක පමණ කාලය තුළ මේ රටේ උතුරු නැගෙනහිර පළාත්වල පමණක් නොවෙයි, උතුරුමැද පළාතේ මැදවච්චිය වැනි සිංහලයින්ගේ වැඩි නියෝජනයක් ඇති ආසනවල පවා ඔවුන්ගේ බලය වර්ධනය කර ගන්නට පුළුවන් වුණේ ඒ නිසයි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ අවස්ථාවේදී විශේෂයෙන් පත්තර කීපයක් ඉදිරිපත් කළ යුතුව තිබෙනවා. " දිනරැස " පත්‍රයේ තිබෙනවා, " අද සිංහල අනාථයින් 20, 000 ක් බඩගින්නේ " කියා. අනාථයින්ට හරියට කෑම ලැබෙන්නේ නැහැ. ඒ අය තැන් තැන්වල ඉතාම දුඛිත තත්ත්වයෙන් ජීවත් වන්නේ. තමුන්නාන්සේලාගේ ආණ්ඩුවක කලින් සිටි ඇමති කෙනෙක් වන ඊරියගොල්ල මහතා " මේ සිංහල අපගෙ රටයි — අපි ඉපදුන මැරෙන රටයි " කියා ගීතයක් සාද තිබුණා මට මතකයි. දැන් මේ සිංහල අපගෙ රටේ අනාථයින් 50, 000 කට ආසන්න ගණනක් කන්න නැතිව ඉන්න හිටින්න තැනක් නැතිව අනාථ තත්ත්වයෙන් ජීවත් වෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[රිචඩ් පතිරණ මහතා]

1985 අගෝස්තු 21 වැනි බදාදා " දිවයින " පත්‍රයේ තිබෙනවා. " ත්‍රිකුණාමල ප්‍රදේශයේ සිංහල ගම් 11 ක් ත්‍රස්තවාදීන් අතේ " කියා. 1985 අගෝස්තු මාසයේ 16 වැනි දින " දිවයින " පත්‍රයේ ලිපියක් පළ වී තිබෙනවා " වව්නියා සිංහලයින්ගේ ඛේදවාචකය " මැයෙන්. එය එච්. එම්. චන්ද්‍රසේකර කියා මහත්මයෙක් ලියූ ලිපියක්. වව්නියාවේ සිංහලින්ට මුහුණ පාන්නට සිදු වී ඇති තත්ත්වය ගැන සම්පූර්ණ විස්තරයක් එහි තිබෙනවා. මම එය කියවන්නට බලාපොරොත්තු වන්නේ නැහැ, මට ලැබී තිබෙන කාලය විනාඩි 15 ක් නිසා. ඊළඟට, ත්‍රිකෝණමඩු ඝාතනය. හාමුදුරුවරු දෙනමක් හා උපාසක උපාසිකාවන් කැලි කැලිවලට කපා මරණයට පත් කළ අන්දම පත්‍රවලින් මැනවින් පැහැදිලි වෙනවා. ත්‍රිකෝණමඩුවේදී ත්‍රස්තවාදීන් විසින් හාමුදුරුවරු දෙනම මරා දමා තිබෙන්නේ කැලි කැලිවලට කපලයි. අගෝස්තු 16 වැනි දින " දවස " පත්‍රයේ තිබෙනවා " කලබල නිසා ගම් අත්හැර ආ වැසියෝ රැකවරණ මැද ගම්බිම් බලා යති " කියා. උතුරු මැද පළාතේ සිටින ඒ ජනතාවත් සම්පූර්ණයෙන්ම හමුදාවේ ආරක්ෂාව මැද දැන් දකුණු ප්‍රදේශයට එමින් සිටිනවා.

අගෝස්තු 8 වැනි දින ' දිවයින ' පත්‍රයේ තිබෙනවා " වවුනියාවේ තවත් සිංහල පවුල් 50 ක් පමණ පළවා හරිති " කියා. ඒවාගේම " පවුල් 300 ක් ගොවිපළවල් හැරයති " කියා එදිනම ' දිවයින ' පත්‍රයේ තිබෙනවා. " සේරුනුවර අටක් පැහැරගෙන ගිහින් " කියා අගෝස්තු 22 වැනි දින ' දවස ' පත්‍රයේ තිබෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ විධියට පත්‍ර වාර්තා දෙස බලන විට මේ පසු ගිය මාසය තුළ මදුරන්ගල වැනි ප්‍රදේශවල, උතුර නැගෙනහිර සහ වවුනියාව වැනි ප්‍රදේශවල නියම ආකාරයෙන් සංවිධානය වූ ත්‍රස්තවාදීන් ඒ ප්‍රදේශවල සිටින ජනතාව පළවා හරිමින් සිටිනවා. ත්‍රස්තවාදීන් දුම්රියක් අල්ලාගෙන දවස් දෙකක් තියා ගත්තා. කොළඹින් ගිය දුම්රිය පැය ගණනක් නතර කර තබාගෙන පෝස්ටර් ගැහුව්වා. ඒ ඇලවූ පෝස්ටර් කොළඹදී සුද්ධ කරන්න දවසක්ම ගත කරන්න සිද්ධ වුණා. " මඩකලපුවේ ධීවරයෝ මාලු වාඩි අත හැර යති " කියා පත්‍රයේ තිබෙනවා. ධීවරයන්ට වෙච්ච දේ ගරු ධීවර ඇමතිතුමා දන්නවා ඇති. විසි හත් දෙනෙකුගේ මළ සිරුරු හංගලා තිබෙනවා. සමහර මළ සිරුරු පුළුස්සා තිබෙනවා. ත්‍රස්තවාදීනට බියේ ලොරියකින් පලා යමින් සිටි ධීවරයින් අටක් පැහැර ගෙන ගිහින් 27 දෙනෙක් පුළුස්සා මරලා තිබෙනවා. " අනාථ කඳවුරකට පහර දී 11 ක් මරා දමති ", " ත්‍රිකුණාමලේ සිංහලයන්ට අවසාන කොටි නිවේදනයක් " ඔය ආදී ප්‍රවෘත්ති පත්‍රවල පළ වී තිබෙනවා. ත්‍රිකුණාමලේ සිටින සිංහලයන්ට මේ මාසේ 25 වෙනිදට කලින් ඒ ප්‍රදේශ අත හැර යන්නය කියලා අවසාන නිවේදනයක් දී තිබෙනවා.

මෙන්න මේ ආකාරයෙන් ඉතාමත් ඛේදනීය තත්ත්වයකට අද අපේ රට වැටී තිබෙනවා. අපේ රටේ විශේෂයෙන් සිංහල සහ මුස්ලිම් ජනතාව අන්තරායදායක තත්ත්වයකට, ඉතාමත් ඛේදනීය තත්ත්වයකට, ඉතාමත් දුඃඛිත තත්ත්වයකට පත් වී සිටින අවස්ථාවකදීයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි මේ හදිසි නීතිය දීර්ඝ කිරීමේ විවාදය පවත්වන්නේ. විරුද්ධ පාර්ශවයක් හැටියට අපි තමුන්නාන්සේලාගෙන් අහනවා, මෙවැනි හදිසි නීතියක් සම්මත කරගෙන තමුන්නාන්සේලා බලයක් ගන්නෙ මොකටද කියා. මේ රටේ මෙන්න මේ විධියේ ත්‍රස්තවාදී ක්‍රියා මේ මේ තැන්වල ඇති වෙනවාය,, ඒ නිසා කරුණාකර මේ හදිසි නීතිය තව මාසෙකට දීර්ඝ කරන්නය කියා තමුන්නාන්සේලා යෝජනාවක් ඉදිරිපත් කරනවා. ඒ යෝජනාවෙන් ආණ්ඩුවට ලැබෙන බලතල ආණ්ඩුව උතුරු නැගෙනහිර පළාත්වල ක්‍රියාත්මක කරන්නෙ නැහැ. ක්‍රියාත්මක කරන්නේ දකුණු පළාත තුළ පමණයි.

මහරගම ගරු මන්ත්‍රීතුමා (දිනේෂ් ගුණවර්ධන මහතා) කිව්වා බැංකු සේවක ප්‍රශ්නය ගැන. බැංකුවේ වෘත්තීය සමිති සියල්ලක්ම එකතු වී වැඩ වර්ජනයක් කළා. මොකද කළේ ? නිලධාරී මහත්වරුන් දෙන්නෙක් භිර භාරයට ගත්තා. උසාවිය පළමුවෙන්ම ඒ අයට ඇප දී නිදහස් කළා. ඊට පස්සේ පොලීසිය මේ හදිසි නීතිය යටතේ නැවතත් උසාවියට කරුණු ඉදිරිපත් කර නැවතත් ඔවුන් භිර භාරයට ගත්තා. මම කැමතියි ඒ බැංකු සේවක මහත්වරුන් දෙන්නාගේ නම් සඳහන් කරන්න. එක්කෙනෙක් ලංකා බැංකු සේවක සංගමයේ ප්‍රධාන ලේකම් ආනන්ද ලියනගේ මහතා. අනික් නිලධාරියා ලංකා බැංකු ශාඛා සංගම් ලේකම් කිංග්ස්ලි මෙන්ඩිස් මහතා. උසාවිය මුලින් ඇප දුන්නා. පොලීසිය ඊට පසුව ඉදිරිපත් වී නැවත රිමාන්ඩ් කළා. මට ආරංචියි ඊයේ නීතිඥ මහත්වරුන් කරුණු ඉදිරිපත් කළාට පස්සේ නැවතත් ඊයේ ඇප දුන්නාය කියා. අද " දවස " පත්‍රයේ ඒ බව සඳහන් වී තිබෙනවා. ත්‍රස්තවාදී නායකයන් උතුරු නැගෙනහිර ප්‍රධාන නගරවල පිට්ටනිවල තුවක්කු තියාගෙන ත්‍රස්තවාදීන් පුහුණු කරනවා. ආණ්ඩුව නිකම් බලාගෙන ඉන්නවා. මෙහි බැංකු සේවකයන් පඩිය වැඩි කරන්නය කියා සංකේත වැඩ වර්ජනයක් කළාම ආණ්ඩුව වීරත්වය අරගෙන ඔවුන් ගෙනිහින් භිර කරනවා. මෙන්න මේවාටයි, රජය හදිසි නීතිය දීර්ඝ කරන්නය කියා ඉල්ලන්නෙ.

මට වාසනාව ලැබුණා, පසුගිය දවසේ එංගලන්තයට, ප්‍රංශයට සහ ඉතාලියට යන්න. මට දකින්න ලැබුණා, තමන්ගේ ආගමන විගමන බලපත්‍ර දීර්ඝ කරවා ගැනීම සඳහා ත්‍රස්තවාදීන් ප්‍රංශයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලයට එන්නේ, ලංකාවේ ඊලාම් රාජ්‍යය ඇතුළත් වී ෂර්ට් ඇඳගෙන බව. තානාපති මහත්මයා හම්බවෙන්න එන්නෙ කොහොමද ? මගේ ඇස් දෙකෙන් දැක්ක දේ මම මේ කියන්නෙ.

**වෛද්‍යාචාර්ය පී. එම්. බී. සිරිල් මහතා**
**(வைத்திய கலாநிதி பீ. எம். பி. சிறில்)**
(Dr. P. M. B. Cyril)

එය නවත්වන්න තමුන්නාන්සේ ගන්න පියවර මොකක්ද ?

**රිචඩ් පතිරණ මහතා**
**(திரு. றிச்சட் பத்திரன)**
(Mr. Richard Pathirana)

ඒක හොඳ ප්‍රශ්නයක් තමයි. තමුන්නාන්සේ දෙස්තර මහත්මයෙක් වුණේ කොහොමද කියලයි මම කල්පනා කරන්නෙ !

**වෛද්‍යාචාර්ය පී. එම්. බී. සිරිල් මහතා**
**(வைத்திய கலாநிதி பீ. எம். பி. சிறில்)**
(Dr. P. M. B. Cyril)

හොඳයි, කොහොමද තමුන්නාන්සේ එය නවත්වන්නේ ? පිටරටක මිනිහෙක් ෂර්ට් එකක් අඳිනවා නම් නවත්වන්න පුළුවන්ද ? කොහොමද ප්‍රංශයේ ඉන්න මිනිසුන්ගේ ඇඳුම් නවත්වන්නෙ ?

**රිචඩ් පතිරණ මහතා**
**(திரு. றிச்சட் பத்திரன)**
(Mr. Richard Pathirana)

අපි තානාපතිතුමාගෙන් ඇහුවා, මේ ආගමන විගමන බලපත්‍රය දීර්ඝ කිරීම ප්‍රතික්ෂේප කරන්න බැරිද කියා. දැන් තිබෙන නීතිරේ හැටියට ඒක කරන්න බැහැ කිව්වා. තානාපතිතුමා කිව්වා දැන් තිබෙන නීතියේ හැටියට එහෙම ප්‍රතික්ෂේප කරන්න තානාපතිතුමාට අයිතියක් නැහැ කියල. බලපත්‍රයක් දීර්ඝ කරන්නය කියා කවුරුවත් ඉල්ලා සිටියොත් එය නොකර ඉන්න බැරිලු. අන්න නීතිය. තමුන්නාන්සේලාට තමයි ඒ නීතිය වෙනස් කරන්න පුළුවන්. ආණ්ඩු පක්ෂයට හයෙන් පහක බලයක් තිබෙනවා නම් ඇයි තමුන්නාන්සේලා ඒ නීතිය වෙනස් කරනෙ නැත්තෙ ? ප්‍රංශයේ ඉන්න ත්‍රස්තවාදීන් 1985 කැලැන්ඩරය ගහල තිබෙනවා. ඊලම් කැලැන්ඩරය ඔවුන් ගහල තිබෙන්නෙ කොහොමද ? පුත්තලම දිස්ත්‍රික්කය එක පැත්තකින්. අනික් පැත්තෙන් හම්බන්තොට දිස්ත්‍රික්කයත් අයිති වන විධියටයි — ඔය කෑගහන තමුන්නාන්සේගේ දිස්ත්‍රික්කයත් අයිති වන විධියටයි. — කැලැන්ඩරය ගහල තියෙන්නෙ. සියයට 98 ක් සිංහලයන් ඉන්නවයි කියන හම්බන්තොට දිස්ත්‍රික්කයත් ඇතුළත් වන විධියට 1985 කැලැන්ඩරය ගහල බෙද හැර තිබෙනවා. මුළු ප්‍රංශයේම එය බෙද ගැර තිබෙනවා. මම තමුන්නාන්සේලාගෙන් අහන්නේ විදේශීය තානාපති කාර්යාල පසුගිය කාලයේ මොනවාද කළේ කියලයි. ප්‍රංශයේ ඇවිද්දොත්, එංගලන්තයේ ඇවිද්දොත්, ඕනෑම විදේශික රටක ඇවිද්දොත් මේ රටේ සිංහල ජනතාව තිරශ්චීන ජාතියක් හැටියට සඳුන්වා දී තිබෙන බව පේනවා. අපේ තානාපති කාර්යාලවලින් කිසිම සේවයක් සිදු වී නැහැ.

එම නිසා මේ රජය හදිසි නීතිය අවශ්‍ය දෙයට නොයොදවා අනවශ්‍ය දේට යෙදවීම ගැන අපගේ බලවත් විරෝධය පළ කරමින් මෙම රජයට මේ ප්‍රශ්නය විසඳීමට හැකියාවක් නොමැති බව සඳහන් කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**වීරවන්නි සමරවීර මහතා**
**(திரு. வீரவன்னி சமரவீர)**
(Mr. Weerawanni Samaraweera)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අක්මීමන ගරු මන්ත්‍රීතුමාගේ (රිචඩ් පතිරණ මහතා) කථාවෙන් පසු වචන ස්වල්පයක් කථා කරන්නට ලැබීම ගැන මා සන්තෝෂ වෙනවා. විපක්ෂ නායකතුමා පසුගිය වතාවක හදිසි නීතිය දීර්ඝ කිරීමේ විවාදය පවත්වද්දී විපක්ෂ කණ්ඩායමක් සමග සභා ගැබෙන් නික්ම ගියේ එක් ප්‍රකාශයක් කරලයි. එතුමා කිව්වා මේ ජනවාර්ගික ප්‍රශ්නයට මොන අන්දමේ තීන්දුවක් ගෙනාවත්, මොන විධියේ තීරණයක් ගෙනාවත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත් මහා සංඝයාත් එකතු වී ඒ මොන තීරණයට වුවත් විරුද්ධව සටන් කරනවාය කියා. එද සභා ගැබෙන් පිටව් ගියේ එහෙම කියලයි. මේක තමයි අද ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ස්ථාවරය. හදිසි නීතිය ගැන විවාද කිරීම දින දෙකකට දීර්ඝ කරන්නය කියා ඉල්ලා සිටියත් එය නොලැබුණ විට එතුමා තම කණ්ඩායමත් සමග සභා ගැබෙන් පිටව් ගියේ ඒ විධියට ප්‍රකාශ කරලයි.

එතුමා පැහැදිලිවම කිව්වා මොන විධියේ තීරණයක් ගෙනාවත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත් මහා සංඝයා වහන්සේලාත් ඒ තීන්දුවට විරුද්ධව සටන් කරනවාය කියා. තීන්දුව මොකක්ද දන්නෙත් නැහැ. මොන විධියේ තීරණයක්, මොන විධියේ පිළිගැනීමක්, මොන විධියේ විසඳුමක් මේ සාකච්ඡාවලින් ලැබෙයිද කියලවත් කවුරුවත් නොදන්නා වෙලාවක විපක්ෂ නායකතුමා— මේ රටේ ප්‍රබල පක්ෂයක නායකයෙක්—ඒ විධියට ප්‍රකාශ කරන විට, මුළු මහත් රටටත් ජනතාවටත් ඕනෑම පුළු කෙනෙකුට වුණත් ඒ අයගේ ස්ථාවරය මොකක්ද කියන එක ගැන අවබෝධයක් ලබාගන්න පුළුවන්. ඒ අයගේ ප්‍රතිපත්තිය මොකක්ද කියල දැනගන්න පුළුවන්. ඒ අය මේ ජනවාර්ගික ප්‍රශ්නයේදී බලන ආකාරය, ඒ අයගේ බැල්ම, කෝනය ඕනෑම කෙනෙකුට තේරුම් ගන්න පුළුවන්. මේ ප්‍රශ්නයේදී පක්ෂ භේදය පැත්තක තියමු. තමන්ගේ භාෂාව වර්ගය පැත්තක තියමු. මනුෂ්‍ය වර්ගයා හැටියට කල්පනා කරන විට ඕනෑම ජන කොට්ඨාශයක මිනිස්සු මැරෙනවා ; විනාශ වෙනවා. මේ රටේ පමණක් නොවෙයි. මුළු මහත් ලෝකයේ ප්‍රජාතන්ත්‍රවාදී රටවල් කොතැනද තිබෙන්නේ, ඒ හැම ප්‍රජාතන්ත්‍රවාදී රටකම අද ත්‍රස්තවාදය බෝ වෙලා. සමාජවාදීයයි කියා ගන්න කිසිම රටක, කොමියුනිස්ට් වාදයට අවනතව තිබෙන කිසිම රටක, අද ත්‍රස්තවාදය නැහැ. මේ ත්‍රස්තවාදය තියෙන්නේ සම්පූර්ණයෙන්ම ප්‍රජාතන්ත්‍රවාදී රටවලයි. ත්‍රස්තවාදය ඇති වෙන්නේ ප්‍රජාතන්ත්‍රවාදී රටවලයි. ඒ විනාශකාරී තත්ත්වයට මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදී සමාජයටත් අද ඇතුළු වෙලා ; මේ රටත් අහු වෙලා.

එහෙම නම් සිංහලයන් ගැන කථා කරන, භාෂාව ගැන කථා කරන, ආගම ගැන කථා කරන, සාමය ගැන කථා කරන පක්ෂයක නායකයෙකුට, ඊළඟට මේ රටේ නායකත්වය ගන්නට ඉන්න පුද්ගලයෙකුට, හැබෑ හිතින් මේ ප්‍රශ්නය විසඳා ගන්නට ඕනෑය කියලා අවංකව සිතුවිලි මාත්‍රයක්වත් තිබෙන පුද්ගලයෙකුට, මේ ප්‍රශ්නය විසඳා දෙන්නට සූදානම් වන වෙලාවේදී ඒ ගැන සාකච්ඡාවට සහභාගි වන වෙලාවේදී පක්ෂ දෙක එකට එක්කාසු වෙලා සාකච්ඡා කරන්නට සූදානම් වන වෙලාවේදී මේ විධියට ක්‍රියා කරන්නට යුතුකමක් තිබෙනවාද ? " තමුන්නාන්සේලා මොන තීන්දුවක් ගත්තත් අපි විරුද්ධයි " කියලා සභාවෙන් නැඟිටලා ගියා. ගන්නා තීන්දුව මොකක්ද කියලා ඒ පුද්ගලයා දන්නේ කොහොමද ? මේ රටේ පාලන බලය ලබාගත් පක්ෂයක් හැටියට, මේ ප්‍රශ්නය විසඳීමේ වගකීම භාරගත් පක්ෂයක් හැටියට, මේ රටේ ප්‍රශ්න විසඳීමට විපක්ෂයෙන් සහයෝගය ඉල්ලන කොට, ඒ විධියේ පක්ෂ දේශපාලනයට හුරුවෙලා, කොටුවෙලා, වෙච්ච පුද්ගලයෙකුගේ මුවින්, " මොන තීන්දුවක් ගත්තත් අපි සහයෝගය දෙන්නේ නැහැ " කියලා කියනවා නම් අපට බලාපොරොත්තු වන්නට පුළුවන් සහයෝගය කුමක්ද ගරු කථානායකතුමනි ? ඒ අය ඉස්සෙල්ලාම කිව්වා, " වට මේස සාකච්ඡාවලින් කිසිම තේරුමක් නැහැ. ද්‍රවිඩ එක්සත් විමුක්ති පෙරමුණ පාර්ලිමේන්තුවෙන් එළියට ගිහිල්ලා තියෙනවා " කියලා. ඒ අය සහභාගි කර ගන්නේ නැතිව ඒ ප්‍රශ්නය ගැන සාකච්ඡා කර ගන්නට සිංහලයන් පමණක් සහභාගි වන සාකච්ඡාවෙන් වැඩක් නැහැ කියලා ඒ නායිකාව කිව්වා. ඒ අනුව සාකච්ඡාවට ඒ පක්ෂයටත් ආරාධනා කළා. ද්‍රවිඩ එක්සත් විමුක්ති පෙරමුණට ආරාධනා කළායින් පස්සේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය පිටවෙලා ගියා. මොන තීන්දුවක් ගත්තත්, එළියට වෙලා බලාගෙන ප්‍රාර්ථනා කළා, " මේක කොයි වෙලාවේ හෝ කැඩිලා බිඳිලා විනාශ වෙලා යනවා නම් " කියලා. ඒ, දේශපාලන වශයෙන් යම් යම් ප්‍රකාශන ජනතාව ඉදිරියේ කරන්නට පුළුවන් වේය කියලා හිතාගෙනයි.

එක වෙලාවකට කියනවා, " හදිසි නීතිය දීර්ඝ කර ගන්නවා. නමුත් යුද්ධ ආයුධ නැහැ, අපේ අහිංසක හමුදාව ගිහිල්ලා විනාශ වෙනවා. "ඇයි සටන් කරන්නේ නැත්තේ ?" කියලා. ඉතින්, අපි සටන් කරන කොට, "යුද්ධෙන් මේක කරන්නට බැහැ, මිනිස්සු මරලා මේක කරන්නට බැහැ, ඉන්දියාව තරහ කරගෙන මේක කරන්න බැහැ, ත්‍රස්තවාදීන් එක්ක හැප්පිලා මේක කරන්නට බැහැ, සාකච්ඡා කරන්න" කියලා කියනවා. ත්‍රස්තවාදීන් එක්ක සාකච්ඡා කරනකොට, එක එක හන්දි ගානේ බෝක්කු ගානේ කඩ පිල් ගානේ ගිහිල්ලා වාඩිවෙලා කියනවා, "අපි හෝන් ගහනවා, කොඩි දනවා. තිම්පු සාකච්ඡාව එපා" කියා. මෙන්න ස්ථාවරය. ඉන්දියාවත් එක්ක හැප්පිලා මේක කරන්න බැරිය. ඉන්දියාවත් සමඟ සාකච්ඡා කරන්නට ඕනෑය, ඇයි ඉන්දියාවත් එක්ක හැප්පෙන්නේ, ඉන්දියාවට පැය කීයද යන්නේ අපව අල්ලා ගන්න.. මෙච්චර ලොකු ප්‍රජාතන්ත්‍රවාදී අසල්වැසි රටක් එක්ක හැප්පෙන්නේ ඇයි කියලා කෑ ගහනවා.

ඉන්දියාවේ විදේශ ලේකම්තුමා මෙහාට ඇවිල්ලා විපක්ෂ නායකතුමාගෙන් සාකච්ඡාවක් ඉල්ලනකොට " බැහැ කියලා කිව්වා. ඉන්දියාවේ විද්ශ ලේකම්තුමා සාකච්ඡාවක් සඳහා විපක්ෂ නායකතුමාට කථා කරන විට නොගියේ ඇයි ? මොකක්ද ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ස්ථාවරය ? මොකක්ද මේ අය කිව්වෙ ? ඉන්දියාව තරහ කරගන්නට බැරිය. සුහදතාවයෙන් සාකච්ඡා කරන්නට ඕනෑය කියලා කිව්වා. තමුන්නාන්සේ පෞද්ගලිකව හෝ ඉන්දියාවට ගිහිල්ලා ගාන්ධි පවුලත්, බණ්ඩාරණායක පවුලත් යන පවුල් දෙක අතර ගොඩ නැඟිච්ච හිතවත්භාවය, සහෝදරත්වය උඩ හෝ සාකච්ඡාවට ගිහිල්ලා, පෞද්ගලිකව හෝ ගිහිල්ලා, මේ සාකච්ඡාවට මැදිහත් වෙන්නටය කියලා අපේ අගමැතිතුමා කිව්වා. සම්පූර්ණ සහයෝගය දෙන්නම් කියලා එතුමා කිව්වා. රජිව් ගාන්ධි අගමැතිතුමාගේ නියෝගය අනුව, උපදෙස් අනුව, ඉන්දියාවේ විදේශ ලේකම්තුමා ලංකාවට ඇවිල්ලා අනෙකුත් නායකයන් සමඟ විපක්ෂ නායකයා හම්බු වෙන්න පැය භාගයක්, නැත්නම් විනාඩි පහක් ඉල්ලන කොට මොකක්ද කිව්වෙ විපක්ෂ නායකතුමා ? " නැහැ, මම හම්බුවෙන්නෙ නැහැ " කියලයි. මොනවාද ඒ අයගෙන් බලාපොරොත්තු වන්නට පුළුවන්. ? ඒ ගොල්ලන් දෙන සහයෝගය කුමක්ද ? හැම වතාවේදීම මොකක් හෝ ක්‍රියා මාර්ගයක් ගන්න කොට, අපි මොකක් හෝ පිළියමක් ගන්නට උත්සාහ කරන කොට මොකක් හරි කථාවක් ඇදගෙන ඒකෙන් පිට වෙලා යනවා. මේ රටේ මහා සංඝයා වහන්සේලාත් දැනගන්න ඕනෑ මේ ප්‍රශ්නය විසඳීම සඳහා අවංක චේතනාවක් ඇතුවද ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ක්‍රියා නොකරන්නේ කියා. හැම වෙලාවේම මොකක් හෝ වරදක් හොයාගෙන ඒකෙන් පිට පනිනවා.

ගිය වතාවේ මේ හදිසි නීතිය දීර්ඝ කරන මේ වෙලාවේදී එතුමන්ලා බොහොම සෝමාරි විධියටයි කථා කළේ. එතරම් උද්‍යෝගයක් තිබුණේ නැහැ. එතරම් වේගයෙන් කථා කළේ නැහැ. අද සභාව බොහොම වේගයි. ඇයි ? ත්‍රස්තවාදීන් සාකච්ඡාවෙන් ඉවත් වෙලා. තිම්පු සාකච්ඡාව නතර වෙලා. ලොකු උද්‍යෝගයක් මේ අයගේ හිතේ තිබෙනවා. ලොකු සතුටක් තිබෙනවා. හැම මූහුණකම අද තිබෙනවා බොහොම ලොකු ප්‍රබෝධයක්. හැම එක්කෙනාම හිනා වෙනවා. හැම එක්කෙනාම මේ විවාදයට සහභාගි වුණා. හදිසි නීතිය සාකච්ඡා කළ වෙන අවස්ථාවලදී විපක්ෂයේ ආසන හිස් වෙලා. අද ඔක්කොම වාඩි වෙලා ඉන්නවා. ඇයි ? අද ලොකු ප්‍රබෝධයක්. ඇයි ? දෙවැනි වතාවටත් සාකච්ඡා කඩාකප්පල් වෙලා.

මිනිසුන් අතරට ජනතාව අතරට කිසියම් පණිවුඩයක් ගෙන යැමට. " ජාතිය විනාශ වෙනවා. සිංහල භාෂාව විනාශ වෙනවා. මෙන්න මේ ආණ්ඩුවට කරන්න බෑ. අපි උද්ඝෝෂණය කරමු. වෙන ආණ්ඩුවක් ඉල්ලන්න. මහා මැතිවරණයක් ඉල්ලන්න " කියා කීමට දැන් මේ අයට පුළුවනි. එකම අභිප්‍රාය, එකම ප්‍රාර්ථනාව එකම විසඳුම මේ ගොල්ලන්ට මහා මැතිවරණයක්. ඒක තමයි, එකම දේ. විපක්ෂ නායකතුමාට ආත්ම ශක්තියක් තිබුණේ නැහැ මේ රටේ විපක්ෂ නායකයා හැටියට මුළු ලෝකය බලා සිටින ප්‍රශ්නයක් ගැන නිසි විධියට කථා කරන්න. මේ ගොල්ල ලොකුවට කෑගහනවා හතළිස් දහක් පනස් දහක් මිනිසුන් කන්න නැතිව මැරෙනවා කියලා. නමුත් ඒ මිනිසුන් වෙනුවෙන් ඉන්දියාවේ සහයෝගය ලබා ගැනීමට වචන පහක් කතා කරන්න බැරි වුණු විපක්ෂ නායකයෙක් අද ඇවිත් කෑගහනවා ත්‍රිකුණාමලයේ මිනිසුන් අනාථ වෙලාය කියලා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නායිකාව සාකච්ඡා කළා. මොකක්ද ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ප්‍රතිපත්තිය ? මෙයාට බැහැයි කියන කොට සිරිමා බණ්ඩාරනායක මහත්මිය බන්දරි ඇමතිතුමාත් එක්ක සාකච්ඡා කළා. [බාධා කිරීමක්] මිනිසුන්ගේ ලේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වීරවන්නි සමරවීර මහතා]

හොලවන කථා කාට වුණත් කරන්න පුළුවන්. මිනිසුන් අවුස්සන්න කාටත් පුළුවන්. ඕනෑම හන්දියක බෝක්කුවක ගිහින් වාඩි වෙන්න ඕනෑම මිනිහෙකුට පුළුවන්. ඕනෑ දෙයක් කියන්න පුළුවන්. පත්තරවල තිබෙන දේවල් අතන මැරුණා, මෙතන මැරුණා. ඒක තමයි, අපිත් කියන්නෙ.

මනුෂ්‍යත්වය නැති මිනිසුන්ගේ ජීවිත පිළිබඳ වටිනාකමක් නොසලකන මිනීමරු අසත්පුරුෂයන් එක්ක තමි මේ සටන ගෙනයන්නේ, මනුෂ්‍යත්වයක් පිළිබඳ මොන විධියේ හෝ සැලකිල්ලක් නැති මිනිසුන් තමි ලෝකේ ප්‍රජාතන්ත්‍රවාදී රටවල් විනාශ කරන්න මහන්සි වන්නේ, කොමියුනිස්ට් රටවල මේවා නැත්නම්, ඔළුව කළදක් තියෙන මිනිහෙකුට පේනවා මේකේ පිටිපස්සෙන් ඉන්නේ කවුද කියලා. අපට ආරංචියි දැන් ජනතාව විමුක්ති පෙරමුණේ ඇතැම් උදවියට ආයුධ දෙන්න ත්‍රස්තවාදීන් ලෑස්තියි කියල, සිංහල ගම්බිම් පළාත්වලට යම් යම් තර්ජන ඇති කරන්න. පත්තරවල තිබුණා ජනතා විමුක්ති පෙරමුණේ තරුණයන් ගොස් මද්‍රාසියේ පුහුණු වුණාය කියල. සිංහල ගැන කථා කරන සමහර වීරයෝ ජනතා විමුක්ති පෙරමුණේ නායකයන් හිරෙන් දෙට්ට දන්න කියල කෑගහනවා. ස්ථාවරයක් නැතිකම. අපි මේ වෙලාවේ කල්පනා කරන්නේ එක්සත් ජාතික පක්ෂය හැටියට නොවෙයි. සිංහල ජාතිය ගැන පමණක් නොවෙයි. රටේ ලාංකික ජනතාව මේ ප්‍රශ්නයෙන් බේරා ගන්නේ කොහොමද කියායි. සිංහලයාගේ ජීවිතයත්, බෞද්ධයාගේ ජීවිතයත්, හින්දු භක්තිකයාගේ ජීවිතයත් ඔක්කෝම එකයි. අක්මීමන ගරු මන්ත්‍රීතුමා (රිචඩ් පතිරණ මහතා) බොහොම ලස්සනට ගෙනාවා, මේ රටේ සිංහල බෞද්ධ මුස්ලිම් ජනතාව විනාශයි කියල. අන්න ඒ ගොඩට එක්කාසු කරගන්න මහන්සි වුණා. පටු ජාතිවාදය නිසා මේ රට විනාශයි. 1956 දී ගෙනා සිංහල විතරක් භාෂා පනත නිසා ඇති වුණු ජාතිවාදී ගිනිදැල්ල නිවා ගන්නට බැරිව .....

**රිචඩ් පතිරණ මහතා**
**(திரு. றிச்சட் பத்திரன)**
(Mr. Richard Pathirana)

තමුන්නාන්සේ මෙහෙ ඉන්නෙත් ඒකයි.

**වීරවන්නි සමරවීර මහතා**
**(திரு. வீரவன்னி சமரவீர)**
(Mr. Weerawanni Samaraweera)

සිංහල භාෂාවෙන් නොවෙයි, මම ආවෙ. මම ආරාධනා කරනවා කොන්ද පණ නැති තිවට නායකයන් හැටියට ක්‍රියා කරන්න එපාය, ආත්මාර්ථකාමිත්වය නිසා මේ ප්‍රශ්නය දෙස බලන්න එපාය කියා. ජාතිය පාවා දීපු උදවිය මහවලතැන්න වලව්වෙන් බෝ වුණා මිස අපේ එක්සත් ජාතික පක්ෂයෙන් බෝ වුණේ නැති බව ප්‍රකාශ කරන අතර ජාතිය පාවා දීපු එවුන් ඉන්නේ කොයි පැත්තේද කියා අවබෝධ කර ගන්නා හැටියට මහා සංඝයා වහන්සේලාගෙන් ඉල්ලමින් මම නිහඬ වෙනවා.

අ. භා. 3. 15

**ආනන්ද දසනායක මහතා**
**(திரு. ஆனந்த தஸநாயக்க)**
(Mr. Ananda Dassanayake)

නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, හදිසි නීතිය දීර්ඝ කිරීමේ මේ විවාදය දැන් අපේ ජාතිය ආරක්ෂා කර ගැනීමේ, අපේ රට ආරක්ෂා කර ගැනීමේ විවාදයක් බවට පෙරළිලා තිබෙනවා. මේ විවාදය දැන් ඒ ගැන සාකච්ඡා කරන, ' ඔෆිෂියල් ' නොවෙයි ' අන්ඔෆිෂියල් ටෝක් ' එකක් වගෙයි. නිකම් ඔහේ කථා කර - කර ඉන්නවා. කිසිම තීරණයක් නැහැ. ඒ විධියේ තත්ත්වයක් නොවෙයිද, දැන් තිබෙන්නේ ? අවුරුදු දෙකකටත් වඩා කාලයක් අපි මේකට ගත කර තිබෙනවා. සර්ව පාක්ෂික සාකච්ඡා අවුරුද්දකට වැඩි කාලයක් කරගෙන ගියත් අන්තිමේදී ඒ සාකච්ඡා සම්පූර්ණයෙන්ම බිඳ වැටුණා.

ඊට පස්සේ ආණ්ඩුව තීරණය කළේ මොකක්ද ? ' අපි නැවත මේ සම්බන්ධයෙන් සාකච්ඡා කරන්නේ නැහැ, කියලා කොන්දේසියක් දැම්මා. මොකක්ද, කොන්දේසිය ? ජනාධිපතිතුමාත්, ජාතික ආරක්ෂක ඇමතිතුමාත් පැහැදිලිවම කියා තිබෙනවා, ත්‍රස්තවාදීන් අවි බිම තබා රටේ සාමය ඇති කරන තුරු සාකච්ඡා කරන්නේ නැත කියා.

අනේ, එහෙම කියල මාස දෙකයි ගියේ. ඊළඟට නැවතත් සාකච්ඡා පටන් ගන්නා. අනුරාධපුරයට ගැහුවා විතරයි, ' දැන් අපි සාකච්ඡාවට සූදානම් ' කීවා. මේ අනුව බැලුවාම හදිසි නීතියෙන් සත පහකවත් වැඩක් අරගෙන තිබෙනවාද කියා හිතෙනවා. [බාධා කිරීම්] උතුරු – නැගෙනහිර ප්‍රදේශවල පවතින තත්ත්වය දිහා බැලුවාම නම් සත පහක වැඩක් සිදු වී තිබෙන බවක් පෙනෙන්නේ නැහැ. නමුත් රුපියල් කෝටි – ප්‍රකෝටි ගණන් වියදම් කරන බව නම් ඇත්තයි. මාසයෙන් – මාසය හදිසි නීතිය දීර්ඝ කරනවා. පාර්ලිමේන්තු කටයුතු හා ක්‍රීඩා ඇමතිතුමා මාසයක් පාසා බණ දේශනය වගේ පැයක විතර කාලයක් තුළ විස්තරයක් ඉදිරිපත් කරනවා. අවසානයේදී කියනවා, ' අපි මේ සැරේ තද පියවර ගන්නවා ' කියා. [බාධා කිරීම්]

**ආර්. පී. විජේසිරි මහතා (කුණ්ඩසාලේ)**
**(திரு. ஆர். பீ. விஜேசிறி—குண்டசாலே)**
(Mr. R. P. Wijesiri – Kundasale)

ප්‍රංශයට ගියාට පස්සේ සද්දෙ වැඩියි වගේ.

**ආනන්ද දසනායක මහතා**
**(திரு. ஆனந்த தஸநாயக்க)**
(Mr. Ananda Dassanayake)

ඒ තමුන්නාන්සේගේ.

**රිචඩ් පතිරණ මහතා**
**(திரு. றிச்சட் பத்திரன)**
(Mr. Richard Pathirana)

කුණ්ඩසාලේ ගරු මන්ත්‍රීතුමාට (ආර්. පී. විජේසිරි මහතා) දැන් ප්‍රංශය අමතක වෙන්නෙම නැහැ.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
**(குழு உப தலைவர்)**
(The Deputy Chairman of Committees)

ප්‍රංශය ගැන නොවෙයි, හදිසි නීතිය ගැන කථා කරන්න.

**ආනන්ද දසනායක මහතා**
**(திரு. ஆனந்த தஸநாயக்க)**
(Mr. Ananda Dassanayake)

මේ විධියට මාසයක් පාසා හදිසි නීතිය දීර්ඝ කිරීමෙන් ආණ්ඩුව ප්‍රයෝජනයක් අරගෙන තිබෙනවාද ? සාමාන්‍ය නීතිය මගින් මැඩලන්න බැරි යම්කිසි නීති විරෝධී වැඩක් තිබෙනවා නම් ඒක මැඩලන්නයි, හදිසි නීතිය පාවිච්චි කරන්නේ. නමුත් උතුරේත්, නැගෙනහිරත් එකම තැනකවත් ඒවා මැඩපවත්වන්න තමුන්නාන්සේලාට පුළුවන් වුණාද ? ' සර්වේලන්ස් සෝන් ' කියලා ආවේක්ෂණ නැත්නම් නිරීක්ෂක බල ප්‍රදේශයක් දැම්මා. ඒ ප්‍රදේශයට එන්න කාටවත් ඉඩ දෙන්නේ නැතැයි කීවා. අනේ, ' ඒක තාවකාලිකව අස් කළා ' යි එක පාරටම ජනාධිපතිතුමා කීවා. සාමය සඳහා ආණ්ඩුව අවි බිම තැබුවා. ආණ්ඩුව අවි බිම තබන විට ත්‍රස්තවාදීනුත් අවි බිම තැබුවාද ? තමුන්නාන්සේලා ඒ ගැන කල්පනා කළේ නැහැ. එහෙම නම් දෙගොල්ලම අවි බිම තබන්න ඕනෑ. තමුන්නාන්සේලා හදිසි නීතියෙන් ගත්තා ප්‍රයෝජනය මොකක්ද ? ආණ්ඩුව දකුණට පමණක් හදිසි නීතිය ක්‍රියාත්මක කරනවා. උතුරටයි, නැගෙනහිරටයි වචන මාත්‍රයකින්වත් හදිසි නීතිය ක්‍රියාත්මක වන බවක් පෙනෙන්නේ නැහැ. එහෙම නම් මොකක්ද, මේ රටේ ඇති පාලනය ?

අපි ඊයේ - පෙරේද එක්සත් රාජධානියට ගිය වෙලාවේදී මම එක් කෙනෙක් - දෙන්නෙක් සමඟ සාකච්ඡා කළා. ඒ අය කීවා, ' අපි කවදාවත් අයර්ලන්තයේ ඒ ගොල්ලන්ට නිදහස දෙන්නේ නැහැ, ඒ ගොල්ල එක්ක සටන් කරනවා, ඒ අය වැරදි කරනවා නම් ඒ අයට දඬුවම් දෙනවා ' කියා අවුරුදු 116 ක් ගතවෙලා තිබෙනවා. තවමත් දුන්නෙ නැහැ. නමුත් අවුරුද්ද දෙක යනවිට අපේ ආණ්ඩුවට බැරිවෙලා තිබෙනවා උතුරෙත් නැගෙනහිරෙත් ඒ මිනිසුන්ගේ ආරක්ෂාව සලසන්න. මේ ආණ්ඩුව වාගේ සාමය සහ නීතිය ආරක්ෂා කරන්නට බැරි ආණ්ඩුවක් නම් කවදාවත් මේ රටේ ඇති වුණේ නැහැ. මොකක්ද මේ කියන්නෙ ? තමුන්නාන්සේලා ආණ්ඩු පක්ෂයේ සිටින නිසා සමහරවිට වැරදි දුටුවත් තමුන්නාන්සේලාට කතා කරන්න බැහැ. අත් කටවල් බැඳලා තිබෙන්නෙ. තමුන්නාන්සේලා ආණ්ඩුවක් හැටියට ත්‍රස්තවාදීන් තුන්දාහකට, හාරදහකට නැත්නම්, තුන් හාර සියයකට යට වෙනවා. නමුත් ඒ වාගේ එකක් මේ ප්‍රදේශයෙන් ඇති වුණොත් තමුන්නාන්සේලා නිහඬ වෙනවාද ? එහෙම කැරැල්ලක් ඇති වුණොත් ඒකට ගන්න පිළියම මොකක්ද ? එහෙම අවස්ථාවක වෙඩි තියන්නෙ නැද්ද ? ඇඳිරි නීතිය දාන්නෙ නැද්ද ? එහෙම කරලා ඔවුන් මර්ධනය කරන්නේ නැද්ද ? ඇයි උතුරේ ඒක කරන්න බැරි ? සාම සාකච්ඡා සියල්ලම කරන්න ඉස්සරවෙලා මේ ආණ්ඩුවට අපි කියන්න ඕනෑ බලතල පාවිච්චි කරන්නය කියා. ඉස්සරවෙලා උතුරේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නැගෙනහිරේ තිබෙන ශක්තිය, ආණ්ඩුවේ ශක්තිය, රටේ ශක්තිය, මහජන ආධිපත්‍යය ඒ ප්‍රදේශයේ පිහිටුවන්නට ඕනෑ. එසේ මහජන ආධිපත්‍යය පිහිටුවීමෙන් පසුවයි අපි සාකච්ඡා කරන්න ඕනෑ. ඒක කරන්නෙ නැත්නම් මේ ප්‍රශ්නය කවදාවත් විසඳන්න බැහැ. ඒකයි අපේ හැඟීම.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙතැන පත්තර ගොඩක් තිබෙනවා. නමුත් මේවා කියවන්න අවශ්‍ය නැහැ. අපේ අක්මීමන ගරු මන්ත්‍රීතුමා ඒවා (රිචඩ් පතිරණ මහතා) කියෙව්වා. ඒ ටිකමයි මටත් කියන්න තිබෙන්නෙ. උතුරු නැගෙනහිර ප්‍රදේශවල විශේෂයෙන් යාපනේ—යාපනේ පමණක් ද්‍රවිඩ නොවන පවුල් 27,000 ක් පමණ පදිංචිවෙලා සිටියා. ඔවුන්ට ඡන්ද බලය තිබුණා. ඔවුන් ඡන්දය පාවිච්චි කලා. ඒ වාගේම බිස්නස් ආදියත් කලා. ඔවුන්ට වතුපිටි තිබුණා. ගෙවල් දොරවල් තිබුණා. ඒ සියල්ලක්ම පාරම්පරිකව ආ ඒවා. ඒවාට මොකද වුණේ ? ඒ මිනිස්සුන් සියල්ලන්ම එලවන තුරු 1977 සිට 1982, 1983 වනතුරු බලාගෙන සිටියා. ඇයි බලාගෙන සිටියේ ? වෙන කිසිවක් නිසා නොවෙයි, සිංහලයාට කොපමණ පහර ගැසුවත්, ජනාධිපතිතුමාටත්, ආණ්ඩුවටත් ඕනෑ කලේ ඔවුන්ගේ ඡන්දය ලබා ගැනීමයි. ඒ නිසා නිශ්ශබ්දව සිටියා. එතැනයි වරද. අවුරුදු හයක්ම නිශ්ශබ්දව සිටියා. උතුරේ ඡන්ද බලාපොරොත්තුවෙන් සිංහල ජනතාව, මුස්ලිම් ජනතාව ඒ ප්‍රදේශයෙන් එලවා දමනතුරු බලාගෙන සිටියා. ඒක එහෙම කලා.

ඒ පියවරෙන් ඔවුන්ට ජයග්‍රහණයක් ලැබුණා. ලැබුණාම මොකක්ද කලේ ? ඊළඟට කන්කසන්තුරේ පොලීසියට ගැහුවාම මොකක්ද කලේ ? ආණ්ඩුවක් වශයෙන් පොලීසියකට ගැහුවාම, ඒ පොලීසියට ගහලා විනාශ කලාම ආණ්ඩුවේ මුළු යුද්ධ ශක්තියම යොදවා පසුවදම එතැන පොලීසිය පිහිටුවන්න වුවමනා නේද ? නමුත් එහෙම කලේ නැහැ. නියපොත්තෙන් කඩන්න තිබුණු දේ දැන් පොරවෙන් කපන්නටවත් බැහැ. ඒ තරම් භයානක තත්ත්වයකට පත්වුණා. මොකක්ද කලේ ආණ්ඩුව ? එතැනදිත් සම්පූර්ණ අසාර්ථක තත්ත්වයකට වැටුණා. ඒ වාගේම ආබාධිත තත්ත්වයකට වැටුණා. ආණ්ඩුව ලෙඩෙක් වුණා. ඇයි එහෙම වුණේ ? පළමුවැනි පියවරේදීම, එතැනදිම සටන දුන්නා නම් කන්කසන්තුරේ පොලීසියට ගහනකොටම පසුවදම පොලීසිය පිහිටෙව්වා නම් යුද්ධ ශක්තිය තරකර එතැන සිට සටන් කලා නම්, ඔවුන් වාවාකච්චේරියට එන්නෙ නැහැ. මුහුදු වෙරළෙන්ම ගහලා එලවන්නට තිබුණා. එහෙම නම්, ඒ විධියට නොකර, අදූරදර්ශීව කටයුතු කල නිසා තමන්ගේ දුර්වලකම් පෙන්ව පෙන්වා කටයුතු කල නිසා මේ ආණ්ඩුව අද මේ තත්ත්වයට පත්වෙලා තිබෙනවා. අදත් අපි කියන්නේ ආණ්ඩුව හරියට පියවරක් ගන්නවා නම් ඉස්සරවෙලාම මර්ධන නීති ක්‍රියාත්මක කරන්නට ඕනෑය කියන එකයි. දශ රාජ ධර්මයෙන් රාජ්‍ය කළත් මර්ධන නීතිය ඒකට ඇතුළත් වෙනවා. රජයක් නම් කෙළින් ඉන්නට ඕනෑ. ඒ වාගේම මර්ධනය කිරීමත් කරන්නට ඕනෑ. එහෙම නැත්නම් ආණ්ඩුවක් ගෙනයන්නට බැහැ. නමුත් අද මොකක්ද වෙන්නේ ? වැරදි නොකරන, අසිංසකයිත් මර්ධනය කරන්නට හදිසි නීතිය තබාගන්නවා.

මේ උතුරෙනුත්, නැගෙනහිරෙනුත් පහළට තල්ලුවෙලා එන සිංහල, මුස්ලිම් ජනතාවට — අද සමහරවිට 60,000 ක්, 70,000 ක් පමණ අයගෙන් විසි තිස්දහකට පමණ අද කන්නට නැතුව අනුන්ගෙන් ඉල්ල ඉල්ලා කන්නට සිද්ධවෙලා තිබෙනවා. ඒ අයට ඉන්නට තැනක් නැහැ, ගෙයක් දෙරක් නැහැ. වස්තුවක් නැහැ. රස්සාවක් නැහැ. ළමයින්ට උගන්වන්නට ක්‍රමයක් නැහැ. ආණ්ඩුවක් වුණාම මේවා ගැන සලකා බලන්නට ඕනෑ නේද ?

මේ අපේ සිංහල රටේ සිංහලයන් අනාථවුණු පළමුවැනි වතාව. මේක සිංහලයන් අනාථවුණු පළමුවැනි වතාව. සිංහලයන් වගේම මුස්ලිම්වරුනුත් ලාංකිකයෝ. අද ඒ අයත් අනාථවෙලා. දැන් උතුරු නැගෙනහිර පළාත් දෙකෙන්ම සිංහලයන් එලවනවා. ඊළඟට උතුරුමැද පළාතේ වැඩි තරමක් සිංහලයන් බිය වද්දා ඒ අය ඒ ස්ථානවලින් පන්නා දමනවා. අසවල් දවසට ඉස්සරවෙලා ඉවත් වුණේ නැත්නම් මරනවාය කියනවා. ඊළඟට බෝම්බයක් ගෙනහිත් ගම මැද්දේ ගහලා ගමේ අය ගියේ නැත්නම් අතිත් දවසේ සියලු දෙනාම මරා දමනවාය කියනවා. තත්ත්වය මේක නම් රටක ආණ්ඩුවක් තිබෙන්නේ කොහොමද කියන එක අපට අහන්නට සිදු වී තිබෙනවා. ආණ්ඩුවක් හැටියට නම් රටේ හැම තැනම එක නීතියක් තිබෙන්නට ඕනෑ. දකුණේ යම්කිසි පුද්ගලයෙක් පොඩි වැරදීමකින් හරි පත්‍රිකාවක් ගැහුවොත් එයා රිමාන්ඩ් කරනවා. උතුරේ ' ටැක්ස් ' ගෙවන්නේ නැහැ. කිසිම බද්දක් ගෙවන්නේ නැහැ. ඒ වාගේම සිවිල් නීති සම්පූර්ණයෙන්ම කඩා දමනවා. එහෙම නම් ඔවුන්ට ඒ අතිනුත් වාසියි. ඊළඟට ඔවුන් ' ක්‍රිමිනල් ' වැරදි දහස් සංඛ්‍යාතව කරනවා. කිසිම දඬුවමක් නැහැ. එන්න එන්නම පහළට — දකුණට—එනවා. එහෙම නම් අපි කොතැනටද ගිහිහින් නවතින්නේ ?

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම එකක් කියන්නට කැමතියි. රැවුලට ගිනි අරගෙන දහලන විට ඒ අතරේ සුරුට්ටු පත්තු කරගන්නට දඟලන තවත් මිනිහෙක් මෙහෙ ඉන්නවා. ඔය කැබිනට් මණ්ඩලය ශුද්ධ කර ගන්නා තුරු මේ සටන ගෙන යන්නට බැහැ. කැබිනට් මණ්ඩලයේ ඔත්තුකාරයන් තුන් හතර දෙනෙක් ඉන්නවා. එයින් එක්කෙනෙක් තමයි, ග්‍රාමීය කර්මාන්ත සංවර්ධන ඇමතිතුමා. ග්‍රාමීය කර්මාන්ත සංවර්ධන ඇමතිතුමා සුරුට්ටු පත්තු කරගන්න උත්සහ කරනවා. මොකක්ද ? මලයනාඩුවක් ගන්න. එච්. ඩබ්ලිව්. ජයවර්ධන මහත්මයා මගින් යෝජනාවක් කර තිබෙනවා. එච්. ඩබ්ලිව්. ජයවර්ධන මහත්මයා කියන ඒවා කවුද ගණන් ගන්නේ කියා හම්බන්තොට දිසා ඇමතිතුමා කිව්වා. මම හිතන විධියට ඒ සාකච්ඡාවට යවා සිටින ප්‍රධාන පෙළේ නියෝජිතයා එච්. ඩබ්ලිව්. ජයවර්ධන මහත්මයායි. කැබිනට් එකෙන් කෙනෙක් තෝරා ගන්නට බැහැ. කැබිනට් ඇමතිවරයෙක් ගැන රජයට විශ්වාසයක් නැහැ. කැබිනට් එකෙනුත් නැතිව, කිසිම කෙනෙකුට කථා කරන්නට නොදී – [බාධාකිරීමක්]

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
**(குழுப் பிரதித் தலைவர் அவர்கள்)**
(The Deputy Chairman of Committees)

Order, please ! Mr. Deputy Speaker will now take the Chair.

*අනතුරුව නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [නෝමන් වෛද්‍යරත්න මහතා] මූලාසනාරූඪ විය.*

*அதன் பிறகு, குழுப் பிரதித் தலைவர் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [திரு. நோமன் வைத்யரத்ன] தலைமை வகித்தார்கள்.*

*Whereupon* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the chair and* MR. DEPUTY SPEAKER [MR. NORMAN WAIDYARATNA] *took the Chair.*

**නියෝජ්‍ය කථානායකතුමා**
**(பிரதிச் சபாநாயகர் அவர்கள்)**
(Mr. Deputy Speaker)

Please wind-up.

**ආනන්ද දසනායක මහතා**
**(திரு. ஆனந்த தஸநாயக்க)**
(Mr. Ananda Dassanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට කථා කරන්නට ලැබී තිබෙන කාලය අවසන් වේගෙන යනවා. තිම්පු සාකච්ඡාවට ගිය කණ්ඩායමේ ප්‍රධාන පෙළේ නායකයා එච්. ඩබ්ලිව්. ජයවර්ධන මහත්මයායි. එතුමා මගින් ඉදිරිපත් කර තිබෙන යෝජනා වගයක් මහරගම ගරු මන්ත්‍රීතුමා (දිනේෂ් ගුණවර්ධන මහතා) පැහැදිලි කලා. ඒ යෝජනාවලින් එකක් තමයි, තොණ්ඩමන් මහත්මයාගේ පාලනය යටතේ තිබෙන සී. ඩබ්ලිව්. සී. නමැති ජාතිවාදී සංවිධානයෙන් කියා තිබෙන පරිදි මධ්‍යම ප්‍රදේශයටත් උතුරට හා නැගෙනහිරට වගේ ප්‍රාන්ත රාජ්‍යය් – මලයනාඩුවක් – ලබාදීම. ඇත්ත වශයෙන්ම කියනවා නම් රැවුල පත්තුවෙලා මෙහේ ගිනි අරගෙන දඟලනවා. මේ මනුෂ්‍යයා ඉඳගෙන රැවුලෙන් සුරුට්ටු පත්තු කරගන්න දඟලනවා. මේ සුරුට්ටුකාරයන් කැබිනට් මණ්ඩලයෙන් ශුද්ධ කර අහක් කරන තුරු මේ රටේ තිබෙන ඔය ප්‍රශ්නය විසඳන්නට ලැබෙන්නේ නැහැ. එහෙම නම් තමුන්නාන්සේලාට රට ආරක්ෂා කරගන්න ඕනෑ නම් ඉස්සරවෙලා කැබිනට් මණ්ඩලය ශුද්ධ කරගන්න. කැබිනට් මණ්ඩලයෙනුයි එහාට ඔත්තු සපයන්නේ ; රහස් සපයන්නේ. ඒ අය වැඩි දෙනෙක් ඔය කැබිනට් මණ්ඩලය තුළ ඉන්නවා. එහෙම නම් ඒ අය දෙපැත්ත කපන බව මම චෝදනා කර කියනවා. එහාට ගිහිත් එකක් කියනවා. ත්‍රස්තවාදීන් හමු වී එකක් ප්‍රකාශ කරනවා. ඒ අය සමඟ සාකච්ඡා කරනවා. මෙහේ ඇවිදින් තව එකක් කිනයනවා. මේ විධියට රැවටිල්ලකුයි කරන්නේ. ඒ නිසා ආණ්ඩුව පැහැදිලි පියවරක් ගන්නට ඕනෑ. මේ රටේ ජාතියේ නාමයෙන් නැඟී සිටින්ට පුළුවන් තත්ත්වයට පළමුවෙන්ම ආණ්ඩුව ශුද්ධ කර ගන්න. ඒ තත්ත්වය ඇති වුණොත් මේ ප්‍රශ්නය විසඳන්නට පුළුවන් වෙනවා.

අ. භා 3.29

**අනුර බණ්ඩාරනායක මහතා**
**(திரு. அனுர பண்டாரநாயக்க)**
(Mr. Anura Bandaranaike)

Sir, at the very beginning I had decided not to participate in this Debate and requested the hon.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[අනුර බණ්ඩාරනායක මහතා]

Member for Attanagalla to wind-up the Debate on behalf of the Opposition, but I am just taking two minutes of his time to clarify an absolute falsification that was stated on the Floor of this House by the Hon. Deputy Minister of Education. He has now graduated himself to become the most vulgar and the most abusive speaker of the Government ranks! Sir, I was not in the House at the time. I had an Ambassador in my Chambers. So I had to leave the House for ten to fifteen minutes, and I believe he has stated that i made various remarks about the refugees in Trincomalee, but that I have not spoken anything about them before this. I do not want these lies and falsehoods to remain in HANSARD.

If you go through every single Emergency Debate you would see that I have spoken on behalf of the refugees in Trincomalee. It is not only I, but every single Member of the Sri Lanka Freedom Party has spoken on behalf of the refugees. I wrote to His Excellency the President within the first three days of the Sinhala refugees increasing in the Trincomalee district. Furthermore, I believe I was the only politician who went there, apart from one or two, others; before any Minister went there. The President has never been there yet and the Hon. Prime Minister has not gone there yet. I went to Seruwila and visited more than ten refugee camps. I distributed food., medicines clothing and various other items that they required. They were all collected form private donations and worth over Rs. 400.000. Last week the Sri Lanka Freedom Party sent 14 lorry loads of food and clothing, again collected form private donations. Therefore he must be thinking about his own leaders who has up to date not visited a single refugee camp, not visited one single refugee camp – [*Interruption*] Sir, I will not give way.

වීරවන්නි සමරවීර මහතා
(திரு. வீரவன்னி சமரவீர)
(Mr. Weerawanni Samaraweera)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම කීවේ සභාවේ කථා කළ එක නොවෙයි. ඔය තරම් කැක්කුමකින් කථා කරන මනුෂ්‍යයා ඇයි බත්දරි ඇමතිතුමා සමග සාකච්ජා කළේ නැත්තේ.– [*Interruption*]

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(Mr. Deputy Speaker)

කරුණාකර වාඩිවෙන්න.

අනුර බණ්ඩාරනායක මහතා
(திரு. அனுர பண்டாரநாயக்க)
(Mr. Anura Bandaranaike)

I am not giving way.

Therefore, I do not want Members to come to this House and in the absence of other Members to make completely false and diabolical accusations. So I want this corrected.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

Mr. Deputy Speaker, at this moment I do not wish to take much of your time just unswering. I thought it was a very absurd submission that was made by the Hon. Deputy Minister of Education when he said that the Sri Lanka Freedom Party walked out of this House last time saying that we will join up with the Maha Sanga and others and oppose every move or sabotage every move or whatever proposals that are going to be submitted. That is a total falsehood, because at the last Emergency Debate on the 25th of July and on the 26th of July we fyully participated in it and not only that we were here for the voting. I am sure he must be thinking of the previous time. It is true that on the previous occasion we walked out but it was not for that reason. It was because we were not given adequate time. He might recolect that. Therefore, I want this to be corrected, and I hope he will realize at least now to come out with the facts in the proper manne when he makes a speech.

Sir, I am very happy that we heard afrer a long time a valuable contribution being made in this House by the young hon. Membe for Hanguranketa. I wish to congratulate him, because he has made an important point, namely, that he has collected certain facts pertainig to the Sinhalese people living inthe Eastetn Province and the history of it. He even explored the situation where at the first particular time certain parts of the Easten Province were colonized, were Sinhalese areas, and that it stretched right up to the sea. Therefore I must congratulate him for giving us that valuable bit of information in history.

Now, I would like to say we are not very happy if the talks for the reconciliation of this problem are going to fail. It is a very unfortunate thing. I must state categorically that we got the information yesterday from his Excellency the President who has stated in the "Daily News" that he was very confident of the success of the Thimpu talks. He has mentioned this fact to the Cabinet and this happened last morning, but the amazing thing was that on Sunday at about 2 p.m. Mark Taby from New Delhi had given a BBC announcement to say that the terrorists have declared war on Sri Lanka ! Not only that, we are now made to understand that no discussions were held in Thimpu bvetween the two sides since Saturday last. You can just imagine, for five days this was hidden from us. None of us knew what was happening in Thimpu. The last discussion that the two parties had was on Saturday. On Sunday the BBC announcement comes out and a statement from the government yesterday by Dr. Anandatissa de Alwis states that His Excellency was very happy about the success that is being made in Thimpu, and last afternoon we heard the awful news saying that the talks are adjourned. Mr. Dixit, the

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Indian Ambassador here is the one who gave us this information. Up to this date, up to this very moment, neither the government, nor His Excellency, Nor the Hon. Prime Minister made any announcement of this fact that the Thimpu talks have now been postponed or adjourned for another date. Some say it is abondoned, some say it might not come at all, some say there will be another venue, various people say various things. I think it is high time the government made an official statment pertaining to this fact as to what really happened in Thimpu.

I do not want to go on with the other statements that had been made by Dr. Anandatissa de Alwis but I am very sorry that the government has still not given this country a complete picture of what had happened at the Thimpu talks. Everyone knew that when the Thimpu talks were announced that it was going to be a failure. None of us are babes, Sir, we are not little children. They definitely knew. When you look at the composition of the team that went to Thimpu no one took it very seriously. Not only that, this government did not take it seriously, the people did not take it seriously, the Indian government did not take it seriously, nor did the terrorists take it seriously -[*Interruption*]- Whom did they send ? When we looked at the team I was shocked to find they were all lawyers. This is a situation where only lawyers cannot solve this problem. It may be that the lawyers are useful. In that case if they want to have a partition then you must send partition lawyers. There are very good partition lawyers in our country. But here again –

මන්ත්‍රීවරයෙක්
(அங்கத்தவர் ஒருவர்)
(A Member)

Surveyors.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

Surveyors. Yes, they should have taken them. But what happened ? They should have taken eminent diplomats. We have in our country yet people like Mr. Neville Kanakaratne, Mr, Gamini Corea, Mr. Weeramantri, Mr. Esmond Wickremasinghe. I will not say he is not eminent.

අනුර බණ්ඩාරනායක මහතා
(திரு. அனுர பண்டாரநாயக்க)
(Mr. Anura Bandaranaike)

Pre-eminent.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

Either journalists or historians, a university don, they are the people who should have gone. I could understand, Sir, if they are the people who had gone. They are the people who should have gone. What I personally feel is that the whole structure of the entire team that went there was incorrect and the whole proposal was wrongly handled. From the very first moment what happened was it was decided that the proposals are to be rejected. It is true that the submission was made by Mr. H. W. Jayewardene but it was submitted in a manner for anyone to reject all the proposals. There were four proposals made. One is about the homelands, the other one is about self-determination, the third one is about nationality and the fourth one is about the 94,000 Indians. They accepted the one about the 94,000 Indians. The total submission that was made was rejected by the terrorists, by the other party. From that time onwards it became a mockery. The entire exercise came down just to be an utter mockery and no one took it seriously.

On the other hand, whatever submissions that were made by the other side, we ourselves did not take them seriously and ultimately it became a total failure. We all knew that Mr. Bhandari had to be rushed there because there was no proper calculation of the situation of what had happened in this country. There were various submissions made. I can remember there was the occasion where the Hon. Minister of Transport had gone to Saudi Arabia and given a press interview. There he had categorically stated – I do not know from where he got it – that there are Eastern European countries who are supporting the terrorists. Noe, those are the very words that he has used.

අනුර බණ්ඩාරනායක මහතා
(திரு. அனுர பண்டாரநாயக்க)
(Mr. Anura Bandaranaike)

Who is the person ?

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

Hon. M. H. Mohamed. I think I have that quotation. I cannot remember where it is. I think he said so. Then he was asked whether Libya was involved. He said "No". Likewise the whole thing went. Now there is another angle to it. There is no concentrated or proper assessment of the situation as to what has happened and therefore, I think, the entire picture that has been given to the world at large or the world media is completely anti-Government and not anything that would be useful to the Government. So much so, I am very worried about the next situation that will arise because we did not take proper action with regard to the Anuradhapura attack and on which Mr. G. V. P. Samarasinghe has been asked to report, which we never saw. I asked for that report here but that report did not come.

The next mistake that the Government made was to release 536 so-called terrorists, and from that day onwards, Sir, you might recollect how much we tried to take those fishermen of Negombo back who lived in

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ලක්ෂ්මන් ජයකොඩි මහතා]

Kokilai, Nayaru and Salai. We have not been able to take any of those people back. They are all here. The reason being that most of them are being terrorised again by those very terrorists who have been released from the camp at Boosa.

Then there is the case of the Rest House Keeper of Mullaitivu and the entire Vavuniya Tekkawatte are that is being attacked today. Mannar and Madhu cannot be reached; Trincomalee – Batticaloa road is most unsafe and Pawakkulama – Mannar road is also the same. Therefore, one has to consider what is going to happen next. It is obvious has we failed where the surveillance and security zone is concerned. I do not know how far we are going to rescined the Prevention of Terrorism Act. We do not know whether the resettlement scheme has started, how far it has gone or whether it has been stopped. Are we resettling people or are the people going to be settled in those unsettled areas? All these factors are there where the Government has come to a standstill.

We are also made to understand that the submissions made at Thimpu were on a federal style or Canadian Indian style federalism with a certain amount of regional autonomy. During this period we have asked the army to come to barracks. We have lifted the curfew. We have done all this but what is the end result? Have we achieved anything by doing all this? Have we gained anything? What is the advantage we have got?

Sir, it is a very serious matter, and serious thought has to be given to it mainly because the next step is going to be still more serious. The next step is this. When we see what is happening, according to the media, we find that there is going to be an internationalization of this problem in another manner. We were very lucky, Sir., at the beginning. We thought that it might be internationalized, but we managed to contain it within India-Sri Lanka. We did not allow it to go beyond India. But now we might see people like the British MPs getting activated again. People like Richard Balfe, Barbara Castle, Llewellyn Smith, all Members of Parliament, are getting interested in this problem again–Members of the House of Lords and Members of the House of Commons. In the United States, the Reagan administration is again going to testify as a US House of Representative through the US Deputy Assistant Secretary of State, Robert Peck, about our problem in the near future. Then, Sir, there is another organization called SCOT, the London-based Human Rights Council of Standing Committee of Tamils. They are getting activated. There is another organization, an emergency committee called SIFEC – Standing International Forum on Ethnic Conflict and Development of Human Rights established by the Norwegian Peace Research Institute and the Netherlands Institute. There is another organization, again in London, called SIFEC that is getting interested in what is happening in Sri Lanka. Then there is the organization called Eelam Tamil Association of Quebec in Canada.

All this shows, Sir, that there is going to be another showdown, another diplomatic onslaught on this problem against Sri Lanka in the UN General Assembly. Are we prepared for a situation like that?

Some time ago, Sir, we all came to know that there are contries favouring the division of our country. One perhaps is Mauritius, and it may be that very soon Mauritius will make a submission in the United Nations. You can recollect, Sir, how Korea was divided, how Yemen was divided, how Vietnam was divided and how Germany was divided. There again, they used an important term. The important term was "ceasefire". They accepted the word "ceasefire" which was used at that time. When we use the word "ceasefire" we are asking our enemy to stop firing. On the other hand, we are committing ourselves to a ceasefire. We ask both sides to stop firing. We use the word "ceasefire" if we are going to accept the enemy as a legalized army. If it is a legalized army we can use the word "ceasefire". But what are we doing? We are using the word "ceasefire" in regard to a terrorist guerilla group. We must ask them to lay down arms. It is not the word "ceasefire" that should be used. I learnt this when we had this problem in 1971. It was a specific decision of certain lawyers who said, "Do not use the term 'ceasefire' but use the term 'lay down arms' and nogotiate." What we should have done was, we should have asked them to lay down arms and nogotiate and not ceasefire and nogotiate.

This is very important, Sir, because the next step would be, if we cannot come to an agreement, if the matter goes to a world forum or international organization, that there would be a UN peace – keeping force. That would be the next step.

We all know that the terrorists want to come right up to Vavuniya. Everyone knows it. Everyone knows that they want to come right up to Manampitiya. In fact they want to come right up to Manampitiya because they want to connect the Gammuduwa area to the Mahaweli Ganga, and beyond the Mahaeli Ganga is Manampitiya. It is history and common knowlwdge. Then the central hills will have an open corridor right down to the sea.

Therefore, Sir we would like to know from the Government what information they have about the internationalization of this problem in the coming months.–[*Interruption*]. A sovereign Government will be forced to ask for it. That is exactly what I am saying.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

I am very happy that the hon. Member raised that matter. We may be forced to. How do you know ? Did we expect the situation of today, say, six months ago ? We never expected this situation at the beginning of the year. No, Sir ! Therefore, we should be careful of what is going to happen because from every area, from all quarters, we are made to understand that at the present boundaries, which we now call the North and the East, the Sinhala people are being chased away gradually, so much so that we find it difficult to find a Sinhala person in a place like Kinniya or Gomarankadawela, the the Sinhala areas of Seruwila and even Morawewa. They are all running away ! I think it is something that we will have to think about more seriously than we are doing now because the situation is becoming graver and graver every day.

Sir, I want to move away from matters prtaining to the Tamil problem to another problem that arose yesterday which I wanted to speak on. Yesterday, Sir, the Hon. Minister of Fisheries made a very serious charge against two persons, or perhaps one person. The charge was against one person who has been a Secretary of a Ministry. Some time ago also I think a very serious charge was made by the Hon. Minister of Finance pertaining to an hon. Member of this House over an organization called Kelaniya Foundation, and he pressed that day that they should hold a Presidential inquiry against the type of corruption that is taking place in this country. What I say is this, Sir. At one time we had the situation where Dr. Neville Fernando was removed by this Government. Even though there was a court injunction saying that he was very critical of the President, yet he was removed by the Government. Of course, he resigned. What I say is, if there is going to be so much corruption in the country, corruption in the Government, by having corrupt men at various places, I think the Government should take a very important decision as to what they are going to do and revive the Presidential inquiry or Presidential Commission to proceed against those who have made mistakes.

In this Debate today, Sir, I want to make a point very clear. Sir, we were told that the Sri Lanka Freedom Party and some others have got together in order to sabotage the activities of this Government pertaining to the Thimpu talks and the ethnic problem. I want to be very clear and very categorical on this. We formed a National Front. That National Front was formed mainly because there was no broad front of Sinhala-speaking people to talk about their side of the problem. We found that in this country there were so many to speak about the minorities – quite rightly – but at the same time we found there was no broad front to talk about the Sinhalese people's point of view. There is Mr. A. C. Goonaratne. You cannot call him an SLFPer. Mr. A. C. Goonaratne has been a long standing member of te United National Party. He was a member of its Disciplinary committee. He has joined this front.–[*interruption*]. Suriyapperuma and Niyathapala are membes of the Sri Lanka Freedom Party. I am not talking about them. I am talking about members who are not members of the Sri Lanka Freedom Party. Mr. Suriyapperuma and Mr. Jinadasa Niyathapala are members of the Sri Lanka Freedom Party.–[*Interruption*]. He is representing the BTS. You cannot call M. B. Ariyapala an SLFPer. Professor Ariyapala is treasurer of the Royal Asiantic Society and Chairman of the All Ceyon Buddhist Congress. Mr. Siri Perera is the Chairman of the YMBA. They are all members of Buddhist organizations, and they are not there illegally. They are not people who are just purporting to be members. They are definitely people elected to these organizations which represent the Buddhist public of this country. And therefore, Sir, I am very sorry to say, if ever–[*Interruption*]. Well, that was a political turncoat. I am telling you very frankly, there is nothing about it. He has just changed sides. I am not used to that sort of thing, though perhaps you are used to it. I do not know whether there are others here who are used to turning from this side to that side, but I am not used to it. Anyway he joined the Sri Lanka Freedom Party, and he is a member of the Sri Lanka Freedom Party now. Surely he has a right to be a member of the Sri Lanka Freedom Party ?

Anyway, Sir, what I feel sorry about is that are blacking out whatever the National Front of the Sinhala speaking people say. They should be heard. They are knocked off from the mass media and the news. I must say this. Last time, when they had a *sathyagraha* just outside Parliament about a mile away, I am very happy to say that the Hon. Prime Minister said, "Have more of such meetings ; have bigger fronts of this nature". It is not that we caught his hint, but it automatically happened that we had to do it. There must be someone to speak on behalf of that grouping also. Not only that, even the three nikayas met and they had their own members. Therefore, Sir, the fact remains that there must be some people to speak on their behalf.–[*Interruption*].

මල්වත්තේ ඉන්නවා. මල්වත්තේ ඉන්නවා, තිබ්බටුවාවේ රිදී විහාරේ මහා නායක හාමුදුරුවෝ. [බාධා කිරීමක්] නැහැ. මල්වත්තේ මහා නායක හාමුදුරුවෝ එන්නේ නැහැ. මොකද, උන් වහන්සේට පන්සලක් නැහැ. ඒක දන්නේ නැතුව ඇති. මල්වත්තේ මහා නායක හාමුදුරුවන්ට පන්සලක් කියලා නැහැ. අනික් මහා නායක හාමුදුරුවන්ට පන්සල් තිබෙනවා.

වීරසිංහ මල්ලිමාරච්චි මහතා
(திரு. வீரசிங்ஹ மல்லிமாரச்சி)
(Mr. Weerasinghe Mallimarachchi)
අස්ගිරියේට පන්සල් තියෙනවාද ?

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)
තියෙනවා. මුල්ලේගම මහා විහාරය ? මුල්ලේගම පන්සල ? [බාධා කිරීමක්] ඒක තමයි කියන්නෙ. ඒ තමයි නියම හාමුදුරුවෝ. ඒ



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ ලක්ෂ්මන් ජයකොඩි මහතා ]

තමුන්නාන්සේගේ දෘෂ්ට කෝණයෙන්. මගේ දෘෂ්ටි කෝණයෙන් නොවෙයි. පන්සලක් තිබෙන්නට ඕනෑ, හාමුදුරු නමකට. එහෙම නැතිනම් වන වාසී හෝ ග්‍රාම වාසී වෙන්නට ඕනෑ. කොහේ හරි තැනක් තිබෙන්නට ඕනෑ.

**වීරසිංහ මල්ලිමාරච්චි මහතා**
**(திரு. வீரசிங்ஹ மல்லிமாரச்சி)**
(Mr. Weerasinghe Mallimarachchi)

කිසිම දේකට ආශාවක් නැහැ.

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
(Mr. Lakshman Jayakody)

තමුන් ප්‍රශ්නය තිබෙන්නේ මෙතනයි. සිංහලයා වෙනුවෙන් කථා කරන්නට කවුරුවත් නැහැ. පත්‍රයක ප්‍රකාශනයක් පළ කරන්නට යැව්වොත්, ඒක පත්‍රයෙන් කපන්නය කියා නියෝගයක් කරනවා. එවැනි පත්‍රයක් හෙට–අනිද්ද වන විට රජයට පවරා ගත්තොත් මම ඒ ගැන පුදුම වෙන්නේ නැහැ.

**වෛද්‍යාචාර්ය පී. එම්. බී. සිරිල් මහතා**
**(வைத்திய கலாநிதி பீ. எம். பி. சிறில்)**
(Dr. P. M. B. Cyril)

ඒවාගේ දෙයක් කළොත් තමුන්නාන්සේ ඒක අනුමත කරනවාද ?

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
(Mr. Lakshman Jayakody)

මම පුදුම වෙන්නේ නැහැ. එවැනි ප්‍රකාශනයක් පත්‍රයක පළ කළොත් ඒ පත්‍රය රජයට ගත්තොත් මම ඒ ගැන පුදුම වෙන්නේ නැහැ. ඒ ක්‍රියාව මම අනුමත කරන්නේ නැහැ. මම ඒකට විරුද්ධයි.

**වෛද්‍යාචාර්ය පී. එම්. බී. සිරිල් මහතා**
**(வைத்திய கலாநிதி பீ. எம். பி. சிறில்)**
(Dr. P. M. B. Cyril)

පත්‍රය පවරා ගත්තොත් හොඳයි කියල කියනවාද ? [බාධා කිරීම්]

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
(Mr. Lakshman Jayakody)

මම දන්නවා, කරන්නට යන දේ. ඒක වහලා ආපසු දෙන්න යන්න නොවෙයි. මේක රජයේ පත්‍රයක් හැටියට පරිවර්තනය කර—ජේ.ඕ.බී.යූ.—ඊයේ අර " සීනෝර් " එකට කළ දේ වාගේ. එහෙම නැතිනම් ඊට ඉස්සර කළ දේවල් වාගේ කරන්නට බලාපොරොත්තු වන බව අපි දන්නවා. එම නිසා, මා පළමුවෙන්ම කියන්නට කැමතියි, මේ වාගේ පත්‍ර මුකවාඩමක් දමා මේ කටයුත්ත කරන්නට ගියොත්, දැනට වඩා ප්‍රශ්නය උග්‍ර වෙන්නට, බලවත් වෙන්නට ඉඩ ඇති බව. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අවසාන වශයෙන් මා කියන්නේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය මේ අවස්ථාවේදී ඡන්දය දීමෙන් වැළකීමට තීරණය කර ඇති බවයි.

**වෛද්‍යාචාර්ය පී. එම්. බී. සිරිල් මහතා**
**(வைத்திய கலாநிதி பீ. எம். பி. சிறில்)**
(Dr. P. M. B. Cyril)

*නැඟී සිටියේය–*
*எழுந்தார்.*
*rose.*

**නියෝජ්‍ය කථානායකතුමා**
**(பிரதிச் சபாநாயகர் அவர்கள்)**
(Mr. Deputy Speaker)

Is it a matter of personal explanation ?

**වෛද්‍යාචාර්ය පී. එම්. බී. සිරිල් මහතා**
**(வைத்திய கலாநிதி பீ. எம். பி. சிறில்)**
(Dr. P. M. B. Cyril)

Yes, Sir.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පෞද්ගලික පැහැදිලි කිරීමක් කරන්නට මා බලාපොරොත්තු වෙනවා. මම මේ ගරු සභාවේ නොසිටි අවස්ථාවේදී කොත්මලේ ගරු මන්ත්‍රීතුමා (ආනන්ද දසනායක මහතා) සඳහන් කර තිබෙනවා, එච්. ඩබ්ලිව්. ජයවර්ධන මහතා තිම්පු සාකච්ඡාවේදී කරන දේවල් ගණන් ගන්නේ නැත කියා හම්බන්තොට දිසා ඇමතිවරයා කිව්වාය කියා. එවැනි දෙයක් හෝ ඒ හා සමාන කිට්ටුවෙන් යන වචනයක්වත් මා ප්‍රකාශ කළේ නැති බව මම ප්‍රකාශ කරන්නට කැමතියි. කොත්මලේ ගරු මන්ත්‍රීතුමා ඒ කළ ප්‍රකාශය සම්පූර්ණයෙන්ම අසත්‍යයක් බව මා ප්‍රකාශ කරන්නට ඕනෑ. එවැනි සාකච්ඡාවක් ගැන හෝ ඒ විධියේ කථාවක් හෝ මා ප්‍රකාශ නොකළ බව මෙහිදී නැවත වරක් කියන්නට ඕනෑ.

**ආර්. ප්‍රේමදස මහතා (අග්‍රාමාත්‍යතුමා, පළාත් පාලන නිවාස හා ඉදිකිරීම් ඇමතිතුමා, මහාමාර්ග ඇමතිතුමා, හදිසි අවස්ථා මහජන පරිපාලන ඇමතිතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**

**(திரு. ஆர். பிரேமதாச — பிரதம அமைச்சரும் உள்ளூராட்சி, வீடமைப்பு, நிர்மாண அமைச்சரும் நெடுஞ்சாலைகள் அமைச்சரும் அவசரகால சிவில் நிர்வாக அமைச்சரும் பாராளுமன்றச் சபை முதல் வரும்)**

(Mr. R. Premadasa – Prime Minister, Minister of Local Government, Housing and Construction, Minister of Highways, Minister of Emergency Civil Administration and Leader of the House of Parliament)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හදිසි තත්ත්වය තවදුරටත් පවත්වාගෙන යාමට මේ රජය බලාපොරොත්තු වෙනවා. විපක්ෂය වුණත්, දේශපාලන චෝදනාවක් වශයෙන් රජයට විරුද්ධත්වයක් ප්‍රකාශ කිරීම පිණිස මෙයට ඡන්දය දීමෙන් වැළකී සිටියත් මගේ හිතේ ඡන්දය විරුද්ධව නම් දෙන එකක් නැහැ. මධ්‍යස්ථව සිටීමෙන්, වැළකී සිටීමෙන් පෙනී යන්නේ, ඒ අයට විරුද්ධ වෙන්නට බැරි කමක් තිබෙන බවයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පක්ෂව ඡන්දය දෙනවාට වඩා පක්ෂපාතීත්වයක් මධ්‍යස්ථව සිටීමෙන් සිදු වන බව තමුන්නාන්සේ දන්නවා. එහෙම නොවේ නම් එක වරටම විරුද්ධ. වෙනවා නේ ? මධ්‍යස්ථව සිටීමෙන් පෙනී යන්නේ මේ හදිසි තත්ත්වය ඉවත් කරන්නය කියා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට නම් එක වරටම කියන්න බැහැ කියන එකයි. මගේ හිතේ කලවානේ ගරු මන්ත්‍රීතුමා (සරත් මුත්තෙට්ටුවෙගම මහතා) හිටියා නම් විරුද්ධ වෙයි. අනික් ගරු මන්ත්‍රීතුමන්ලා දැන් මෙහි නැත්තේ විරුද්ධ නොවන නිසයි. විරුද්ධ වෙනවා නම් නතරවී ඡන්දය දෙනවා නේ ?

විපක්ෂ නායකතුමා මට දැනුම් දී තිබෙනවා එතුමාට 4. 15 ට රැස්වීමකට යන්නට තිබෙනවාය කියා. ඒ නිසයි, එතුමා මේ අවස්ථාවේ මෙහි නැත්තේ. අද එතුමා මේ විවාදයේදී කථා නොකළේ රටින් පිටව ගොස් සිට ආපසු රටට පැමිණියේ ඊයේ නිසා වෙන්න ඇති. ඒ නිසා එතුමාට අවකාශයක් තිබුණේ නැහැ, අද මෙහිදී යමක් ප්‍රකාශ කරන්නට.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ඇති වී තිබෙන තත්ත්වය ගැන යථාර්ථය ප්‍රායෝගිකව බලන්නය කියා මේ රටේ සියලුම දේශපාලන පක්ෂවලටත්, අපේ ජනතාවටත්, කියන්න මම කැමතියි. මේ ත්‍රස්තවාදී වැඩ පිළිවෙළ උග්‍ර වී තිබෙන ආකාරය ගැන කල්පනා කර බලන විට සියලුම සාධාරණ ජනතාව පිළිගනියි, මෙය එක පක්ෂයකට හෝ දෙකකට පමණක් මුහුණ පාන්නට සිදුවන තත්ත්වයක් නොවන බව. මේ ප්‍රහාරය එල්ල වී තිබෙන්නේ පොදුවේ ශ්‍රී ලංකාවේ ස්වාධීනත්වයට හා ශ්‍රී ලංකාවේ ඒකීයභාවයටයි. මේ ප්‍රහාරය එල්ල වී තිබෙන්නේ එක දේශපාලන පක්ෂයකට, එක ජාතියකට, එක පන්තියකට හෝ එක ප්‍රදේශයකට යයි අපට කියන්න බැහැ.

පසුගිය කාලයේ සිදු වූ සිදුවීම් එකින් එක තුලනාත්මකව විග්‍රහ කර බලන විට මෙය තනිකරම එක්සත් ජාතික පක්ෂයට එල්ල වූ ප්‍රහාරයක් නොවන බව පෙනෙනවා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට එල්ල වූ ප්‍රහාරයකුත් නොවෙයි. සමසමාජ කොමියුනිස්ට් මහජන එක්සත් පෙරමුණු ආදී පක්ෂවලට එල්ල වූ ප්‍රහාරයකුත් නොවෙයි. මෙය පොදු ප්‍රහාරයක්. මේ රටේ සාධාරණ ජනතාවට එල්ල වී ඇති ප්‍රහාරයක්. එසේ නැතිව සිංහල ජාතියට පමණක් එල්ල වී ඇති ප්‍රහාරයක් නොවෙයි. ත්‍රස්තවාදීන් විසින් මරා දමන්නේ සිංහල ජාතිකයන් පමණක් නොවයි. ද්‍රවිඩ අයත් මරනවා ; සිංහල අයත් මරණවා ; මුස්ලිම් අයත් මරණවා. ඇතැම් විට මේ රටේ කිසිම උරුමයක් නැති විදේශිකයනුත් මරණවා. කල්පනා කර බලන්න අර ජපන් ජාතික ස්වාමීන් වහන්සේ ගැන. ඒ ස්වාමීන් වහන්සේ කිය කියා ගියේ මොකක්ද ? කිසි කෙනෙකු දෝෂයක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කිව්වේ නැහැ. සාමය ගැනයි කථා කළේ. කරුණාකර සාමයෙන් මේ ප්‍රශ්න විසඳා ගන්න කියන එකයි කිව්වෙ. එතුමාත් අමු අමුවේ මරා දැම්මා. කතෝලික ක්‍රිස්තියානි හා බෞද්ධ පැවිදි පක්ෂය මරා දැම්මා. මුස්ලිම් ජනතාව මරා දමා තිබෙනවා ; ද්‍රවිඩ ජනතාව මරා දමා තිබෙනවා ; සිංහල ජනතාව මරා දමා තිබෙනවා. එක ආගමක පමණක් නොවෙයි, සියලුම ආගමික සිද්ධස්ථානවලට හා පූජ්‍යස්ථානවලට මෙයින් පහර එල්ල වී තිබෙනවා. කුඩා දරුවන්ට පවා අද මේ ප්‍රහාරය එල්ල වී තිබෙනවා. ඒ නිසයි මා කියන්නේ සාධාරණ ජනතාව මේ ගැන සාධාරණ ලෙස හිතන්න ඕනැය කියා. මෙය එක දේශපාලන පක්ෂයකට එල්ල වූ ප්‍රහාරයක් නොවෙයි. මෙය එක ජාතියකට එල්ල වූ ප්‍රහාරයක් නොවයි. මෙය එක ප්‍රදේශයකට එල්ල වූ ප්‍රහාරයකුත් නොවෙයි. එහෙම නම් මොකක්ද මේ ප්‍රහාරය. ? මෙය දැන් පැහැදිලියි. මෙය මේ රටේ ස්වාධීනත්වයට, මේ රටේ ඒකීය භාවයට එල්ල වූ ප්‍රහාරයක්. ඒකයි, අත්තනගල්ල ගරු මන්ත්‍රීතුමා (ලක්ෂ්මන් ජයකොඩි මහතා) මේ ගැන ටිකක් කල්පනා කළ යුත්තේ. මෙය සිංහල ජාතියට පමණක් එල්ල වූ ප්‍රහාරයක් නොවයි.

මේ රටේ වැඩි ජනතාව සිංහල ජනතාවයි. සියයට හැත්තෑ පහක් පමණ ජනතාව සිංහල ජනතාවයි. එය බොරු කරන්න බැහැ, කාටවත්. එය නැතැයි කියා කියන්න බැහැ, කාටවත්. එහෙම නම් මේ රටේ ස්වාධීනත්වය පිළිබඳ විශේෂ වගකීම, මේ රටේ ඒකීයභාවය ආරක්ෂා කර ගැනීමේ විශේෂ වගකීම ඒ ප්‍රමාණයෙන්ම සිංහල ජනතාවට තිබෙනවා. එය අපි පිළිගන්න ඕනෑ. මේ රටේ ස්වාධීනත්වයත්, ඒකීයභාවයත් ආරක්ෂා කර ගැනීමේ වගකීම වැඩියෙන් සිංහල ජනතාවට තිබෙනවා නම්, ඒ ජනතාවට තමයි ඒ වාගේම වගකීමක් තිබෙන්නේ මේ රටේ අනික් ජන කොටසුත් ආරක්ෂා කර ගන්න. අන්න එතන තමයි තමුන්නාන්සේලාට — ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට — දැන් වැරදිලා තිබෙන්නේ.

බණ්ඩාරනායක අගමැතිතුමා සිංහල මහා සභාව පටන් ගත්තේ අපි බ්‍රිතාන්‍ය යටත් වැසියන් වෙලා ඉන්න වේලාවේ. ඒ වේලාවේදී මොකක්ද බණ්ඩාරනායක මහතා කිව්වේ ? " මුස්ලිම් උදවියට වෙනම මුස්ලිම් සංගමයක් තිබෙනවා. ද්‍රවිඩ උදවියට වෙනම ද්‍රවිඩ සංගමයක් තිබෙනවා. බර්ගර් උදවියට වෙනම බර්ගර් සංගමයක් තිබෙනවා. ඒ නිසා අපටත් තිබෙන්න ඕනෑ සිංහල මහා සභාවක් " කියල කිව්වා. තමුන්නාන්සේලාට මතක ඇති. මා ළඟ ඒ ලියකියවිලි තිබෙනවා. එතුමා ලංකා ජාතික සංගමය තුළ හිටියදීම සිංහල මහා සභාව පවත්වාගෙන ගියා. මොකක්ද එතුමා කිව්වේ ? " අපට ඒ වාගේ සංවිධානයක් නොතිබුණොත් බ්‍රිතාන්‍යයන්ගෙන් නිදහස ලබා ගන්නා වේලාවට සිංහල උරුමය ගැන කථා කරන්න අපට සංවිධානයක් නැහැ. ඒ නිසා සිංහල මහා සභාව අවශ්‍යයි. " කියා එතුමා කිව්වා. තමුන්නාන්සේ පිළිගන්නවා ඇති, සිංහල මහා සභාවේ උප සභාපතිවරයෙක් තමයි ශ්‍රීමත් ජෝන් කොතලාවල මහත්මයාත්. එක්සත් ජාතික පක්ෂයේ නායකයින් වන ඩඩ්ලි සේනානායක මහතාත්, ආර්. ජී. සේනානායක මහතාත් එහි සිටියා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා ළඟ තවම තිබෙනවා සිංහල මහා සභාවේ පත්‍රිකා. මගේ හිතේ මම බොහොම තරුණ වියේදී සිංහල මහා සභාවේ සම්මේලනවලට සහභාගී වෙලා තිබෙනවා. මට අද වාගේ මතකයි පත්තලගෙදර පැවැත්වූ සම්මේලනය. ඒ යුද්ධ කාලයේදී සර් ජොෆ්‍රි ලේටන්තුමාට තමයි ආරාධනා කළේ ඒ ප්‍රදර්ශනය විවෘත කරන්න. මෙය දේශපාලන පාක්ෂික වැඩක්ය කියා එතුමාට යන්න එපා කියද්දීත් සර් ජ්ෆ්‍රි ලේටන්තුමා ආවා. එවිට බණ්ඩාරනායක මහතා එතුමාට ප්‍රශංසා කලා.

මා මේ පෙන්නුම් කරන්නේ අපි ඉතිහාසය ටිකක් තේරුම් ගන්න ඕනෑ නිසයි. නමුත් එක්සත් ජාතික පක්ෂය පිහිටූ වූ වේලාවේදී මේ හැම සංගමයක්ම ඇතුළු වුණා එක්සත් ජාතික පක්ෂයට. මොකද, ජනතාවක් හැටියට අපි නිදහස ලබා ගන්න ඕනැය කියන වුවමනාව ඇති වූ නිසා. 1950 දී බණ්ඩාරනායක මහතා එක්සත් ජාතික පක්ෂයෙන් ඉවත්වන විට ශ්‍රී ලංකාව නිදහස් රාජ්‍යයක්. එතුමා නැවතත් සිංහල මහා සභාවට පණ දුන්නේ නැහැ. මොකක්ද එතුමා කළේ ? එතුමා හැම ජාතියකටම ඇතුළු වෙන්න පුළුවන් විධියට ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සංවිධානය කර ගත්තා. එහෙම කරගෙන, සිංහල ද්‍රවිඩ මුස්ලිම් බර්ගර් උදවියවුත් ඇතුළු කරගෙන ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සංවිධානය කර ගත්තා. සිංහල මහා සභාව [බාධා කිරීමක්] නැහැ මම කියන්නම්, ඔහේ කැම බීම නැතිව මැරෙන්න අරින ලෙඩෙක් බවට පත් කලා. අස්වාභාවික මරණයක් වෙන්න හැරියා. කොයි එක වුණත් ඒ ගැන ප්‍රශ්නයක් නැහැ නෙ ? ප්‍රශ්නය මේකයි. බණ්ඩාරනායක මහතා තේරුම් ගත්තා, සිංහල ජනතාව තමයි මේ රටේ වැඩි කියා ; ඒ එක්කම මේ රටේ සෙසු ජනතාව ආරක්ෂා කර ගැනීමේ වගකීමත් සිංහල ජනතාවටයි තිබෙන්නේ කියා ; ඒ ඔක්කෝටමත් වඩා මේ රටේ ඒකීයභාවය ආරක්ෂා කර ගැනීමේ වගකීම තිබෙන්නේ සිංහල ජනතාවටයි කියා.

මම කැමතියි මේ පූර්විකාව කලින් කියන්න. මන්ද ? නියෝජ්‍ය කථානායකතුමනි, මෙය අපි ඉතාමත්ම ප්‍රවේසම් විය යුතු අවස්ථාවක්. ත්‍රස්තවාදීන්ට ඕනෑ කර තිබෙන්නේ මොකක්ද කියා අපට පේනවා. උතුරේ සහ නැගෙනහිර සියයට සියයක්ම සිටින්නෙ ද්‍රවිඩ පිරිසයි. විශේෂයෙන්ම ද්‍රවිඩ තරුණ පිරිසයි. නමුත් ද්‍රවිඩ ජනගහණයේ ජන සංඛ්‍යා ගැන බලන විට එය ඉතාමත්ම සුළු පිරිසක්. මම හිතන්නේ නැහැ මොනම කෙනෙක්වත් කියයි කියලා මුළු මහත් ද්‍රවිඩ භාෂාව කථා කරන ජනතාවම ඔය ත්‍රස්තවාදීන් ගෙන යන ව්‍යායාමයට එකඟයි කියා. මේ රට දෙකඩ කරන්න නැත්නම් වෙනම රාජ්‍යයක් පිහිටුවන්න ඔය අවි මුගුරු මගින් හිංසාවෙන් තමන්ගේ පරමාර්ථ ඉටු කරගන්නවාට මේ රටේ ද්‍රවිඩ ජනතාව — වැඩි ද්‍රවිඩ ජනතාව — පක්ෂ නැහැ.

ඔවුන්ගේ ජනගහණය ගැන බැලුවම නියෝජ්‍ය කථානායකතුමනි, එය ඉතාම සුළු පිරිසක්. ඒ සුළු පිරිස අවි ආයුධ අතට අරගෙන තිබෙනවා. ඔවුන්ට නොයෙක් ආධාර උපකාර ලැබෙනවා. දැන් ඒ සියල්ලම එළි වී තිබෙනවා. ඔවුන්ට මේ තරම් දුරට ශක්තිය ලබාගන්න පුළුවන් වුණේ ලංකාව තුළින් නොවෙයි ඉන්දියාවෙන් ලැබෙන රැකවරණය නිසයි. ඒකත් දැන් පිළිගෙන තිබෙනවා. ඔවුන්ට දැන් මොකක්ද ඕනෑ කරන්නෙ ? ඔවුන්ට දැන් ඕනෑ කරනවා ද්‍රවිඩ ජනතාව තුළ ඔවුන් කෙරෙහි පක්ෂපාතිත්වයක් ඇති කරගන්න. ද්‍රවිඩ ජාතිවාදය අවුස්සන්න ඔවුන්ට දැන් ඕනෑ කර තිබෙනවා. එතකොට තමයි සාධාරණ ද්‍රවිඩ ජනතාව වුණත් ඔවුන්ගේ පැත්ත ගන්නේ. ඒ එක්කම ඔවුන්ට ඕනෑ කර තිබෙනවා සිංහල ජනතාව තුළ ජාතිවාදය මොළවන්න. ඔවුන්ගේ පරමාර්ථය සාර්ථක වෙන්නේ එතකොටයි. ඔවුන්ට ඕනෑ කර තිබෙනවා ලංකාවේ සෙසු ප්‍රදේශවල සිටින ද්‍රවිඩ ජනතාව උතුරටත් නැගෙනිරටත් අද්දගන්න. ඔවුන්ට ඕනෑ කර තිබෙනවා දැන් ඔවුන් කරන්නා වාගේම උතුරු නැගෙනහිර ප්‍රදේශවල සිටින සිංහල ජනතාව පිටමං කරන්න.

Let us understand this reality. They are very keen that we Sinhalese also become recialists. It is only then that they can achieve their purpose. They want to ensure that all the non-Tamils leave the North and the East and all those Tamils move into the North and to the East.

**මන්ත්‍රීවරයෙක්**
**(அங்கத்தவர் ஒருவர்)**
(A Member)

Division.

**ආර්. ප්‍රේමදස මහතා**
**(திரு. ஆர். பிரேமதாச)**
(Mr. R. Premadasa)

That is right. So my dear Friend, the hon. Member for Attanagalla, please do not help them to ensure that. That is important.

මේක වැදගත්. මේ රටේ ජනගහණය අනුව කල්පනා කලොත් මේ රටේ ජාති භේදවාදය වෙන කාටවත් වඩා මොළවන්න අපට පුළුවන්. මොකද ? අපේ සිංහල ජනතාව සියයට 75 යි. නමුත් ඇතැම් සිංහල නායකයන්ට වඩා අද ජනතාව බුද්ධිමත් බව පේනවා. මන්ද ? මේ රටේ ඒකීයභාවය ආරක්ෂා කරන්නට නම් මේ රටේ වැඩි ජනතාව වන සිංහල ජනතාව බුද්ධිමත්ව ක්‍රියා කළ යුතු අවස්ථාවකයි, අද අපි ඉන්නෙ. ඔවුන් අද ගහලා පන්නනවා අපේ ජනතාව. සිංහල ජනතාව පමණක් නොවෙයි මුස්ලිම් ජනතාවත් ගහලා පන්නනවා. මරණවා. වෙඩි තියනවා. අද තමුන්නාන්සේලාම කිව්වා තිස් දහ, හතළිස් දහ, පණස් දහ, හැට දහ ඒ ප්‍රදේශවලින් මෙහාට එනවාය කියා. එහෙම නම් තේරුම් ගන්න ඕනෑ මොකක්ද ඔවුන්ගේ පරමාර්ථය කියල. ඔවුන්ගේ පරමාර්ථය මේ රටේ උතුරත් නැගෙනහිරත් ඒ කොටස් සම්පූර්ණයෙන්ම වෙනමම පාලනයකට යටත් කර ගන්නයි. එතකොට අපිත් මේ පැත්තෙ ඉඳගෙන ජාති භේදවාදය මෙලෙව්වොත්, ඇවිලෙව්වොත්, ගිනි තිබ්බොත් මොකද වෙන්නෙ ? එතකොට මෙහි ඉන්න ද්‍රවිඩ ජනතාවට බැට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආර්. ප්‍රේමදාස මහතා]

දෙන්න පටන් ගන්නවා. ඊළඟට ඔක්කොම පැනලා එහාට යනවා. එහාට පමණක් නොවෙයි, ඉන් එහාට ඉන්දියාවටත් පැනගන්නවා. අපේ එහේ ඉතුරුවෙලා ඉන්න ජනතාවත් මෙහාට පැන ගන්නවා. ඉබේම ඊළම් ලැබෙනවා. අපි මේකට උදව් දෙනවාද ? ඒකයි ප්‍රශ්නය. අපි මේකට උදව් දෙනවාද ? ශ්‍රී ලංකා නිදහස් පක්ෂය රට පුරා යමින් අපට චෝදනාවක් නැගුවා, " භූටානයේ තිම්පුවල හොර සාකච්ඡාවක් ඇති කර තිබෙනවාය, ඒ සාකච්ඡාව කරගෙන යන්නේ මේ රට පාවා දෙන්නයි, අපි මොකුත් දන්නෙ නැහැ, මොනවද දෙන්න යන්නෙ " කියල චෝදනාවක් ගෙනිච්චා ; ගෙනිච්චා ; ගෙනිච්චා. විශේෂයෙන්ම මුල්කිරිගල සඳහා මේ ව්‍යායාමය ගෙනිච්චා. නමුත් දැන් ආරංචිය ලැබිල තිබෙනවා ඒ සාකච්ඡා ඇන හිටියයි කියා. ඒ සාකච්ඡාවට ආපු ඒ ත්‍රස්තවාදී කොටස්, ද්‍රවිඩ කොටස් ඒ සාකච්ඡාවෙන් ඉවත් වුණාය, ඉන්දියාව පුළුවන් තරම් උත්සාහ කරනවාය නැවතත් මේ සාකච්ඡා ඇති කරන්න කියා. අපි ඔය අවස්ථාවලදී කිව්වා, මේ පාර්ලිමේන්තුවට ඇවිත් කිව්වා, කිසි දෙයක් ජනතාවගෙන් සඟවන්නේ නැහැ කියල. කිසි දෙයක් මේ පාර්ලිමේන්තුවෙන් සඟවන්නෙ නැහැ. ජනතාවට නොදන්වා පාර්ලිමේන්තුවට නොදන්වා කවදාවත් මොනම දෙයක්වත් මොනම කොටසක්වත් දෙන්න පුළුවන් කමක් ඇත්තෙත් නැහැ. නමුත් මේක මූලික සාකච්ඡාවක්. තමුන්නාන්සේලා දන්නවා, අපේ රජය, අපේ ජනාධිපතිතුමා ඔය එක්කෙනෙක් එක්කවත් සාකච්ඡා කරන්න බැරියයි කිව්වා. නමුත් බලන්න කල්පනා කරල තමුන්නාන්සේලාගේ නායිකාව නේ හැම විටම කිව්වෙ කොහොමද මේ ප්‍රශ්නය විසඳන්නේ අමිර්තලිංගම්ලා එක්ක කථා කරන්නෙ නැතිව කියල. ඉස්සෙල්ල එහෙම කිව්වා. අමිර්තලිංගම්ලාගේ දේශපාලන අයිතිවාසිකම් නැතිවුණ එක ගැන චෝදනා කලා. ඊට පස්සෙ කිව්වා, " අමිර්තලිංගම්ලාගේ තත්ත්වය ගැනත් ටිකක් කල්පනා කරන්න ඕනෑ නේද, අපි එකඟ නූනත් ඒ අයට ඡන්දයෙන් බලයක් හම්බවෙලා තිබෙනවා නේද වෙනම රාජ්‍යයක් ඇති කරගන්න. ඒක අපි තේරුම් ගන්න ඕනෑ නේද " ? කියල.

Here is your own magazine – I do not think it is your magazine ; it is the "Lanka Guardian". She had given an interview. It appears in question and answer form. She says in answer :

"The TULF must finally renounce the separatism but that need not be before negotiations."

See how well she speaks for the TULF also. That is very good but she must maintain some consistency.

Sir, just see this :

"The TULF must finally renounce the separatism but that need not be before negotiations. Amirtalingam explained his problem and I must say that I found the position was underatandable. Rightly or wrongly though we do not endorse their view the people of the North voted for a separate State. Of course it was good election slogan for the TULF but that is the TULF's mandate, as he told me."

Amirthalingam had gone and told her.

"If he were to turn back on that mandate he must get the approval of at least his party at a conference."

She is finding excuses for Mr. Amirthalingam. You are blaming us for discussiog, but she is finding excuses.

She has further stated :

"But what are they to tell the conference ? If they get some concrete offers, some practical alternative proposals, then they can tell their people."

See how very reasonable she is ! She is very reasonable to the TULF, I must tell you, Sir, but not to the UNP.

මන්ත්‍රීවරයෙක්
(அங்கத்தவர் ஒருவர்)
(A Member)

Not to the terrorists.

ආර්. ප්‍රේමදාස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)

Wait, I will come to the terrorists also. – [*Interruption*]. – Do not get into a trap. I will come out with it about the terrorists also. You must not get involved in this business. You told this House in the morning that you are a stopgap here. So you just be like that and do not get involved.

"If we get some concrete offers, some practical alternative proposals then they can tell their people, lets consider this, lets discuss this. This is what is offered, We are going to have an all-party conference."

She is finding some excuses. But when some prelimanary discussions take place in Thimpu, she says, "What is this ? What are they doing ?" When we refused to talk to them and negotiate with them, she was finding excuses for them. So when these things started, you say :

" අන්න රට විකුණන්න යනවා. සිංහල ජාතිය ඉවර වන්නට යනවා. දැන් අපි ඔක්කොම ජාතිය බේරා ගන්නට එක්කාසු වෙමු " කියනවා. මේක අපි කල්පනාවට ගන්නට ඕනෑ. තමුන්නාන්සේ දන්නවා ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රජීව් ගාන්ධි මහතා අගමැති වශයෙන් පත්වන තුරු අපිට කොයිම වෙලාවකවත් ඉන්දියාවෙන් සහයක් ලැබුණේ නැහැ. ඒක පිළිගන්නට ඕනෑ. ඇත්ත වශයෙන්ම එතුමා පත් වුණාට පස්සේ එතුමා ඇති තතු නියම විධියට අවබෝධ කර ගත්තා. තමුන්නාන්සේලා දන්නවා, බැරි වෙලාවත් වෙන කෙනෙක් කථා කලා නම් ඔය ත්‍රස්තවාදීන් තිම්පු නුවරට යන්නේ නැහැ. යන ගමන් කිය කිය ගියේ, " අපි කැමත්තෙන් යනවා නොවෙයි, රජීව් ගාන්ධි මහතා කියන නිසයි යන්නේ " කියන එකයි. ඉන්දියාවේ රැකවරණයත් තිබ්බව නිසා, තිබෙන නිසා, ඒ වචනෙට සලකලායි ගියේ.

දැන් අපිට චෝදනා කරගෙන යනවා .විශේෂයෙන් මුල්කිරිගලට ගිහිල්ලා කියනවා, " ඔන්න හොර සාකච්ඡාවක් ඇති කරල රට විකුණන්නට යනවාය, රට බෙදන්නට, රට පාවා දෙන්නට යනවාය, මෙහෙම පක්ෂයකට මේ මුල්කිරිගල පනතාව ඡන්දය දෙනවාද " කියා. දැන් මොකද සාකච්ඡා අතරමග ඇණ හිටියේ ? මොකක් නිසාද ? ඉන්දියාවේ මහ කොමසාරිස්තුමා කියන විධියට කාරණා දෙකක් හේතුවෙලා තිබෙනවා. එකක් මොකක්ද ? සාකච්ඡා යන අතරතුරදී නොයෙක් මිනීමැරුම් සිද්ධ වුණාය කියන එක එකක්. දෙවන එක මොකක්ද ? මේ නියෝජිත පිරිස් ඉදිරිපත් කරන යෝජනා ප්‍රමාණවත් නැත කියන එකයි. ඒකට මොකද සිංහල පළාත්වලට ගිහිල්ලා කියනවා. – හෙට්ටිපොල ගිහිල්ලා කිව්වා, මුල්කිරිගල ගිහිල්ලා කියනවා, " ඔන්න ජාතිය ඉවරයි, අපේ රට පාවා දෙනවා "ය කියලා. " ත්‍රස්තවාදීන් තමුන්නාන්සේලාට ගහලා එළවනවා පමණක් නොවෙයි, ජේ. ආර්. ජයවර්ධන මහතා ඔන්න රට ඔප්පු තිරප්පු පිට පාවා දෙන්නට යනවාය " කියලා කියනවා. එහෙනම් මොකද සාකච්ඡාව ඇද වැටෙන්නේ ? ත්‍රස්තවාදීන් ඉල්ලන දේවල් අපේ ජනාධිපතිතුමා දෙනවා නම් මේ ආණ්ඩුව දෙනවා නම් මොකද සාකච්ඡාව ඇද වැටෙන්නේ ? සාකච්ඡාව සාර්ථක වන්නට එපායැ. එක අතකින් මගේ හිතේ " සත්‍යය ජය ගන්නවාය " කියන නිසා වන්නට ඇති, මේ සාකච්ඡාව ඊයේ ඇදගෙන වැටුණේ. මා හිතන විධියට මේ ගැන අද ඉතාමත්ම කණගාටුවන කණ්ඩායමක් තමයි ශ්‍රී ලංකා නිදහස් පක්ෂය. They have lost their fodder. දැන් මුල්කිරිගලට ගිහිල්ලා කියන්න බැහැ, " ඔන්න ඔක්කොම තිම්පුවේදී දෙන්න යනවාය " කියලා. දෙනවා නම් ඇද වැටෙන්නට ඕනෑ නැහැ නෙ. ඉන්දියානු මහ කොමසාරිස්තුමාම කියනවා මේ විධියට මේ සාකච්ඡාව මේ තත්ත්වයට වැටෙන්නට එක හේතුවක් නම්, ඒ ද්‍රවිඩ කණ්ඩායම්, ත්‍රස්තවාදී කණ්ඩායම් " The offers are not very attrative " යනුවෙන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ප්‍රකාශ කිරීමයි. ඒ වචනවලින්ම කිව්වාදැයි මම දන්නේ නැහැ. මම හිතෙන්නෙ එහෙමයි. අපි ඉදිරිපත් කරන යෝජනාවල් " බලාපොරොත්තු වන ප්‍රමාණයට නැත " කියන එකයි ඒ. අන්න ඒකයි. මම හිතන විධියට අද විපක්ෂයේ පෙළපාලිය ඒතරම් ගාම්භීර නැත්තේ ඊයේ ඉඳලා ටිකක් බලාපොරොත්තු කඩවෙලා තිබෙන නිසා වන්නට ඇති " මේක මුල්කිරිගල අතුරු මැතිවරණය ඉවර වනතුරුවත් තිබුණා නම් හොඳය " කියලා හිතනවා ඇති. ඇයි, එතකොට එහෙ ජනතාවට ගිහිල්ලා කියන්න පුළුවන්. " ඔන්න හොර සාකච්ඡාවල්. කරුණාකරලා, අපිට ඡන්දය දෙන්න " කියලා. " ජේ. ආර්. ජයවර්ධන මහතාට කියන්න, අපි තිම්පු සාකච්ඡාවට එකඟ නැහැ, ඔය දුන් දෙන්න යන ඒවාට අපි එකඟ නැහැ, එම නිසා අපට ඡන්දය දෙන්නය " කියලා කියන්නට බැහැ දැන්. දැන් මේක හින්ද බැළුම් බෝලෙ හුළං ගියා වාගේ, නියෝජ්‍ය කථානායකතුමනි.

ඔය එක චෝදනාවක් අපට තගන. දැන් ඒ චෝදනාව බිඳ වැටුණා. ඇයි ? ත්‍රස්තවාදීන් සාකච්ඡාවට එකඟ වෙන්නෙ නැත්තෙ ? අපි ඉදිරිපත් කරන යෝජනාවල් ඒ අයගේ බලාපොරොත්තුවලට ගැළපෙන්නේ නැහැ. ඒ කියන්නෙ රට දෙකඩ කරන්න ඉඩ දෙන්නේ නැහැ. රට පාවා දෙන්නේ නැහැ. ඒ ගොල්ලො ඉල්ලන ඒවා දෙන්නෙ නැහැ, යූ. එන්. පී. ආණ්ඩුව. එම නිසායි මේක බිඳ වැටෙන්නෙ.

ඊළඟට අනෙක් කාරණය. හැම වේදිකාවටම ගිහින් මේ අය කියනව මේක විසඳන්න පුළුවන් අපේ මැතිණියට විතරයි කියල. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට විතරයි කියල. එතකොට බලන්න මේ තර්කය. ත්‍රස්තවාදීන් කියනව " අපට උතුරයි නැගෙනහිරයි දෙනකං, නිකං නෙමෙයි උතුරයි නැගෙනහිරයි දෙක එකට එකතු කරල දෙනකං අපි වෙන කිසිම දෙයක් බාරගන්නෙ නැහැයි " කියල. " අපි අවි බිම තියන්නෙ නැහැ " කියනව. අද උදෙන් බාලසිංහම්, ඒ අයගේ න්‍යායාචාර්යවරයා, ප්‍රකාශ කර තිබෙනව, " මෙච්චර දවස් හැංගිල ගැහුවෙ, දැන් ඉස්සරහට එළියට ඇවිත් ගහනව, අපට ඕනෑ අපේ වෙනම රාජ්‍යය " කියල. එතකොට සාකච්ඡාවලුත් අතරමග ඇනහිටින වෙලාව. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය කියනව, " නෑ, මේකට විසඳුමක් දෙන්න පුළුවන් අපට විතරයි " කියල. " ඡන්දයක් පවත්වා අපිව බලයට දාන්න, අපේ මැතිණිය ආ හැටියෙ මේක විසඳනව, ත්‍රස්තවාදය නවත්වනව " කියනව.

එහෙම නම් අපිට දැනගන්න ඕනෑ කරුණ මේකයි. උතුර හා නැගෙනහිර දීලද මේක විසඳන්නෙ ?

